# රණවිරුවා

2025 දෙසැම්බර් • 283 කලාපය




## රට රකින පරපුරක
## අනාගත උරුමය

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල.

# “The Army Commander’s Promise to the Nation” ග්‍රන්ථය එළිදැක්වේ






හිටපු යුද්ධ හමුදාධිපති ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා (විශ්‍රාමික) ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී විසින් රචිත “The Army Commander’s Promise to the Nation” නම් ග්‍රන්ථය එළිදැක්වීමේ උත්සවය ඉකුත් දෙසැම්බර් මස 09 වන දින සවස කොළඹ ආරක්ෂක සේවා විද්‍යාල ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්‍ෂක නියෝජ්‍ය අමාත්‍ය මේජර් ජෙනරාල් කේපී අරුණ ජයසේකර (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගී වූ අතර, ආරක්ෂක ලේකම් එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී (තෙවරක්), ආර්එස්පී (දෙවරක්), යූඑස්පී, එම්එම්එස්සී (උපායමාර්ගික අධ්‍යයනය - චීනය), එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ, එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයනය), එස්එන්ඩීයූ (චීනය), පීඑස්සී ගෞරවනීය ආරාධිතයකු ලෙස එක්වූ අතර, ත්‍රිවිධ හමුදාධිපතිවරු, හිටපු හමුදාධිපතිවරු, ත්‍රිවිධ හමුදාවේ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීහු රැසක් ද අනෙකුත් ආරාධිත අමුත්තන් අතර විය.









# ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවය









ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයීය පාඨමාලා අංක - 19 හි උපාධි ප්‍රදානෝත්සවය ඉකුත් දෙසැම්බර් මස 16 වන දින නෙළුම් පොකුණ රඟහලේදී පැවැත්විණ. එම විද්‍යාලයේ සේනාවිධායකගේ ඇරයුමෙන් එම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය මෙනවිය සහභාගී වූවාය. තවද, ආරක්‍ෂක නියෝජ්‍ය අමාත්‍ය මේජර් ජෙනරාල් කේපී අරුණ ජයසේකර (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, ආරක්ෂක ලේකම් එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී (තෙවරක්), ආර්එස්පී (දෙවරක්), යූඑස්පී, එම්එම්එස්සී (උපායමාර්ගික අධ්‍යයනය - චීනය), එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ, එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයනය), එස්එන්ඩීයූ (චීනය), පීඑස්සී සහ ත්‍රිවිධ හමුදාධිපතිවරු ඇතුළු සම්භාවනීය පිරිසක් ද එම අවස්ථාවට එක්වූහ.

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ පාඨමාලා අංක - 19 සඳහා විදේශීය නිලධාරින් 26 දෙනෙක්, යුද්ධ හමුදා නිලධාරින් 74 දෙනෙක්, නාවික හමුදා නිලධාරින් 25 දෙනෙක් සහ ගුවන් හමුදා නිලධාරින් 24 දෙනෙක් ඇතුළුව උපාධි අපේක්ෂක නිලධාරින් 149 දෙනෙක් සහභාගී වූහ. කීර්තිමත් විද්වතුන් සහ ආරාධිතයන් පිරිසකගේ සහභාගීත්වයෙන් පැවැති පාඨමාලාවේ අවසන් දින උත්සවයේ දී එම උපාධිධාරි නිලධාරින් වෙත "පීඑස්සී" උපාධිය පිරිනැමීම සිදුවිය.



# නත්තල

## අරුත්ගන්වමින් යුද්ධ හමුදාධිපති රණක්ෂිත විරුවන් සමගින්









සාමයේ සහ සහෝදරත්වයේ ජීවගුණය පෙරදැරි කරගනිමින් උදා වූ නත්තල නිමිත්තෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී ඉකුත් දෙසැම්බර් මස 23 වන දින කඹුරුපිටිය අභිමංසල 2, රාගම රණවිරු සෙවණ සහ අත්තිඩිය මිහිඳු සෙත් මැදුර යන ස්ථානයන්හි සංචාරයක නිරත විය. එහිදී, එම නේවාසික විරුවන් හා සුහද කතාබහක නිරත වූ හෙතෙම ඔවුනට ත්‍යාග පිරිනැමීමට ද කටයුතු කළේය.

එහිදී, නත්තල් පණිවුඩය සහ ආශිර්වාද ගැන්වීම කොළඹ සහායක රදගුරු අති උතුම් මැක්ස්වෙල් සිල්වා හිමිපාණන් විසින් සිදු කරන ලදී. මෙම අවස්ථාවන්ට රණවිරු සේවා හා පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ආර්ජීඑල්කේ වීරකෝන් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, අභිමන්සල 2 හි සේනාවිධායක බ්‍රිගේඩියර් ජීජීආර් මාධුගොඩ යූඑස්පී, අත්තිඩිය මිහිඳු සෙත් මැදුර සේනාවිධායක බ්‍රිගේඩියර් පීඩීඑන්අයි අල්මේදා ආර්එස්පී ද එක්වූහ.





# මාණ්ඩලික නිලධාරී හටකාර්ය සම්පාදන පාඨමාලාවේ සමාප්තිය

මාණ්ඩලික නිලධාරී හටකාර්ය සම්පාදන පාඨමාලා අංක - 11 හි උපාධි ප්‍රදානෝත්සවය ඉකුත් දෙසැම්බර් මස 11 වන දින ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. හටකාර්ය සම්පාදන විද්‍යාලයේ සේනාවිධායක බ්‍රිගේඩියර් ආර්ටී ලොකුතොටහේවා යූඑස්පී පීඑස්සී ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී වූ එම අවස්ථාවට යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී එන්පීඑස් පීඑස්සී හා යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් වයිජ්බීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ද එක්වූහ.





පරිපාලනය සහ හටකාර්ය සම්පාදනය පිළිබඳ ප්‍රමුඛතම වෘත්තීය පාඨමාලාව ලෙස පිළිගත් මෙම පූර්ණ කාලීන නේවාසික පාඨමාලාව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සෘජු මඟපෙන්වීම යටතේ පවත්වනු ලබන අතර, එය සාර්ථකව අවසන් කළ නිලධාරීන් වෙත "Lsc" ගෞරව නාමය ප්‍රදානය කරනු ලබයි. මීට අමතරව, හටකාර්ය සම්පාදන විද්‍යාලය සහ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය එක්ව හටකාර්ය සම්පාදනයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද එහිදී පිරිනමයි.

මාණ්ඩලික නිලධාරී හටකාර්ය සම්පාදන පාඨමාලා අංක - 11, ඉකුත් ජනවාරි මස 15 වන දින ආරම්භ කරනු ලැබූ අතර ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරීන් 31 දෙනෙක්, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරීන් 02ක්, ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරියෙක් සහ සැම්බියාවේ සහ බංග්ලාදේශයේ නිලධාරීන් 02ක් ඇතුළුව නිලධාරීන් 36 දෙනෙක් ඊට සහභාගී වූහ. පාඨමාලාවේ දක්ෂතම ශිෂ්‍ය නිලධාරියා සහ හොඳම හටකාර්ය සම්පාදන සැලසුම්කරුට හිමි සම්මානය ඉංජිනේරු සේවා බළකායේ මේජර් පීපීජ් පීරිස් දිනාගත්තේය.

---

# ශ්‍රී ලංකාවේ ජර්මානු ආරක්ෂක උපදේශක යුද්ධ හමුදාධිපති හමුවෙයි



ශ්‍රී ලංකාවේ ජර්මානු ආරක්ෂක උපදේශක Colonel Klaus Merkel සහ සහකාර ආරක්ෂක උපදේශක Lieutenant Colonel Marco Hellgrewe ඉකුත් දෙසැම්බර් මස 05 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති හමුවූහ.

# ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ 100

# අභිමානවත් පෙළපාලිය

















දියතලාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ 100 වැනි විසිර යාමේ පෙළපාලිය 2025 දෙසැම්බර් මස 21 වන දින අභිමානවත් අයුරින් එම විද්‍යාල පරිශ්‍රයේදී පැවැත්විණ. එම අවස්ථාවට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී ගේ ආරාධනයකට අනුව, සන්නද්ධ හමුදා සේනාධිනායක සහ ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී විය.

අධිකාරියට පත් නිලධාරින් හා නිලධාරිනියන් අතරට පාඨමාලා අංක - 93 සහ 94 බී, කෙටිකාලීන පාඨමාලා 23, කාන්තා පාඨමාලා අංක 20, 62 (ස්වේච්ඡා) සහ කාන්තා පාඨමාලා අංක 19 (ස්වේච්ඡා) යන පාඨමාලාවන්හි සහ උගන්ඩාව, රුවන්ඩාව සහ සැම්බියාව යන රටවලින් පැමිණි විදේශීය කෙඩෙට් නිලධාරීන් 08 දෙනෙකු ද ඇතුළත්ව කෙඩෙට් නිලධාරීහු 240 දෙනෙක් විසිර ගියහ. උත්සවයේ ප්‍රධාන ආරාධිතයා සමඟ නියෝජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමන්, ආරක්ෂක ලේකම්තුමන් සහ යුද්ධ හමුදාධිපති එක්ව නව නිලධාරින් වෙත සංකේතාත්මක ජනාධිපති අධිකාරියේ නිල අසිපත් ප්‍රදානය කරනු ලැබූහ.











# කෙඩෙට් නිලධාරීන්ගේ අවසන් පර්යේෂණ ඉදිරිපත් කිරීම




කෙඩෙට් නිලධාරි අංක - 93, අංක - 94බී, කෙටිකාලීන පාඨමාලා අංක - 23, කාන්තා පාඨමාලා අංක - 20, (ස්වේච්ඡා) අංක - 62 සහ කාන්තා (ස්වේච්ඡා) අංක -19 යන පාඨමාලා හදාරන ලද කෙඩෙට් නිලධාරීන්ගේ සිය අධ්‍යයන සහ යුද පුහුණු කාලසීමාවේ නිමාව සනිටුහන් කරමින්, ඔවුන්ගේ අවසන් පර්යේෂණ ඉදිරිපත් කිරීම ඉකුත් දෙසැම්බර් මස 20 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේදී සිදුකරනු ලැබීය. මෙවර ඉදිරිපත් කිරීම "ඩිජිටල් යුගයේ දෙමුහුන් යුද ක්‍රමවේද නවීන යුද උපායමාර්ග තුළ කෘත්‍රිම බුද්ධියේ කාර්යභාරය" යන තේමාව යටතේ පැවැත්විණ. මෙම ඉදිරිපත් කිරීම මඟින් කෙඩෙට් නිලධාරීන් විද්‍යාපීඨය තුළ ලැබූ පුහුණුව තුළින් ප්‍රගුණ කළ ශාස්ත්‍රීය විශිෂ්ටත්වය, විශ්ලේෂණාත්මක හැකියාව සහ වෘත්තීය නිපුණත්වය මැනවින් ප්‍රදර්ශනය කළේය. මෙම අවසන් ඉදිරිපත් කිරීම කෙඩෙට් නිලධාරීන්ට තමන් සතු පර්යේෂණ හැකියාවන් සහ බුද්ධිමය වර්ධනය එළිදැක්වීමට ලැබුණු සුවිශේෂී අවස්ථාවක් ද විය.











යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ සේනාවිධායක මේජර් ජෙනරාල් එම්ජේආර්එස් මැදගොඩ ආර්එස්පී යූඑස්පී එන්ඩීසී අයිජී ගේ පිළිගැනුම් මධ්‍යයේ මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය මේජර් ජෙනරාල් කේපී අරුණ ජයසේකර (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගී විය. කෙඩෙට් නිලධාරීන්ගේ තෝරාගත් පර්යේෂණ දායකත්වයන් ඇතුළත් කරමින් සම්පාදනය කරන ලද 7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨ පර්යේෂණ සඟරාව එළිදැක්වීම ද එහිදී සිදු කෙරිණි.



# “අභිමානවත් පවුර” විවෘත කෙරේ

දියතලාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ ඉදිකරන ලද “අභිමානවත් පවුර” ඉකුත් දෙසැම්බර් මස 20 වන දින යුද්ධ හමුදාධිපති විසින් නිල වශයෙන් විවෘත කරන ලදී.

මෙම පවුර තුළ ජෙනරාල් එස්එච්එස් කෝට්ටේගොඩ (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී සිට වත්මන් යුද්ධ හමුදාධිපති දක්වා හිටපු යුද්ධ හමුදාධිපතිවරු එම විද්‍යා පීඨයේ කෙඩෙට් නිලධාරීන් ලෙස ගතකළ ආරම්භක අවධියේ සිට යුද්ධ හමුදාධිපති තනතුර දක්වා පැමිණි ගමන පිළිබිඹු කෙරෙන දුර්ලභ ඡායාරූප ඇතුළත්ව වේ.






# පොලිස් හේවා බළකායට නව නිවාඩු නිකේතනයක්





දියතලාව, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බළකා පරිශ්‍රයේ නවතමයෙන් ඉදිකරන ලද සියලු නිල නිවාඩු නිකේතනයක් යුද සේවා ලේකම් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බළකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් බීජීඑස් ප්‍රනාන්දු යූඑස්පී එච්ඩීඑම්සී පීඑස්සී ගේ ඇරයුමෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී විසින් ඉකුත් දෙසැම්බර් මස 22 වන දින විවෘත කරන ලදී. යුද්ධ හමුදා සාමාජිකයන්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා වඩාත් සුවපහසු නවාතැන් පහසුකම් සැපයීමේ අරමුණින් මෙම නිවාඩු නිකේතනය ඉදි කෙරිණ.

# චර්යාධර්ම සංග්‍රහයේ විද්‍යුත් පිටපත එළිදැක්වේ



ශ්‍රී ලංකා යුද්ධ හමුදා චර්යාධර්ම සංග්‍රහයේ විද්‍යුත් පිටපත යුද්ධ හමුදා මූලස්ථාන බහුකාර්ය ශාලාවේදී ඉකුත් දෙසැම්බර් මස 31 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී ගේ ප්‍රධානත්වයෙන් එළිදැක්විණ. සියලුම නිලයන් අතර ආයතනික ළැදියාව, සදාචාරාත්මක විනය සහ වෘත්තීය වගවීම ශක්තිමත් කිරීම සඳහා යුද්ධ හමුදාවේ කැපවීමේ කොටසක් ලෙස යුද්ධ හමුදා අභ්‍යන්තර කටයුතු ඒකකය විසින් මෙම උත්සවය සංවිධානය කරන ලදී.

මෙම චර්යාධර්ම සංග්‍රහය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සියලුම සාමාජිකයින් සඳහා මාර්ගෝපදේශයක් ලෙස කටයුතු කරන අතර, විද්‍යුත් පිටපත මඟින් මාර්ගගත ක්‍රමය ඔස්සේ ආයතනය තුළ වඩාත් පුළුල් ප්‍රවේශයක් ලබා දීමටත්, අන්තර්ජාලය ඔස්සේ සම්බන්ධ වන නිලධාරීන් ඇතුළු සියලු දෙනාටම කාර්යක්ෂමව බෙදා හැරීමටත් හැකියාව ලැබේ.

විද්‍යුත් පිටපත නිල වශයෙන් එළිදැක්වීමෙන් පසුව, යුද්ධ හමුදාධිපතිතුමන් රැස්ව සිටි පිරිස අමතමින්, චර්යාධර්ම සංග්‍රහයේ දක්වා ඇති වටිනාකම් ආරක්ෂා කිරීමේදී පුද්ගලික වගකීම සහ නායකත්වයේ වැදගත්කම ඉස්මතු කරමින් මෙම චර්යාධර්ම අනුගමනය කිරීම යනු හුදෙක් නීතිරීතිවලට අවනත වීම පමණක් නොව එය මහජන විශ්වාසය, මෙහෙයුම් විශ්වාසනීයත්වය සහ යුද්ධ හමුදාවේ දිගුකාලීන ආයතනික ශක්තිය පවත්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය මූලික පදනමක් වන බවත් අවධාරණය කළේය. මෙම අවස්ථාවට යුද්ධ හමුදා අභ්‍යන්තර කටයුතු ඒකකයේ ප්‍රධාන සහ යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී එන්පීඑස් පීඑස්සී ඇතුළු නිලධාරීන්, සෙසුනිලයන් රැසක් සහභාගී වූහ.

---

# සරඹ උපදේශක පාඨමාලා ප්‍රථමයාට යුද්ධ හමුදාධිපතිගෙන් පැසසුම්



ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බළකායේ මාණ්ඩලික සැරයන් කුලසේකර කේඑම්සීඑස් යූඑස්පී විසින් සරඹ උපදේශක පාඨමාලා අංක 134 හි ප්‍රථම ස්ථානය හිමිකරගන්නා ලදී. ඉකුත් දෙසැම්බර් මස 24 වන දින යුද්ධ හමුදාධිපති එම මධ්‍යස්ථානයේ සිදුකළ නිල සංචාරයක් අතරතුර එම ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරි ඇගයීමට ලක්කරමින් ඔහු වෙත මුදල් පරිත්‍යාගයක් පිරිනැමීමට ද කටයුතු කළේය. මෙම අවස්ථාවට යුද සේවා ලේකම් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බළකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් බීජීඑස් ප්‍රනාන්දු යූඑස්පී එච්ඩීඑම්සී පීඑස්සී සහ යුද්ධ හමුදා විනයාරක්ෂකාධිපති මේජර් ජෙනරාල් ඒඑම්ආර් අබේසිංහ එන්ඩීසී ද සහභාගී වූහ.

# යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු සංග්‍රාමික වෙඩි තැබීමේ ශූරතාවලිය

2025 යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු සංග්‍රාමික වෙඩි තැබීමේ ශූරතාවලියේ සහතිකපත් සහ කුසලාන ප්‍රදානය කිරීමේ උත්සවය ඉකුත් දෙසැම්බර් මස 22 වන දින දියතලාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ පිහිටි සිනො-ලංකා මිත්‍රත්ව ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී සහභාගී විය.









ශ්‍රී ලංකා යුද්ධ හමුදා කුඩා අවි සංගමය සහ ප්‍රගුණ වෙඩික්කරු පුහුණු පාසල එක්ව සංවිධානය කරන ලද මෙම ශූරතාවලිය ඉකුත් නොවැම්බර් මස 04 වන දින සිට 15 වන දින දක්වා දියතලාව මීටර් 1000 වෙඩි පිටියේදී පැවැත්විණ. ඊට රෙජිමේන්තු 23ක් නියෝජනය කරමින් කණ්ඩායම් 37ක් සහ වෙඩික්කරුවන් 405 දෙනෙකු විවෘත, ආධුනික සහ සේවා රෙජිමේන්තු යන අංශ යටතේ සහභාගී වූහ. ශූරතාවලියේදී, වෙඩික්කරුවන් 63 දෙනෙක් පළමු වරට ප්‍රගුණ වෙඩික්කරු ලාංඡනය ලබා ගැනීමට සුදුසුකම් ලැබූ අතර, වෙඩික්කරුවන් 121 දෙනෙක් යුද්ධ හමුදාධිපති පදක්කම ලබා ගැනීමට සුදුසුකම් ලැබූහ.

මෙහිදී, විවෘත කණ්ඩායම් ශූරතාවය විශේෂ බළකාය විසින් ද නවක කණ්ඩායම් ශූරතාවලිය කමාන්ඩෝ රෙජිමේන්තුව විසින් ද සේවා රෙජිමේන්තු ශූරතාවය ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බළකාය විසින් ද සමස්ත හොඳම වෙඩි තැබීම 3 වන විශේෂ බළකායේ ලුතිනන් එම්ජ්ආර්ටීඑන් වික්‍රමනායක විසින් ද හිමිකරගනු ලැබූහ.

# පාඨමාලා හදාරන ශිෂ්‍ය නිලධාරීන් වෙත ලිපි ද්‍රව්‍ය බෙදා දේ







ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ පාඨමාලා අංක - 20 සහ හටකාර්ය සම්පාදන මාණ්ඩලික පාඨමාලා අංක - 12 හදාරනු ලබන යුද්ධ හමුදාවේ ශිෂ්‍ය නිලධාරීන් වෙත ලිපි ද්‍රව්‍ය බෙදාදීමේ උත්සවයක් ඉකුත් දෙසැම්බර් මස 17 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ. යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම උත්සවයේදී සංකේතාත්මකව ශිෂ්‍ය නිලධාරීන් 12 දෙනකු වෙත ලිපි ද්‍රව්‍ය ලබාදෙනු ලැබීය. ඉතිරි ශිෂ්‍ය නිලධාරීන් 91 දෙනා සඳහා ද ලිපි ද්‍රව්‍ය බෙදාදීමට නියමිතව ඇති අතර, එලෙස බෙදාදෙනු ලබන සම්පූර්ණ ලිපි ද්‍රව්‍යවල වටිනාකම රුපියල් 1,766,902.00 කි. හමුදා ඉතිහාසයේ පුහුණු පාඨමාලාවන් සඳහා සහභාගිවන්නන් වෙත ලිපි ද්‍රව්‍ය බෙදාදුන් පළමු අවස්ථාව එය වූ අතර, එමගින් ඔවුන්ගේ අධ්‍යාපනික පහසුකම් වැඩිදියුණු කිරීම අරමුණ වේ.

# උසස්වීම් ලැබූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත යුද්ධ හමුදාධිපතිගෙන් සුබ පැතුම්



මේජර් ජෙනරාල් එල්ඩී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සහ මේජර් ජෙනරාල් එච්ජ්අයි පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී යන නිලධාරීන් පසුගියදා නව නිලයට උසස්වීම් ලැබූහ. යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී, ඉකුත් දෙසැම්බර් මස 05 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී එම නිලධාරීන් වෙත සිය සුභ පැතුම් එක් කළේය.

---



නව නිලයට උසස්වීම් ලැබූ ලැබූ මේජර් ජෙනරාල් ජීඩීජේසී ප්‍රේමතිලක යූඑස්පී එන්ඩීසී පීඑස්සී, මේජර් ජෙනරාල් කේජීඑම්එන් සෙනෙවිරත්න යූඑස්පී, මේජර් ජෙනරාල් කේඑම්ජී බණ්ඩාරනායක යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහ මේජර් ජෙනරාල් කේජීයූටී ජයසිංහ යන නිලධාරින් වෙත ද යුද්ධ හමුදාධිපති විසින් ඉකුත් දෙසැම්බර් මස 15 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී සිය සුභ පැතුම් පිරිනමන ලදී.

---







නව නිලයට උසස්වීම් ලැබූ මේජර් ජෙනරාල් එම්එස්සී පීරිස් ආර්එස්පී යූඑස්පී, මේජර් ජෙනරාල් එස්පී වික්‍රමසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී හා මේජර් ජෙනරාල් ඩීකේආර්එන් සිල්වා ආර්එස්පී යූඑස්පී පීඑස්සී වෙත ද යුද්ධ හමුදාධිපතිගේ සුරතින් ඉකුත් දෙසැම්බර් මස 18 සහ 29 යන දිනයන් හිදී යුද්ධ හමුදා මූලස්ථානයේදී මේජර් ජෙනරාල් නිලයට හිමි අසිපත් පිරිනැමූ අවස්ථාව.

## මානව හිමිකම් සහ ජාත්‍යන්තර මානුෂීය නීති පිළිබඳ පාඨමාලාවක්




නීති සේවා, මානව හිමිකම් හා ජාත්‍යන්තර මානුෂීය නීති අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් මෙහෙයවනු ලැබූ මානව හිමිකම් හා ජාත්‍යන්තර මානුෂීය නීති පාඨමාලා අංක - 31 නිලධාරි ඉකුත් නොවැම්බර් මස 24 වන දින සිට දෙසැම්බර් මස 23 වන දින දක්වා කුකුළේගඟ, ශ්‍රී ලංකා සාම සාධක මෙහෙයුම් පුහුණු ආයතනයේදී පැවැත්විණ. එහිදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිලධාරීන් 19 දෙනෙක්, ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරීන් 05ක් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරීන් 03 දෙනෙක් ඇතුළුව නිලධාරීන් 27 දෙනෙක් මෙම පාඨමාලාව සාර්ථකව නිමකරනු ලැබූහ. කොළඹ විශ්වවිද්‍යාලයේ සහ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ දේශකයන්, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සහ ගුවන් හමුදාවේ උපදේශක නිලධාරීන් මෙන්ම ශ්‍රී ලංකා පොලිසියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් මෙම පාඨමාලාවේ දේශන සඳහා සිය දායකත්වය ලබාදුන්හ. තවද, ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ සන්නද්ධ සහ ආරක්ෂක වැඩසටහන් උපදේශක චන්න ජයවර්ධන මහතා ද දේශන පවත්වන ලදී. සහතික පත්‍ර ප්‍රදානය කිරීමේ උත්සවයේ ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගි වූ යුද්ධ හමුදා විධායක ජෙනරාල්, මේජර් ජෙනරාල් කේටීපී ද සිල්වා ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී විසින් එහි සමාප්ති දේශනය පවත්වන ලදී.

---

## කනිෂ්ඨ උපදේශක පාඨමාලාව සාර්ථකව අවසන්




කනිෂ්ඨ උපදේශක පාඨමාලා අංක - 108 හි විසිර යාමේ පෙළපාලිය ඉකුත් දෙසැම්බර් මස 01 වන දින අම්පාර සටන් පුහුණු පාසලේදී පැවැත්විණ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස එම සටන් පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් ඒකේසීඑස් ද සිල්වා ආර්එස්පී එන්ඩීසී සහභාගී විය. විවිධ රෙජිමේන්තු නියෝජනය කළ කොමිෂන් නොලත් නිලධාරීන් 51 දෙනෙකු මෙම පාඨමාලාව සාර්ථකව නිමකරන ලද අතර, 2 වන කමාන්ඩෝ රෙජිමේන්තුවේ ලාන්ස් කෝප්‍රල් සෙනවිරත්න ඩබ්ලිව්එම්ඩබ්ලිව්එස්එස් විසින් එහි හොඳම ශිෂ්‍යයාට හිමි සම්මානය දිනාගන්නා ලදී.



# ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලා රැසක්

පනාගොඩ, යුද්ධ හමුදා ශාරීරික අභ්‍යාස උපදේශක පුහුණු පාසලේදී පවත්වනු ලැබූ ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලාවන්හි විසිර යාමේ උත්සවය ඉකුත් දෙසැම්බර් මස 19 වන දින පවත්වනු ලැබීය. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස ශාරීරික අභ්‍යාස උපදේශක පුහුණු පාසලේ සේනාවිධායක කර්නල් එච්ආර්ජ්ජේකේකේ බස්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ආරාධනාව මත යුද්ධ හමුදා පුහුණු අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් බීජ්ඩීආර්ජ්සී විජේසේකර ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ යූඑස්ජ්සීජීඑස්සී සහභාගි විය.

එහිදී, නිලධාරි උසස් ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලා අංක 20 හදාරන ලද නිලධාරින් 19 දෙනෙක්, උසස් ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලා අංක 50 හදාරන ලද උපදේශකයින් 12 දෙනෙක්, සහකාර ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලා අංක 135 හදාරන ලද සෙසුනිලයන් 132 දෙනෙක් සහ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 04 පාඨමාලාවේ උපදේශකයින් 36 දෙනෙක් ඇතුළුව 199 දෙනෙක් පාඨමාලා සාර්ථකව නිම කර විසිර ගියහ.



# ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්‍රීඩා සම්බාහන පාඨමාලාවක්



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්‍රීඩා වෛද්‍ය අංශය මඟින් සංවිධානය කරන ලද ක්‍රීඩා සම්බාහන පාඨමාලා අංක - 10, ඉකුත් දෙසැම්බර් මස 19 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා බළකා රෙජිමේන්තු දේශන ශාලාවේදී සාර්ථකව අවසන් විය. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සමඟ එක්ව ක්‍රීඩා අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන ක්‍රීඩා සංවර්ධන හා කළමනාකරණ මධ්‍යස්ථානයේ මඟපෙන්වීම යටතේ වසරක් පුරා මෙම පුහුණු පාඨමාලාව පැවැත්විණ. මෙහි ප්‍රධාන අරමුණ වූයේ ක්‍රීඩා සම්බාහන ප්‍රතිකාර ක්‍රම සම්බන්ධයෙන් යුද්ධ හමුදා සාමාජිකයන් සතු වෘත්තීය කුසලතා තවදුරටත් ඉහළ නැංවීමයි.

ක්‍රීඩා සංවර්ධන හා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේනාවිධායක කර්නල් ඩබ්ලිව්පීකේ සෙනරත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී අයිජී ප්‍රධාන ආරාධිතයා ලෙස මෙම උත්සවයට සහභාගී වූ අතර, එහිදී පාඨමාලා සිසුන් 47දෙනෙකුට සහතිකපත් පිරිනමනු ලැබීය. පාඨමාලාවේ හොඳම ශිෂ්‍යයා ලෙස යුද්ධ හමුදා පොලිස් හේවා බළකායේ ලාන්ස් කෝප්‍රල් එච්එල්එස්එම් ප්‍රියදර්ශන සම්මාන ලැබීය.



# ජර්මානු ෆෙඩරල් සන්නද්ධ හමුදා ජංගම කණ්ඩායම සංචාරයක





එක්සත් ජාතීන්ගේ සාම සාධක පුහුණු වැඩසටහන් පැවැත්වීමේ හැකියාව තක්සේරු කිරීම සඳහා ජර්මානු ෆෙඩරල් සන්නද්ධ හමුදාවන්හි එක්සත් ජාතීන්ගේ ජංගම පුහුණු කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සාම සාධක මෙහෙයුම් පුහුණු ආයතනය වෙත ඉකුත් දෙසැම්බර් මස 01 වන දින පැමිණියහ. එහිදී, සේනාවිධායක බ්‍රිගේඩියර් වයිඑම්එස්සීබී ජයතිලක ආර්එස්පී යූඑස්පී විසින් ඔවුන්ව පිළිගන්නා ලද අතර, එහිදී එම පුහුණු ආයතනයේ කාර්යභාරය සහ එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් සඳහා හටපිරිස් සහභාගී කරවන රටක් ලෙස ශ්‍රී ලංකාවේ දායකත්වය අවධාරණය කරමින් ප්‍රධාන උපදේශක ලුතිනන් කර්නල් පීඩීඑස් ද අල්විස් ආර්එස්පී යූඑස්පී පීඑස්සී විසින් පාඨමාලාව පිළිබඳ හැඳින්වීමක් සිදුකරන ලදී. ඉන් අනතුරුව දැනට ක්‍රියාත්මක සාම සාධක පුහුණුවේ ප්‍රගතිය සහ සමාලෝචනය සම්බන්ධයෙන් එම පුහුණු කණ්ඩායම සමඟ සාකච්ඡාවක් ද පැවැත්විණ.

---

# චීන ඩ්‍රෝන තාක්ෂණික විශේෂඥ කණ්ඩායමක් මෙරට සංචාරයක





"දිට්වා" සුළි කුණාටුවෙන් සිදු වූ විනාශය තක්සේරු කිරීමට සහ සහන සේවා කටයුතු සඳහා සහායවීමට චීන ඩ්‍රෝන තාක්ෂණික විශේෂඥ කණ්ඩායමක් පසුගියදා දිවයිනට පැමිණියහ. එහිදී, එම කණ්ඩායම ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (DMC) සමඟ එක්ව මහනුවර දිස්ත්‍රික්කයේ දැඩි ලෙස බලපෑමට ලක්වූ ගම්පොළ, තඹරිගල, වාරකපිටිය, උලපනේ, නාවලපිටිය, අටබාගේ සහ අම්බුළුවාව යන ප්‍රදේශවල සිය මෙහෙයුම් කටයුතු සිදුකළහ. විනාශයට පත් ප්‍රදේශවල ඉහළ විභේදනයකින් යුත් ගුවන් සිතියම් සකස් කිරීම, නැවත නායයෑම් හෝ ගංවතුර ඇතිවිය හැකි අවධානම් කලාප හඳුනා ගැනීම ඔවුනගේ සංචාරයේ අරමුණ විය.

නායයෑමේ අවදානම පවතින බෑවුම්වල ස්ථායිතාව නිරීක්ෂණය කිරීමේ අරමුණින් එහිදී ගොඩබිම් සහන කණ්ඩායම්වලට ළඟාවීමට අපහසු ප්‍රදේශ නිරීක්ෂණය කිරීම සඳහා තාප රූපකරණ සහ ත්‍රිමාණ සිතියම්කරණ පහසුකම් සහිත නවීන කාර්මික ඩ්‍රෝන යානා ඔවුන් විසින් භාවිතා කරන ලදී. මෙම මෙහෙයුම චීනය විසින් "Rebuilding Sri Lanka" වැඩපිළිවෙලෙහි කොටසක් ලෙස සිදුකළ අතර, මීට අමතරව ඇමෙරිකානු ඩොලර් 100,000.00ක ක්ෂණික මුදල් ප්‍රදානයක් ද විශාල මානුෂීය සහන ද්‍රව්‍ය තොගයක් ද ඔවුන් විසින් ලබාදෙන ලදී.

# ගොඩනඟන දේශයේ බර දරන නියමුවන්




මනම්පිටිය දුම්රිය මාර්ගය
ශ්‍රීපාද පුදබිම
නයාරු පාලම
යටියන්තොට
ගලගෙදර
ඌව පරණගම

ඉතිහාසයේ නොවූ විරූ දරුණුම ස්වභාවික ව්‍යසනය නිමාවට පත්ව සති, මාස ගෙවෙමින් ඇතත් ඒ පිළිබඳ වූ අඳුරු මතක තවමත් ජනතා සිත් සතන් තුළ සහමුලින්ම වියැකී නොමැත. ඒ අතරම එකී වේදනා පීඩා මතින් යළි හිස ඔසවා ජීවිතය ජයගැනීමේ අභියෝගයක්ද අප හමුවේ පවතී. එකී ව්‍යසනයට පත් ප්‍රදේශ ඉලක්ක කරගනිමින් මේ දිනවල අලුත්වැඩියා හා යළි ගොඩනැගීමේ කාර්යයන් රැසක් ලහි ලහියේ සිදුවන අතර, ඒ බොහෝ තැන්වලදී රණවිරුවන්ද සිය ශ්‍රමය හා තාක්ෂණික දායකත්වය ලබාදෙමින් එම ජාතික මෙහෙවරට ලබාදෙමින් සිටිනුයේ අසීමිත දායකත්වයකි.

විපතේදී ක්ෂණිකව මැදිහත්ව ජන දිවි බේරූ ඔවුන් ඉන් නොනැවතී තවදුරටත් සිය මෙහෙවරෙහි නියැලෙනුයේ රණවිරුවන් යනු කිසිදා ඔබව අතහැර නොයන ඔබගේම සමීපතමයින් බව පසක් කරමිනි.
















රත්තොට
වෙඩිඩිකුලම් දුම්රිය මාර්ගය
පෙරියවඩ්ඩුවාන් සින්නතුරෙයිචේන වැව
හපුතලේ
පලුගස්වැව, වැලි ඇල මාර්ගය
මැදවච්චිය
වෙලකේපෙත්තකන්දල්
වැව් බැම්ම


හුන්නස්ගිරිය මීමුරේ මාර්ගය
රත්මල්ඔය
මහියංගනය ජලසම්පාදනය
නයාරු පාලම
මහියංගනය රෝහල
මුතියන්කට්ටු
මාතලේ
මැදවච්චිය
නයාරු
නයාරු පාලම


පදවිය
කන්දවේලි



# විරු දරු දැරියන්ගේ ඉගෙනුමට අත්වැලක් වෙමින්





2024 වර්ෂයේ අ.පො.ස (සා/පෙළ) විභාගය සඳහා පෙනී සිට විශිෂ්ට සාමාර්ථ ('A' සාමාර්ථ 09ක්) ලබාගත් රණවිරු දූ දරුවන් සහ 2025 වර්ෂයේ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්වය සඳහා පෙනී සිට ඉන් විශිෂ්ට ප්‍රතිඵල ලබාගත් රණවිරු දරු දැරියන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් මස 18 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ. යුද්ධයේදී මියගිය, රණක්ෂිතයට පත්, විශ්‍රාමික, දැනට සේවයේ යෙදී සිටින රණවිරුවන්ගේ මෙන්ම යුද්ධ හමුදාවේ රාජකාරී කරනු ලබන සිවිල් සේවක මහත්ම මහත්මීන්ගේ දූවා දරුවන් මේ සඳහා තෝරා ගැනිණ.

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වේන්ද්‍රිනී රොද්‍රිගෝ මහත්මියගේ අධීක්ෂණය සහ මඟපෙන්වීම යටතේ පැවති මෙම සත්කාරයට ප්‍රධාන ආරාධිතයා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී සහභාගී විය. එහිදී, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙතින් රුපියල් පනස් හය ලක්ෂ හැටදහසක (රු. 5,660,000.00) මුදලක් වැයදරා 2024 වර්ෂයේ අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් A සාමාර්ථ 9ක් ලබාගත් දූ දරුවන් 193 දෙනෙකු සඳහා එක් අයෙකුට රුපියල් විසිපන්දහස බැගින් (රු. 25,000.00) හා 2025 වර්ෂයේ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 170ට වඩා ලබාගෙන විශිෂ්ට ලෙස සමත් දූවා දරුවන් 53 දෙනෙකු සඳහා එක් අයෙකුට රුපියල් පහළොස්දහස බැගින් (රු. 15,000.00) ප්‍රදානය කෙරිණ.



# ආපදාවට ලක්වූ රණවිරුවන්ට සේවා වනිතාවෙන් සවියක්



පැවති අයහපත් කාලගුණික තත්වයෙන් පීඩාවට පත් යුද්ධ හමුදා සාමාජිකයින් සහ සිවිල් සේවක කාර්ය මණ්ඩලයේ 3,656 දෙනෙකු වෙත යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙතින් වියලි සළාක බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් මස 30 වන දින නාගහමුල්ල පිහිටි යුද්ධ හමුදා කඳවුරේදී පැවැත්විණ. මෙම අවස්ථාවට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වේන්ද්‍රිනි රොද්‍රිගෝ මහත්මිය සහභාගී වූහ.

---

# අභිමංසල නිකේතනයන්හි නත්තල් සැමරුම්





අනුරාධපුර අභිමංසල -1 සුවතා නිකේතනයේ නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන් වෙත ආශිර්වාද කිරීමේ දේව මෙහෙයක් ඉකුත් දෙසැම්බර් මස 23 වන දින එම පරිශ්‍රයේදී පැවැත්විණ. එහි සේනාවිධායක බ්‍රිගේඩියර් යූආර්අයිබී රණතුංග ආර්එස්පී යූඑස්පී ගේ මඟපෙන්වීම යටතේ, පැවති එම වැඩසටහනේදී අනුරාධපුර පදවි රදගුරු මහාචාර්ය නෝබට් අන්රාදි රදගුරුතුමන් විසින් දේව මෙහෙය පවත්වන ලදී. එහිදී, නත්තල් කැරොල් ගීත ගායනා කිරීම ද එම රණවිරුවන් වෙත ත්‍යාග පාර්සල් බෙදාදීම ද සිදුකෙරිණ. 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ටීඑන්කේ පෙරේරා ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩසටහනට හටකාර්ය සම්පාදක අණසක ආඥාපති ආරක්ෂක සේනා මූලස්ථානය - වන්නි මේජර් ජෙනරාල් කේජීයූටී ජයසිංහ ඇතුළු නිලධාරින් සහ සෙසුනිලයන් රැසක් සහභාගී වූහ.

තවද, අභිමංසල 3, පිහිටි වෙල්නස් රිසෝට් හිදී ඉකුත් දෙසැම්බර් මස 23 වන දින නත්තල් සැමරුම් වැඩසටහනක් පැවැත්විණ. සුවතා නිකේතනයේ ප්‍රතිකාර ලබන ආබාධිත රණවිරුවන්ගේ මෙන්ම ඔවුන්ගේ භාරකරුවන්ගේ චිත්ත ධෛර්යය ඉහළ නැංවීමේ අරමුණින් සංවිධානය කෙරුණු මෙම වැඩසටහනට කතෝලික දේව යාඥා මෙහෙයක් ද ඉන් අනතුරුව නත්තල් තෑගි බෙදාදීමක් ද ඇතුළත් විය. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස 57 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඑම්වී කොඩිතුවක්කු එන්ඩීයූ සහභාගී විය.









# කාලගුණික තත්වයෙන් පීඩාවට පත් ජනතාවට සහන සලසමින්

පසුගිය කාල වකවානුව තුළ පැවති අයහපත් කාලගුණික තත්වය හමුවේ ආපදාවන්ට ලක්ව පීඩාවට පත් මහජනතාවට සහන සැලසීමේ අරමුණින් 58 වන පාබල සේනාංකය විසින් සංවිධානය කරන ලද ආපදා සහන සේවා කටයුත්තක් හලාවත ප්‍රදේශයේදී පැවැත්විණ. යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට 1 බළකායේ බළකාධිපති, 58 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ඇතුළු නිලධාරීහු පිරිසක් එක්වූහ.





# "දිට්වා" හමුවේ ඉන්දීය හමුදාවේ මානුෂීය සත්කාර සේවය අගයමින්






"දිට්වා" සුළි කුණාටුවෙන් පසු මෙරට ඇතිවූ ආපදා තත්වයේදී වෛද්‍ය ආධාර ලබාදීම සඳහා ඉන්දීය හමුදාවේ 60 පැරෂුට් ක්ෂේත්‍ර රෝහල මඟින් සපයන ලද මානුෂීය සත්කාර සහ වෘත්තීය විශිෂ්ටත්වය අගයමින් මෙරටට පැමිණි එම ඉන්දීය කණ්ඩායම ඇගයීමට ලක්කිරීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් මස 14 වන දින පනාගොඩ, යුද්ධ හමුදා ජනපදයේදී පැවැත්විණ. Lieutenant Colonel Jagneet Gill ගේ නායකත්වයෙන් 85 දෙනෙකුගෙන් සමන්විත එම ඉන්දීය වෛද්‍ය කණ්ඩායම 2025 දෙසැම්බර් මස 02 වන දින සිට දෙසැම්බර් මස 12 වන දින දක්වා ඌව පළාතේ මහියංගනය ප්‍රදේශයේ ආපදාවට පත් ජනතාව වෙනුවෙන් වෛද්‍ය සහන සේවා කටයුතුවල නියැලුනහ.




මෙම කාලය තුළදී එම වෛද්‍ය කණ්ඩායම විසින් පීඩාවට පත් සිවිල් වැසියන් 7,000කට අධික සංඛ්‍යාවකට වෛද්‍ය ප්‍රතිකාර සහ දන්ත ප්‍රතිකාර සේවාවන් ලබාදෙන ලදී. ඔවුන්ගේ එම ආදර්ශමත් සේවය ඇගයීමට ලක්කරමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙනුවෙන් මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් යුද්ධ හමුදාධිපති විසින් නිකුත් කරන ලද ඇගයීමේ ලිපිය ප්‍රදානය කරන ලද අතර, පසුව දෙපාර්ශවය අතර සමරු තිළිණ හුවමාරුවක් ද සිදුකරනු ලැබීය.

# එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ මානුෂීය සත්කාර සේවය ඇගයේ



Dr Hamoud Saeed Hareb Al Afari ගේ නායකත්වයෙන් යුත් 74 දෙනෙකුගෙන් සමන්විත එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ආපදා සහන සේවා කණ්ඩායම මෙරට දී සිදුකළ මානුෂීය සත්කාර සේවය ඇගයීමට ලක්කිරීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් මස 15 වන දින මීගමුව හෙරිටන්ස් හෝටලයේදී පැවැත්විණ. "දිට්වා" සුළි කුණාටුවේ බලපෑමෙන් ආපදා තත්ත්වයට ලක් වූ ප්‍රදේශ වෙත හදිසි මානුෂීය ආධාර ලබාදීම සඳහා මෙම කණ්ඩායම ඉකුත් දෙසැම්බර් මස 01 වන දින මෙරටට පැමිණියහ.



එම සහන සේවා කණ්ඩායම විසින් මධ්‍යම පළාතේ ගම්පොළ, මාවතුර, රජතලාව, අංකුඹුර සහ රඹුකේ-ඇල යන ප්‍රදේශවල ගලවා ගැනීමේ රථ 11ක්, බෝට්ටු 02ක් භාවිතා කරමින් ආහාර සලාක පාර්සල් 3,636ක්, කූඩාරම් 300ක් සහ අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ලබාදෙමින් ගලවා ගැනීමේ සහ සහන සේවා මෙහෙයුම් දියත්කරන ලදී. එහිදී, ඔවුන් ආපදාවට ලක්වූවන් බේරා ගැනීම සඳහා දේශීය සහන සේවා කණ්ඩායම්වලට සහාය වූහ. මෙරට රැඳී සිටි කාලය තුළ ඔවුන්ගේ සුවිශේෂී වෘත්තීයභාවය සහ කැපවීම තුළින් ආපදාවට ලක් වූ ජනතාවට සහාය වීමට සහ එම ආපදාවේ බලපෑම අවම කිරීමට මෙරට බලධාරීන් සමඟින් සමීපව කටයුතු කරනු ලැබීය. ඔවුන්ගේ මෙම කැප වූ සේවය අගයමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කෘතවේදීත්වය සහ මිත්‍රත්වය සංකේතවත් කිරීම සඳහා යුද්ධ හමුදාධිපති නියෝජනය කරමින්, යුද්ධ හමුදා උපකරණ මාස්ටර් ජෙනරාල් මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්එස්එන් විජේකෝන් එන්ඩීසී ඒඒටීඕ විසින් එම කණ්ඩායමේ සියලුම සාමාජිකයන් වෙත සම්මාන සහ සහතිකපත්‍ර පිරිනමන ලදී.

# පාකිස්ථානු යුද්ධ හමුදා ගලවා ගැනීමේ කණ්ඩායමට ගෞරව



Major Muhammad Abdul Mannan ගේ නායකත්වයෙන් 47 දෙනෙකුගෙන් යුත් පාකිස්ථානු යුද්ධ හමුදා සහන කණ්ඩායම දිට්වා සුළි කුණාටුවෙන් පසු සිදු කරන ලද ආපදා සහන මෙහෙයුම් වලදී දැක්වූ දායකත්වය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ඇගයිමට ලක්විය. ලුහුබැඳීමේ මෙහෙයුම් සඳහා පුහුණු කරන ලද සුනඛයින් සිව්දෙනෙකු සහ විශේෂිත උපකරණ ද සමඟින් ඉකුත් දෙසැම්බර් මස 03 වන දින දිවයිනට පැමිණි එම කණ්ඩායම, දොළුව ප්‍රදේශයේ පිහිටි 111 වන පාබල බළසේනා මූලස්ථානය වෙත අනුයුක්ත කරන ලදී. පසුව දෙසැම්බර් මස 06 දින සිට 13 දින දක්වා කාලය තුළ ඔවුහු ශ්‍රී ලංකා යුද්ධ හමුදා භට පිරිස් සමඟ එක්ව වැලිකන්ද සහ මාවතුර ප්‍රදේශවල මානුෂීය සහන සේවා සඳහා විශේෂ සෝදිසි කිරීමේ සහ මුදාගැනීමේ මෙහෙයුම්වල නිරත වූහ.

යුද්ධ හමුදාධිපති ගේ මඟපෙන්වීම මත වත්කම් කළමනාකරණ අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් එන්ඒඑම්පී නාගහවත්ත ආර්එස්පී විසින් එම අවස්ථාවේදී පාකිස්ථානු යුද්ධ හමුදා කණ්ඩායමේ නායකයා වෙත ඇගයීම් ලිපියක් පිළිගැන්වූ අතර, දෙරටේ හමුදාවන් අතර සමරු තිළිණ හුවමාරුවක් ද එහිදී සිදු කෙරිණ.



# අභිමානවත් සංවත්සරය සමරමින්





ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ විශිෂ්ටත්වයේ 76 වන වසර සමරමින් ඉංජිනේරු සේවා බළකාය ද එහි 76 වන සංවත්සරය ඉකුත් දෙසැම්බර් මස 12 වන දින සැමරීය. කැලණිය රජමහා විහාරස්ථානයේ දී ඒකක ධජයන්ට ආශිර්වාද පුද කරමින් ඇරඹි සංවත්සර වැඩසටහන් වෙනුවෙන් යාපනය ආරක්ෂක සේනා ආඥාපති හා ඉංජිනේරු සේවා බළකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් කේජ්එන් රසික කුමාර එන්ඩීසී පීඑස්සී, යුද්ධ හමුදා මූලස්ථානයේ කළමනාකරණ හා නඩත්තු අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් එන්ඩබ්ලිව්පීඑස්එම් පෙරේරා ඇතුළු නිලධාරීන් ද එක්වූහ. තවද, සංවත්සරයට සමගාමීව එම බළකා සාමාජිකයින්ට සෙත්පතා ඉකුත් දෙසැම්බර් මස 18 වන දින හංවැල්ල ජුම්මා මස්ජිඩ් පල්ලියේදී ඉස්ලාමීය ආගමික වතාවත් ද, දෙසැම්බර් මස 16 වන දින වැල්ලවත්ත මයුරපති ශ්‍රී භද්‍රකාලී අම්මාන් කෝවිලේදී හින්දු ආගමික වතාවත් ද පැවැත්විණ.





55 වන පාබල සේනාංකයේ 29 වන සංවත්සරය 2025 දෙසැම්බර් මස 15 වන දින කිලිනොච්චියේ පිහිටි එම සේනාංකයේදී සමරනු ලැබීය. සංවත්සරයට සමගාමීව, අනුරාධපුර ශ්‍රී මහා බෝධිය අබියසදී ධජයන් වෙත ආශිර්වාද එක්කිරීමේ ආගමික වැඩසටහනක් සහ කිලිනොච්චිය ශාන්ත තෙරේසා දේවස්ථානය, ලුම්බිණි විහාරය සහ කන්දසාමි කෝවිලේදී තවත් ආගමික වැඩසටහන් රැසක් ද පැවැත්විණ. තවද, රට වෙනුවෙන් දිවිපිදූ විරුවන් සිහිපත් කිරීම සඳහා අලිමංකඩ රණවිරු ගාමිණී කුලරත්න ස්මාරකය ඉදිරිපිට පැවති පුෂ්පෝපහාර දැක්වීමේ උත්සවයක් ද සංවත්සර කටයුතු අතර විය. 55 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ජ්බී විජේකෝන් යූඑස්පී එන්ඩීසී වෙත හටපිරිස් විසින් හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු මුරයේ සහ සම්මාන මුරයේ ගෞරවාචාර පිරිනමන ලද අතර, පසුව සාම්ප්‍රදායික සියලු නිල දිවා භෝජන සංග්‍රහයක් ද පැවැත්විණ.





561 වන පාබල බලසේනාවේ 16 වන සංවත්සරය එහි බලසේනාධිපති බ්‍රිගේඩියර් ඊජීසී ගුණසේන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් දෙසැම්බර් මස 07 වන දින අභිමානවත්ව පැවැත්විණ. එහිදී ආගමික, චාරිත්‍රානුකූලව ඇරඹි සංවත්සර වැඩසටහන් අතරට මියගිය රණවිරුවන් සැමරීම, අන්තර් ඒකක ක්‍රීඩා, බලසේනාධිපති වෙනුවෙන් පැවති කඳවුරු සම්මාන මුරය හා සියලු නිල දිවා භෝජන සංග්‍රහය විශේෂ විය. මානුෂීය මෙහෙයුමෙන් පසුව 2009 දෙසැම්බර් මස 08 වන දින පිහිටුවන ලද 56 වන පාබල සේනාංකය යටතේ ස්ථාපිත 561 වන පාබල බලසේනාව මේ දක්වා බලසේනාධිපතිවරු 13 දෙනෙකු යටතේ අභිමානවත්ව අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන අතර, එමඟින් බලසේනාවේ නොසැළෙන ශක්තිය, එකමුතුකම සහ ජාතිය කෙරෙහි වන කැපවීම පිළිඹිබු කරවයි.

# ආකල්ප සංවර්ධනය කිරීමේ වැඩසටහනක්





ආකල්ප සංවර්ධනය කිරීමේ වැඩසටහනක් නැගෙනහිර හකාස අණසක ආඥාපති මේජර් ජෙනරාල් ටීඑන් මජීඩ් ආර්එස්පී යූඑස්පී එන්ඩීසී විසින් පසුගියදා හිගුරක්ගොඩ ගෝල්ඩන් ෆල්වර් හෝටල් ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිගේ ඉල්ලීම පරිදි පැවති මෙම වැඩසටහනට එම ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන්ගේ සිට සෞඛ්‍ය සේවා සහයක කම්කරුවන් දක්වා සියලුම රැකියා තරාතිරම්වල නියුතු අයවලුන් රැසක් සහභාගී වූහ.

---

# “යුද්ධ සාහිත්‍යය තුළින් කෙඩෙට් නිලධාරීන් බලගැන්වීම”





යුද්ධ හමුදා ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂගේ උපදෙස් හා මඟපෙන්වීම මත රණවිරු අභිප්‍රේරණය වෙනුවෙන් සංවිධානය කෙරෙන දේශන මාලාවේ තවත් අදියරක් ඉකුත් දෙසැම්බර් මස 07 වන දින කොතළාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේදී පැවැත්විණ.

එහිදී, යුදබිමේ මතක හා අත්දැකීම් ඇසුරින් රණවිරුවන්ගේ ඉවසීම, දරාගැනීම, කැපකිරීම් මෙන්ම 30 වසරක යුද්ධයේ සන්ධිස්ථාන පිළිබඳ නව පරපුර දැනුම්වත් කිරීමත් යුද අත්දැකීම් සහිතවූවන් තුළ අභිමානයක් ඇතිකරලීමත් පිණිස “යුද සාහිත්‍යය තුළින් කෙඩෙට් නිලධාරීන් බලගැන්වීම” මැයෙන් වූ දේශනය ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවයේ නියුතු ලුතිනන් කර්නල් ඊජ්ජ් සුජිත් චමින්ද විසින් සිදුකරන ලදී. මේ සඳහා එම විශ්ව විද්‍යාලයේ නිලධාරීන්, උපදේශකයින් සහ කෙඩෙට් නිලධාරීන් 600කට වැඩි පිරිසක් සහභාගී වූහ.

---

# විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවෙන් ආර්ථිකයට සවියක්



දේශීය වෙළඳපොළේ ඇස්තමේන්තුගත වටිනාකම රුපියල් මිලියන 10කට ආසන්න වූ ජෛව වෛද්‍ය උපකරණ තොගයක්, රුපියල් මිලියන 1.5ක් වැනි අවම පිරිවැයකින් යුත් අමතර කොටස් භාවිතා කරමින් සාර්ථකව අලුත්වැඩියා කිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවේ ජෛව වෛද්‍ය වැඩපොළේ භටපිරිස් සමත් වූහ. රට ආර්ථික අභියෝගයන්ට මුහුණ දෙන මොහොතක, මහජන මුදල් විශාල ප්‍රමාණයක් ඉතිරි කරමින් සහ යුද්ධ හමුදාවේ සුවිශේෂී වෘත්තීය නිපුණතාවය මැනවින් ඉස්මතු කරමින්, එම භටපිරිස් ස්වේච්ඡාවෙන්ම මෙම වෛද්‍ය උපකරණ අලුත්වැඩියා කටයුතු සිදු කිරීම විශේෂත්වයකි. එම භටපිරිස් සිදුකළ ආදර්ශමත් සේවය සහ කැපවීම ඇගයීමට ලක් කරමින් විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ විසින් පසුගියදා ඔවුන් වෙත සහතික ප්‍රදානයක් ද සිදු කරන ලදී.

# ඉරානයේ පැවති 6 වන ජාත්‍යන්තර පිරිමි ෆජ්ර් කුසලාන තරඟාවලියෙන් රිදී පදක්කමක්







6 වන ජාත්‍යන්තර පිරිමි ෆජ්ර් කුසලාන බර ඉසිලීමේ ශූරතාවලිය ඉකුත් නොවැම්බර් මස 26 වන දින සිට 30 වන දින දක්වා ඉරානයේ ටෙහෙරාන් අගනුවරදී පැවැත්විණි. මෙම තරඟාවලිය සඳහා කලාපීය රටවල මලල ක්‍රීඩකයින් රැසක් සහභාගී වූ අතර, ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා බර ඉසිලීමේ ක්‍රීඩක කණ්ඩායම ඊට සහභාගී විය.

එහිදී, 15 ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ තුවක්කු සෙබළ ලියනගෙදර එල්ජීඒඑස් විසින් කිලෝග්‍රෑම් 60 බර පන්තියේ දක්ෂතා දක්වමින් රිදී පදක්කමක් දිනා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට මෙන්ම මව්බිමට ගෞරවයක් ගෙන දෙන ලදී.

---

# ඉන්දු - ලංකා මිත්‍රශීලී කබඩි තරඟාවලිය



ඉන්දු-ලංකා ද්විපාර්ශ්වික ක්‍රීඩා දක්ෂතා ප්‍රවර්ධනය කිරීමේ කොටසක් ලෙස, ඉන්දීය යුද්ධ හමුදා කබඩි කණ්ඩායම සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කබඩි කණ්ඩායම අතර මිත්‍රශීලී කබඩි තරඟාවලියක් ඉකුත් දෙසැම්බර් මස 02 සහ 04 යන දෙදින පනාගොඩ යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත්විණි. යුද්ධ හමුදා ක්‍රීඩා අධ්‍යක්ෂ මණ්ඩලය හා යුද්ධ හමුදා කබඩි ක්‍රීඩා කමිටුව එක්ව මෙම තරඟාවලිය සංවිධානය කරන ලදී.





# යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු එල්ලේ තරඟාවලිය - 2025





යුද්ධ හමුදා එල්ලේ කමිටුව විසින් සංවිධානය කරන ලද යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු එල්ලේ තරඟාවලිය - 2025, දියගම ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණයේදී ඉකුත් දෙසැම්බර් මස 12 වන දින අවසන් වූ අතර, ඒ සඳහා යුද්ධ හමුදාවේ රෙජිමේන්තු දොළහක් නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 300කට අධික සංඛ්‍යාවක් සහභාගි වූහ.

එහි පිරිමි අංශයේ අවසන් තරඟයේදී යුද්ධ හමුදා සේවා බළකා එල්ලේ කණ්ඩායම පරාජය කරමින් ශ්‍රී ලංකා පාබල හමුදා එල්ලේ කණ්ඩායම ශූරතාව දිනාගත් අතර, ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකා එල්ලේ කණ්ඩායම එහි තෙවන ස්ථානය හිමිකරත්තේය. කාන්තා අංශයේ එල්ලේ ශූරතාවය 2 (ස්වේච්ඡා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකා කණ්ඩායම විසින් හිමිකර ගත් අතර, අනුශූරතාවය 3 (ස්වේච්ඡා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකායට හිමිවිය. තරඟාවලියේ සමාප්ති දින උත්සව අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ සේනාවිධායක සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා එල්ලේ කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් කේවීඑන්පී ප්‍රේමරත්න ආර්එස්පී යූඑස්පී එන්පීඑස් පීඑස්සී සහභාගි විය.

# යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු කරාතේ ශූරතාවලිය








අන්තර් රෙජිමේන්තු කරාතේ ශූරතාවලිය ඉකුත් දෙසැම්බර් මස 10, 11 සහ 12 යන දිනයන්හිදී පනාගොඩ යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත්විණ. එහි සමාප්ති උත්සවයට ප්‍රධාන ආරාධිතයා ලෙස භකාස අණසක (මධ්‍යම) ආඥාපති සහ යුද්ධ හමුදා කරතේ කමිටු සභාපති මේජර් ජෙනරාල් ආර්ඩී සලේ එන්ඩීසී සහභාගී විය.

## යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු බිලියඩ් සහ ස්නූකර් තරඟාවලිය - 2025







යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු බිලියඩ් සහ ස්නූකර් තරඟාවලිය - 2025, කුසලාන සහ සහතිකපත්‍ර ප්‍රදානෝත්සවය 2025 දෙසැම්බර් මස 30 වන දින ඉංජිනේරු සේවා බළකා රෙජිමේන්තු මධ්‍යස්ථාන බිලියඩ් සහ ස්නූකර් ක්‍රීඩාංගනයේදී පැවැත්විණි. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ජාතික ශිෂ්‍යභට බළකායේ අධ්‍යක්ෂ සහ යුද්ධ හමුදා බිලියඩ් සහ ස්නූකර් කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් ඒපීසීආර් ප්‍රේමතිලක ආර්එස්පී යූඑස්පී එන්ඩීසී සහභාගී විය. තරඟාවලියේ ශූරතාවය ඉංජිනේරු සේවා බළකා "ඒ" කණ්ඩායම විසින් හිමිකර ගත් අතර, ශ්‍රී ලංකා සංඥා බළකා කණ්ඩායම අනුශූරතාවයත් ඉංජිනේරු බළකා "බී" කණ්ඩායම තෙවන ස්ථානයත් හිමිකරගන්නා ලදී.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු තුන්ප්‍රයාම ශූරතාවලිය - 2025







ශ්‍රී ලංකා යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු තුන්ප්‍රයාම ශූරතාවලිය - 2025 ඇඹිලිපිටිය චන්ද්‍රිකා වැව පරිශ්‍රයේදී ඉකුත් දෙසැම්බර් මස 20 වන දින සාර්ථකව පැවැත්විණ. මෙම ශූරතාවලිය සඳහා රෙජිමේන්තු 12ක් නියෝජනය කරමින් ක්‍රීඩකයන් 55 දෙනෙක් සහ ක්‍රීඩිකාවන් දෙදෙනෙක් සහභාගී වූහ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස 24 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා තුන්ප්‍රයාම කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් කේඩබ්ලිව් ජයවීර යූඑස්පී පීඑස්සී සහභාගී විය. තුන්ප්‍රයාම ශූරතාවලිය තරඟකරුවන්ගේ සමස්ත මලල ක්‍රීඩා දක්ෂතා ප්‍රදර්ශනය වෙනුවෙන් මීටර් 750ක් පිහිනීම, කිලෝමීටර 20ක් බයිසිකල් පැදීම සහ කිලෝමීටර 5ක් දිවීම වැනි අභියෝගාත්මක තරඟ අදියර තුනකින් සමන්විත විය.





# ශාන්ත මරියා දේවස්ථානය රණවිරු සහායෙන් ප්‍රතිසංස්කරණය කෙරේ



අවිස්සාවේල්ල ශාන්ත මරියා දේවස්ථානයේ ගරු ටිරාන් පෙරේරා පියතුමන්ගේ ඉල්ලීමකට අනුව, එම දේවස්ථානයේ තීන්ත ආලේප කිරීම සහ වතුර ටැංකිය අලුත්වැඩියා කොට ජල නල පද්ධතියක් සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ භට පිරිස් ශ්‍රමදායකත්වය ලබාදුන්හ. යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් කේවීඑන්පී ප්‍රේමරත්න ආර්එස්පී යූඑස්පී එන්පීඑස් ගේ මඟපෙන්වීම යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද එම දේවස්ථානය, ඉකුත් දෙසැම්බර් මස 18 වන දින නැවත දේවස්ථාන බලධාරීන් වෙත නිල වශයෙන් පවරා දෙනු ලැබීය.



## ඉගෙනුමට අත්වැලක්



මඩකලපුව සිවිල් සමාජ කමිටුව විසින් මාස 12 ක කාලසීමාවක් පැවති ඩිප්ලෝමා පාඨමාලා සාර්ථකව නිම කරන ලද සිසුන් 200 දෙනෙකු සඳහා සහතික පත් ප්‍රදානය කිරීමේ උත්සවයක්, 2025 දෙසැම්බර් මස 28 වන දින පුනානි හි පිහිටි ජාත්‍යන්තර විද්‍යා හා තාක්ෂණ විශ්ව විද්‍යාලයේදී පැවැත්විණ. මෙම අවස්ථාව සඳහා ප්‍රධාන අමුත්තන් ලෙස ආරක්ෂක සේනා නැගෙනහිර ආඥාපති මේජර් ජෙනරාල් ජේඑස්බීඩබ්ලිව් පල්ලේකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී සහ 23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජේපීපී කුලතිලක එන්ඩීයූ සහභාගි වූහ.

# පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ වැඩසටහන් රැසක්




542 වන පාබල බළසේනා මූලස්ථාන බළප්‍රදේශයට අයත් මන්/මඩුපාර සිංහල මහා විද්‍යාලය, මන්/කඩ්ඩිඅඩප්පන් රෝමානු කතෝලික දෙමළ මහා විද්‍යාලය, මන්/තම්පනේකුලම් රෝමානු කතෝලික දමිළ ප්‍රථමික විද්‍යාලය, මන්/පන්නිවෙට්ටුවාන් රෝමානු කතෝලික දමිළ ප්‍රාථමික විද්‍යාලය යන පාසල්වල ගංවතුරෙන් පීඩාවට පත් පාසල් ළමුන් 115 දෙනෙකු සඳහා වසරකට අවශ්‍ය වන පරිදි සියලුම පාසල් උපකරණ ලබාදීමේ සත්කාරයක් ඉකුත් දෙසැම්බර් මස 22 වන දින සිදු කෙරිණ. තවද, එම පාසලේ ඉගැනීම් කටයුතු සිදු කරනු ලබන ගුරුවරුන් 25 දෙනෙකු හට ත්‍යාග බෙදාදීම ද එහිදී සිදුවිය. මෙම වැඩසටහන 54 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඑම්සී අබේකෝන් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී ගේ මඟපෙන්වීම යටතේ සහ 542 වන පාබල බළසේනාවේ බළසේනාධිපති බ්‍රිගේඩියර් ඒආර්ඩබ්ලිව්සී අසුරසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ අධික්ෂණයෙන් 4 වන බළඇණිය ගජබා රෙජිමේන්තුවේ සියලු නිලධාරීන් සහ සෙසුනිලයන් එකතුව සංවිධානය කළහ. ඒ සඳහා අනුග්‍රාහක දායකත්වය ගාල්ල අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ 2006 වර්ෂයේ උසස්පෙළ ආදිශිෂ්‍ය කණ්ඩායම විසින් ලබාදෙන ලදී.





මන්නාරම් ප්‍රදේශයේ පාසල්වල ඉගෙනුම ලබන අඩු ආදායම් පවුල්වලට අයත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 142 දෙනෙකු සඳහා පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් මස 22 වන දින මන්නාම් සංස්කෘතික ශාලාවේදී පැවැත්විණ. 54 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඑම්සී අබේකෝන් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ මඟපෙන්වීමෙන් 543 වන පාබල බළසේනාවේ බළසේනාධිපති කර්නල් ඒඑච්ආර් හසන්ත ආර්එස්පී පීඑස්සී ගේ අධීක්‍ෂණයෙන් පැවති මෙම පරිත්‍යාගය සඳහා වෛද්‍ය ජිනංජලා ශානිකා විජයගුණසේකර මහත්මිය සහ ඇයගේ දියණිය වෛද්‍ය තරුෂි දිල්හාරා පෙරේරා මහත්මිය පූර්ණ අනුග්‍රාහකත්වය දැරූහ.





56 වන පාබල සේනාංකය විසින් ඉකුත් දෙසැම්බර් මස 24 වන දින නෙදුන්කුලම, ප්‍රාථමික විද්‍යාලයේ සිසුන් 45ක් සහ කොක්වෙලිය, ප්‍රාථමික විද්‍යාලයේ සිසුන් 11 දෙනෙකු වෙත පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී. මෙම පරිත්‍යාග සඳහා මූල්‍ය දායකත්වය නලින දිසානායක මහතා, ඔහුගේ පවුලේ සාමාජිකයන්, පාසල් මිතුරන් සහ ෆ්‍රී බයිකර් එලයන්ස් වර්ල්ඩ් - ශ්‍රී ලංකා සංවිධානයේ සාමාජිකයින් විසින් දැරූහ. මෙම අවස්ථාවට 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්ජ්‍යූජ් සෝලංගආරච්චි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ප්‍රධානත්වය දැරීය.

# විරු කැකුළු දරු දැරියන්ගේ හපන්කම්






යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මඟින් පවත්වාගෙන යනු ලබන ගාල්ල විරු කැකුළු පෙර පාසලෙහි ඉගෙන ගන්නා දරු දැරියන්ගේ වර්ෂ අවසාන විවිධ ප්‍රසංගය ඉකුත් නොවැම්බර් මස 25 වන දින Hall De Galle ශ්‍රවණාගාරයේදී පැවැත්විණ. එම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනි ස්වේන්ද්‍රිනි රොද්‍රිගෝ මහත්මිය සහභාගී වූහ.

තවද, මින්නේරිය විරු කැකුළු පෙර පාසලේ වාර්ෂික විවිධ ප්‍රසංගය ද ඉකුත් නොවැම්බර් මස 26 වන දින පැවති අතර, එම අවස්ථාවට සේවා වනිතා ජ්‍යෙෂ්ඨ සාමාජිකා ඉල්මා මජීඩ් මහත්මිය ප්‍රධානත්වය දැරුවාය.

පල්ලෙකැලේ විරු කැකුළු පෙර පාසලේ වාර්ෂික විවිධ ප්‍රසංගය ද සේවා වනිතා ජ්‍යෙෂ්ඨ සාමාජිකා ඩිලානි වික්‍රමසිංහ මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් නොවැම්බර් මස 19 වන දින පැවැත්විණ.

එමෙන්ම, මැනිංටවුන් විරු කැකුළු පෙර පාසලෙහි ඉගණුම ලබන දරු දැරියන් විසින් තම කලා කුසලතාවන් එළි දැක්වීම පිණිස පවත්වනු ලැබූ විවිධ ප්‍රසංගය ඉකුත් දෙසැම්බර් මස 27 වන දින නාරාහෙන්පිට යුද්ධ හමුදා රෝහල් ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. එම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිතයා ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානි මේජර් ජෙනරාල් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී එන්පීඑස් පිඑස්සී සමඟින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ උපසභාපතිනි මෙන්ම මැනිංටවුන් විරුකැකුළු පෙර පාසල අධීක්ෂණ භාර ජ්‍යෙෂ්ඨ සාමාජිකා ලලන්ති දොලගේ මහත්මිය සහභාගි වූහ.













# දිට්වා සුළි කුණාටුවෙන් අවතැන්වූවන් හට පරිත්‍යාග රැසක්



ඉකුත් දෙසැම්බර් මස 03 වන දින "දිට්වා" සුළි කුණාටුවෙන් පීඩාවට පත් හලාවත ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන පවුල් සඳහා වියලි සළාක, සනීපාරක්ෂක ද්‍රව්‍ය සහ පිසූ ආහාර පාර්සල් බෙදාදීමේ වැඩසටහනක් යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනි ස්වේන්ද්‍රිනි රොද්‍රිගෝ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.




අයහපත් කාලගුණික තත්වය හමුවේ අවතැන් වූ පවුල් සඳහා වියලි සළාක, පිරිසිදු කිරීමේ භාණ්ඩ, ඇඳ ඇතිරිලි සහ මුළුතැන්ගෙයි උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් මස 06 වන දින ජා ඇල, තුඩැල්ල Christ King විද්‍යාලයේදී පැවැත්විණ. මේ සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය ඇතුළු පිරිසක් සහභාගී වූහ.



ආපදා තත්වයෙන් පීඩාවට පත් පවුල්වලට සහයවීම සඳහා කමාන්ඩෝ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි සමින්දි වික්‍රමරත්න මහත්මියගේ මඟපෙන්වීම යටතේ එම රෙජිමේන්තු සේවා වනිකා ශබාව විසින් කොට්ට, ඇඳ ඇතිරිලි, තුවා සහ මෙට්ට ඇතුළු ද්‍රව්‍ය රැසක් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය වෙත භාරදෙන ලදී.



යුද්ධ හමුදා පොදු සේවා බළකා සේවා වනිතා ශාඛාව වෙත ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකරුවන් වෙතින් රුපියල් මිලියන 05කට අධික වටිනාකමකින් යුත් විෂබීජහරණය කරන උපකරණ තොගයක් ලබාදෙන ලදී. අදාළ භාණ්ඩ යුද්ධ හමුදාවේ සුභසාධක කටයුතු සඳහා යෙදවීම පිණිස එම බළකා සේවා වනිතා සභාපතිනි නයෝමිනී ද සිල්වා මහත්මිය විසින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනිය වෙත පරිත්‍යාග කරනු ලැබුවාය.



දිවයින පුරා ක්‍රියාත්මක වන ආපදා සහන සේවා කටයුතු සඳහා ශ්‍රී ලංකා සංඥා බළකාය වෙතින් ද රුපියල් 300,000.00කට අධික වටිනාකමකින් යුත් වියලි සළාක තොගයක් පරිත්‍යාග කෙරිණ. අදාළ භාණ්ඩ එම රෙජිමේන්තු සේවා වනිතා සභාපතිනි සජීවනී බණ්ඩාරනායක මහත්මිය විසින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙත පරිත්‍යාග කිරීම ඉකුත් දෙසැම්බර් මස 12 වන දින සිදුකරනු ලැබුවාය.



දිට්වා සුළි කුණාටුවෙන් පීඩාවට පත් පවුල් අතර බෙදාදීම සඳහා ඇඳුම් පැළඳුම්, වැසිකිළි උපකරණ සහ බෝතල් කළ පානීය ජලය ඇතුළු භාණ්ඩ පිරිනැමීමේ වැඩසටහනක් සඳහා ගැමුණු හේවා බළකා සේවා වනිතා ශාඛාව ද එක්විය. එහි සභාපතිනි ශිහානි අබේවර්ධන මහත්මිය විසින් ඉකුත් දෙසැම්බර් මස 12 වන දින අදාළ භාණ්ඩ යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනිය වෙත භාරදුන්නාය.

# දිට්වා සුළි කුණාටුවෙන් අවතැන්වූවන් හට පරිත්‍යාග රැසක්



දිට්වා සුළි කුණාටුවෙන් පීඩාවට පත් පවුල්වලට බෙදාදීම සඳහා University of Technology - Sydney ආයතනය විසින් කොට්ට, මෙට්ට ඇතුළු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් මස 06 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ. එම විද්‍යාලයේ නියෝජිත පිරිසක් විසින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය වෙත අදාළ පරිත්‍යාග එහිදී භාරදෙන ලදී.



"දිට්වා" සුළි කුණාටුවේ බලපෑමෙන් පීඩාවට පත් ජනතාව සඳහා වියළි සළාක බෙදාදීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සංවිධායකත්වයෙන් ඉකුත් දෙසැම්බර් මස 18 වන දින අඹතලේ, ගල්වාන, දෙල්ගහවත්ත සහ අංගොඩ යන ප්‍රදේශයන්හිදී පැවැත්විණ.

---

"දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් දිවයිනට බලපෑ අයහපත් කාලගුණික තත්වය මත ඇතිවූ ගංවතුර හා නායයෑම් හේතුවෙන් බදුල්ල, මහනුවර සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කයන්හි අවතැන් වූ ජනතාව වෙත අත්‍යාවශ්‍ය භාණ්ඩ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් මස 13 සහ 14 යන දෙදින තුළ බදුල්ල, මහනුවර සහ නුවරඑළිය යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සිදු කෙරිණ. යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනියගේ මඟපෙන්වීම යටතේ Lions Club - මෝදර මට්ටක්කුලිය වෙතින් සහ පරිත්‍යාගශීලීහු විසින් අදාළ පරිත්‍යාග ලබාදුන්හ. වියළි සලාක, පානීය ජල බෝතල්, ළමා සනීපාරක්ෂක ද්‍රව්‍ය, ඇඳුම් පැළඳුම්, කොට්ට සහ නිදන මළු යනාදී අත්‍යවශ්‍ය භාණ්ඩ රැසක් ඊට ඇතුළත් විය.



මධ්‍යම ආරක්ෂක සේනාංක මූලස්ථානය හා 111 වන පාබල බළසේනා මූලස්ථානයේ සම්බන්ධීකරණයෙන් යුතුව ගම්පොල, කුරුඳුවත්ත, ගිරාවුල්ල, අම්බලන්පිටිය සහ පහළ ගම්පාය ප්‍රදේශයන්හි අවතැන් වූ ජනතාව අතර එම ද්‍රව්‍ය බෙදාදීම සිදු කෙරිණ.

---

# පරිත්‍යාග වැඩසටහන් රැසක්





ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි සුමංගලී පතිරවිතාන මහත්මියගේ මඟපෙන්වීම මත එම බළකායෙහි රාජකාරී නියුතු සෙසුනිලයින්ගේ අධ්‍යාපනය හදාරනු ලබන ළමුන් සඳහා පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ වැඩසටහන් රැසක් ඉකුත් දෙසැම්බර් මසදී පැවැත්විණ. එම වැඩසටහන් ඉකුත් දෙසැම්බර් මස 15 වන දින සිට එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ හා ඊට අයත් ඒකකවලදී අදියර කිහිපයක් යටතේ පැවැත්විණ. එමගින් ළමුන් 2500කට අධික පිරිසකට ප්‍රතිලාභ සැලසුනු අතර, ඊට සමගාමීව සිවිල් කාර්ය මණ්ඩලය වෙත සළාක පාර්සල් ලබාදීමක් ද සිදු කෙරිණ.

# නත්තල් දින ළමා වැඩසටහනක්





පසුගිය නත්තල් දිනයේදී මහරගම අපේක්ෂා රෝහලෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන සහ දෛනිකව ප්‍රතිකාර සඳහා පැමිණෙන දරුවන් වෙනුවෙන් ළමා වැඩසටහනක් පැවත්විණ. 200ක පමණ දරුදැරියන් පිරිසක් එක් වූ එම වැඩසටහනේදී නත්තල් කරොල් ගී ගායනයක් ද පැවති අතර, එම දරුවන්ට ත්‍යාග පිරිනැමීමට ද කටයුතු කෙරිණ. ඒ සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ සේනාවිධායක මෙන්ම ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා රෙජිමේන්තු කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් කේවීඑන්පී ප්‍රේමරත්න ආර්එස්පී යූඑස්පී එන්පීඑස් පීඑස්සී සහ එම රෙජිමේන්තු සේවාවනිතා සභාපතිනි වින්ද්‍යා ප්‍රේමරත්න මහත්මිය ඇතුළු සේවා වනිතා සමාජිකාවන් ද එක් වුහ. නත්තලේ අරුත සැබෑ කරවු එම එකතුව ඊට සහභාගී වූ දරු දැරියන්ට මහත් අස්වැසිල්ලක් ගෙනදුන් අපූරු අවස්ථාවක් විය.

---

# මිහිඳු සෙත් මැදුරේ සංචාරයක්






ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි දර්ශනී යහම්පත් මහත්මියගේ ප්‍රධානත්වයෙන් එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ පිරිසක් ඉකුත් දෙසැම්බර් මස 12 වන දින මිහිඳුසෙත් මැදුරේ සංචාරයක් සිදු කළහ. එහිදී, එම නේවාසික රණවිරුවන් වෙනුවෙන් දිවා ආහාර වේලක් පිරිනැමුණු අතර, ඔවුන්ගේ රසාස්වාදය උදෙසා සංගීත වැඩසටහනක් ද පැවැත්විණ.

---

# පරිත්‍යාග වැඩසටහනක්






දිට්වා සුළි කුණාටුවෙන් පීඩාවට පත් විශේෂ බළකායේ සාමාජිකයින් සහ සිවිල් සේවක මහතුන් වෙත වියලි සළාක බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් මස 15 වන දින පැවැත්විණ. නාඋල පිහිටි විශේෂ බළකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවති මෙම වැඩසටහන සඳහා ප්‍රධාන අමුත්තිය ලෙස එම බළකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි වින්ද්‍යා වෙලේනාවැව මහත්මිය සහභාගි වූවාය.

# රත්නපුර ජේසු බිළින්දාගේ කන්‍යාරාමයේ නත්තල් වැඩසටහනක්





ගැමුණු හේවා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශිහානි අබේවර්ධන මහත්මියගේ අදහසකට අනුව එම සේවා වනිතා සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් ඉකුත් දෙසැම්බර් මස 14 වන දින රත්නපුර ජේසු බිළින්දාගේ කන්‍යාරාමයේ දරුවන් සඳහා නත්තල් දින වැඩසටහනක් සංවිධානය කරනු ලැබූහ. එහිදී, කොළඹ ශාන්ත ෆිලිප් නේරිස් දේවස්ථානයේ හෙරල් තමෙල් පියතුමන් විසින් අර්ථවත් දේශනයක් පවත්වමින් ආදරය, බෙදාගැනීම, කරුණාව සහ කෘතඥතාව වැනි වටිනාකම් අවධාරණය කරමින් නත්තලේ සැබෑ අරුත පිළිබඳව දරුවන්ට අවබෝධයක් ලබාදෙන ලදී. එම දරුවන්ගේ මානසික සුවතාවය වර්ධනය කිරීමේ අරමුණින් ගැමුණු හේවා බළකායේ හයිලන්ඩර්ස් සංගීත කණ්ඩායම විසින් කැරොල් ගී ගායනා වැඩසටහනක් ද පවත්වන ලද අතර, එය අවසානයේ ඊට සහභාගී වූ දරුවන් 67 දෙනෙකු හට රුපියල් 200,000.00 වටිනාකමකින් යුතු වතුර බෝතල් සහ පාවහන් පරිත්‍යාගයක් ද සිදු කරන ලදී.

---

# “සුළි කුණාටුවට ගසා නොගිය මිනිසත්කම”





දිට්වා සුළි කුණාටුව හේතුවෙන් විපතට පත් ජනතාව වෙනුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙතින් ඉටුවිය යුතු මානුෂීය මෙහෙවරක් වශයෙන් ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බළකා සේවා වනිතා ශාඛා සභාපතිනි ශ්‍යාමා හෙට්ටිගේ මහත්මියගේ මගපෙන්වීමෙන් එහි සාමාජිකාවෝ සමාජ සත්කාරයකට දායක වූහ. එහිදී, විවිධ ධානපති පරිත්‍යාගශීලීන්ගේ නොමසුරු මූල්‍ය දායකත්වයෙන් යුතුව විපතට පත් මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පොතුවිල ග්‍රාමසේවා වසමේ පදිංචි පවුල් වෙනුවෙන් වටිනා අත්‍යවශ්‍ය ඇඳුම් පැළඳුම්, පානීය ජල බෝතල් මෙන්ම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා අවැසි පාසල් අභ්‍යාස පොත් කට්ටල පිරිනැමිණ. ඉකුත් දෙසැම්බර් මස 19 වන දින මාදම්පේ පොතුවිල ප්‍රජා ශාලාවේදී පැවති මෙම කටයුත්තේදී පොතුවිල් ග්‍රාම නිලධාරී කාර්යාලයේ සම්බන්ධිකරණයෙන් යුතුව තෝරාගත් පවුල් 50ක් සඳහා රු:700,000.00 (ලක්ෂ හතකට) වැඩි වටිනාකමින් යුත් ප්‍රදානයන් සිදු කෙරිණ.

---



# ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය

ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ 16 වන සභාපතිනිය ලෙස යමුනා අබේකෝන් මහත්මිය ඉකුත් දෙසැම්බර් මස 29 වන දින සිට පත්ව ඇත.

# කැමිලා පාසල් දරුවන් හට සත්කාරයක්





ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බළකා සේවා වනිතා සාමාජිකාවෝ ඉකුත් දෙසැම්බර් මස 11 වන දින මත්තේගොඩ කැමිලා පාසලෙහි නේවාසික ළමුන්ගේ සුවදුක් සොයාබැලීමේ සංචාරයක නිරතවූහ. එහි සභාපතිනි ඉරෝශිනි ප්‍රනාන්දු මහත්මියගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරුණු මෙම කටයුත්තේදී එම ළමුන්ගේ දක්‍ෂතා එළි දැක්වීමේ සංගීත වැඩසටහනක් ද පැවැත්විණ. තවද, එහිදී එම දරුවන්ගේ ප්‍රයෝජනය සඳහා වියළි ආහාර, සනීපාරක්‍ෂක ද්‍රව්‍ය සහ ඖෂධ ඇතුළත් ත්‍යාග ද පිරිනැමිණ.

---

# දිවියට සවියක් වෙමින්



ඉංජිනේරු සේවා වෘත්තීය පාසලේ 35 වන සංවත්සරයට සමගාමීව සංවිධානය කෙරුණු සේවා වනිතා සුභසාධන වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් මස 03 වන දින එම වෘත්තීය පුහුණු පාසලේදී පැවැත්විණ. එහිදී, ආර්ථික වශයෙන් අභියෝගවලට ලක් වූ තෝරාගත් සොල්දාදුවන් 11 දෙනෙකු සඳහා මූල්‍යාධාර පිරිනැමිණ. ඉංජිනේරු සේවා වෘත්තීය පාසලේ සේනාවිධායක කර්නල් එස්ඩීඑන් සූරියප්පෙරුම යූඑස්පී එල්එස්සී ගේ මඟපෙන්වීම සහ අධීක්ෂණය යටතේ සංවිධානය කෙරුණු මෙම සත්කාරයට එම බළකා සේවා වනිතා ශාඛාව මඟින් මූල්‍ය දායකත්වය සැපයිණ.

---

# ගර්භිනී මාතාවන්ට සත්කාරයක්





පියයුරු පිළිකා රෝගය හඳුනා ගැනීම සබැඳිව දේශනයක් සහ ගැබ්ගෙල පිළිකා රෝගය පිළිබඳ පරීක්ෂණ ඇතුළුව මූලික වෛද්‍ය පරීක්ෂණ සිදු කිරීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් මස 13 වන දින යුද්ධ හමුදා සේවා බළකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. ඊට රෙජිමේන්තු මධ්‍යස්ථානය, 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකාය, ස්වාධීන සැපයුම් බළකාය සහ ස්වාධීන ප්‍රවාහන බළඝණයේ රාජකාරි නියුතු නිලධාරීන්ගේ සහ සෙසුනිලයන්ගේ බිරින්දෑවරු 50 දෙනෙක් සහභාගී වූහ.

# විශාල සළාක පරිත්‍යාගයක්





දිට්වා සුළි කුණාටුවෙන් නිවාස අහිමි වූ සහ අර්ධ නිවාස හානි සිදු වූ යුධෝපකරණ බළකායේ සේවයේ නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ පවුල් 21ක් සඳහා අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සහ පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් මස 07 වන දින පැවැත්විණ. මෙම අවස්ථාවට එම බළකා සේවා වනිතා ශාඛා සභාපතිනි ශිරානි නිර්මලීන් විජේකෝන් මහත්මිය ඇතුළු සාමාජිකාවෝ පිරිසක් සහභාගී වූහ.

---

# පරිත්‍යාග වැඩසටහනක්







දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ආපදාවට ලක් වූ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් සෙසුනිලයන්ගේ භාර්යාවන් අතරින් ගර්භිනී තත්වයට පත්වී සිටින මාතාවන්හට ද එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රාජකාරි කරනු ලබන සිවිල් සේවක මහතුන් 28 දෙනෙකු සඳහාද අත්‍යවශ්‍ය භාණ්ඩ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් මස 23 වන දින පැවැත්විණ. හෙරලියාවත්ත පහසුකම් සංකීර්ණ ශාලාවේදී පැවති මෙම සත්කාරයට ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු සේවා වනිතා ශාඛා සභාපතිනි කුමාරි පල්ලේකුඹුර මහත්මිය හා එම රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ජේඑස්බීඩබ්ලිව් පල්ලේකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයු පීඑස්සී ප්‍රධානත්වය දැරූහ.

---



# යුද්ධ හමුදා වෛද්‍ය බළකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස ඉරන්ති දිල්රුක්ෂි පෙරේරා මහත්මිය විසින් ඉකුත් දෙසැම්බර් මස 18 වන දින සිට පත්ව ඇත.

# අපේක්ෂාවේ පහන් ටැඹ

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ උත්තරීතර කැපවීම

"දිට්වා" හමුවේ ශ්‍රී ලංකා යුද හමුදාව යළිත් වරක් රටේ අවසන් බලාපොරොත්තුව බවට පත්විය. ඔවුන්ගේ සේවය හුදෙක් රාජකාරියක් නොව, ජීවිත අවදානම පසෙක තබා සිදු කළ මානුෂීය පූජාවකි .

අඳුරු අහස යට, මහත් ජල කඳන් මැද, තමන්ගේම පවුල් සහ දරුවන්ගේ සුරක්ෂිතභාවය ගැන මොහොතකට හෝ නොසිතා, ආපදාවට පත් ජනතාව සිය ජීවිත පූජාවෙන් බේරා ගැනීමට යුද හමුදා සාමාජිකයන් ඉදිරිපත් වූ ආකාරය සැබවින්ම ජාතියේ ප්‍රශංසාවට හේතුවකි. වසර තිහක යුද්ධය නිමාකළ ඔවුන්, දැන් මානුෂීය සේවයේ පෙරමුණ භාරගෙන ඇත.

ආපදා කළමනාකරණයේ නිරපේක්ෂ කැපවීම සහ නිර්භීතකම කියාපාමින්, මෑත කාලීන ආපදා තත්වයේදී හමුදාවේ ක්‍රියාකාරීත්වය විශ්මයජනක වූ අතර, එය ඔවුන්ගේ වෘත්තීය තත්වයට වඩා මානුෂීය ගුණය ඉස්මතු කළේය. සිය ජීවිත පූජාවෙන් ආපදාවන්ට ලක්වූවන්ගේ දිවි ගලවා ගැනීමේ මෙහෙයුම් සිදු කරමින් දියවැල් සහ වේගයෙන් ගලා යන ජල කඳන් හරහා යාත්‍රා කරමින්, කඩා වැටීමට ආසන්න නිවෙස්වල සිර වී සිටි දරුවන්, වැඩිහිටියන් සහ රෝගීන් බේරා ගැනීමට ඔවුන් කළ මෙහෙයුම් අතිශය අවදානම් සහගත විය. අපගේ රණවිරුවන්, අනාරක්ෂිත ප්‍රදේශවලින් මිනිසුන් ඉවත් කළේ තම ජීවිත ආරක්ෂා කරගැනීම සඳහා ඇතැම්විට ජීවිතාරක්ෂක උපකරණ පවා නොමැති තත්ත්වයක තම දිවි පරදුවට තබමිනි.

පළමු ප්‍රතිචාරකයාගේ කාර්භයභාරය මනාව ඉටුකරමින් කාලගුණය පිළිබඳ අනතුරු ඇඟවීම් ලැබුණු සැණින්ම, යුද හමුදා කණ්ඩායම් ආපදා අවදානම් කලාප වෙත කඩිනමින් පිටත් වෙමින්, විපතට පත් ජනතාවට පිහිට වීම සඳහා මෙන්ම ඔවුන්ට අවශ්‍ය ආහාර, ජලය සහ වෛද්‍ය පහසුකම් සැපයීමට ප්‍රථමයෙන්ම පියවර ගන්නා ලද්දේ හදිසි අවස්ථාවකදී කාලීන මැදිහත්වීම කොතරම් වැදගත් ද යන්න මැනවින් ඔප්පු කරමිනි.

රණවිරුවන්ගේ මෙම උත්තරීතර කැපවීම පිටුපස ඇති විශාලතම පරිත්‍යාගය වන්නේ ඔවුන්ගේ පෞද්ගලික ජීවිතය කැප කිරීමයි. සෑම රණවිරුවකුටම ආදරණීය පවුලක්, හා ඒ වටා එක්වූ දයාබර අඹුදරුවන් දෙමාපියන් සහ අනෙකුත් ආදරණීයන් සිටී. එහෙත්, ඒ සියලු දෙනා වෙත ඇති සෙනෙහස හදවතේ රුවා ඔවුහු සමස්ත ජාතියක දෙමාපියන් දූ දරුවන් ජීවිතය ඉල්ලා යදිද්දී ඒ වෙනුවෙන් සිය ප්‍රාණය ඇපයට තැබූහ. මෙය හුදෙක් සේවයක් නොව, අසීමිතව මාතෘභූමියට ඇති ප්‍රේමයක් නිසා හදතින්ම සිදුකළ පරිත්‍යාගයකි.

ආපදා තත්ත්වය නිමා වී දින ගණනාවක් යනතුරුත්, සහන සේවා, පිරිසිදු කිරීම් සහ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ඔවුන් දිවා රෑ නොබලා කටයුතු කරන ලද්දේ ඔවුන්ගේ අඛණ්ඩ සේවා හා අසීමිත කැපවීමේ ප්‍රතිපලය නිසාවෙනි. ඒ අනුව ආපදාවෙන් පසු, යළි රට ගොඩනැගීමට සහ අනාගතය ගොඩනැගීමේ ක්‍රියාවලියේදී ද යුද හමුදාව අත්‍යවශ්‍ය හවුල්කරුවෙකු බවට ද පත්වී ඇත.

එමෙන්ම පශ්චාත්-ආපදා සෞඛ්‍යාරක්ෂාව සම්බන්ධව ද රණවිරුවාගේ දායකත්වය අති මහත් වෙයි. රෝග පැතිරීම වැළැක්වීමට ආපදා ප්‍රදේශ පිරිසිදු කිරීම සහ විෂබීජ හරණය කිරීම වැනි කටයුතුවලදී ද ඔවුන්ගේ සහයෝගය අතිශයින්ම වැදගත් වෙයි. ඒ අනුව අප රටට ඇති වූ ආපදා තත්ත්වය හමුවේ, රණවිරුවන් තම ජීවිත අවදානම පසෙක තබා, ආදරණීය පවුලෙන් ඈත්ව, ජාතිය වෙනුවෙන් සිදුකළ සහ තවදුරටත් සිදුකරමින් සිටින අසමසම මෙහෙවර වෙනුවෙන් ශ්‍රී ලංකා ජනතාවගේ හෘදයාංගම ස්තූතිය සහ ශීර්ෂප්‍රණාම ගෞරවය නිතැතින්ම හිමි විය යුතු අතර ඔවුන්ගේ මෙම උදාර කැපවීම ජාතියේ යළි නැගී සිටීමට මහත් ශක්තියකි.






▪ එච්.එච්.ඩී.එල්. ප්‍රියංගිකා

මහජන සෞඛ්‍ය හෙද නිලධාරිනි (RN, RM,Dip in PHN,DiP in Psycological Counseling, BSC in Nursing)



# බුලත් අතින් බැඳුණු

## සිංහල- දමිළ හෘදයාංගම

# සබඳතාව

**බසින් බෙදුණ මුත් හද ගැස්මෙන් එකම කය**
**ජාතීන් දෙකක් යා කළ හරිතමය පාලමය**
**හුරුල්ලත් - වෙත්තලෙයි පාක්කුත් සෙනෙහසෙහි මය**
**අපේම ලෙයින් ලියැවුණු සොයුරු පෙමෙහි අසිරියය**

ශ්‍රී ලාංකීය ජන සමාජය තුළ සිංහල සහ දෙමළ යන ජාතීන් දෙකම එක හා සමානව ගරු කරන, සංස්කෘතික අනන්‍යතාවයේ නොමැකෙන සලකුණක් ලෙස "බුලත් අත" හැඳින්විය හැකිය. භාෂාවන් සහ ආගමික ඇදහිලිවල පවතින විවිධත්වය ඉක්මවා යමින්, බුලත් කොළය අපේ පොදු උරුමයේ "හරිත පාලමක්" ලෙස ක්‍රියා කරයි. සිංහල සංස්කෘතියේ "බුලත් හුරුල්ල" සහ දෙමළ සංස්කෘතියේ "වෙත්ට්‍රිලෙයි පාක්කු" (*Vetrilai-Paaku*) යනුවෙන් හැඳින්වෙන මෙම චාරිත්‍රය, හුදෙක් කොළයක් පිරිනැමීමක් පමණක් නොව, එය ගෞරවය, ආදරය සහ සමාව දීමේ ජීවමාන සංකේතයකි.

සිංහල සහ දෙමළ අලුත් අවුරුද්දේ සිට මරණ මංචකය දක්වා වූ මිනිස් ජීවිතයේ සෑම සන්ධිස්ථානයකදීම බුලත් පතට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. වැඩිහිටියන්ට ගරු කිරීමේදී, ආරාධනා කිරීමේදී මෙන්ම වැරදිවලට සමාව ඉල්ලීමේදී ද මෙම කුඩා කොළය තුළින් ප්‍රකාශ වන්නේ දශක ගණනාවක සිට අප බෙදාගත් එකම සමාජ සාරධර්මයන්ය.

## 01. බුලත් හුරල්ලේ ආචාර ධර්ම සහ සම්ප්‍රදායන්

### 1. පත්‍ර සංඛ්‍යාව සහ එහි අර්ථය

සම්ප්‍රදායික බුලත් හුරුල්ලක් සඳහා බුලත් කොළ 40ක් අඩංගු විය යුතුය. මෙය "බුලත් අතක්" ලෙසද හැඳින්වේ. වර්තමානයේ මෙය 20ක් දක්වා අඩු වී තිබුණද, පූර්ණ ගෞරවය දැක්වීමේදී 40ක් භාවිතා කිරීම උසස් සිරිතකි.

### 2. හුරුල්ල පිළිගන්වන නිවැරදි ඉරියව්ව

- **නැටි පැත්ත තමන් දෙසට:** බුලත් හුරුල්ල වැඩිහිටියෙකුට හෝ ගෞරවනීය පුද්ගලයෙකුට පිළිගන්වන විට, බුලත් කොළවල නැටි (*stems*) පැත්ත පිළිගන්වන පුද්ගලයා දෙසටත්, පත්‍රයේ අග කොටස ලබන්නා දෙසටත් සිටින සේ දැතින්ම අල්ලා දිය යුතුය.

- **නැමී ආචාර කිරීම:** බුලත් හුරුල්ල පිළිගන්වන අවස්ථාවේදී දණ නමා හෝ වැඳ වැටී ආචාර කිරීම මඟින් තමන් තුළ පවතින නිහතමානී බව සහ ගෞරවය විදහා දක්වයි.

### 3. "නාග පෙන" සහ විෂ ඉවත් කිරීමේ මිථ්‍යාව

බුලත් පත්‍රයේ හැඩය නාගයෙකුගේ පෙනයට සමාන බව පැවසේ. ජනප්‍රවාදයට අනුව බුලත් වැල නා ලොව සිට මිනිස් ලොවට ගෙන එන ලද්දේ නාගයෙකු විසිනි. එම නිසා, බුලත් කොළයේ නටුව සහ අග කොටස නාග විෂ සහිත යැයි විශ්වාසයක් පවතී. මේ හේතුවෙන්,

**බුලත් අත යනු හුදෙක් අපේ ආගමික හෝ සංස්කෘතික චාරිත්‍රවලට පමණක් සීමා වූ පත්‍රයක් නොවේ. එය දශක ගණනාවක අමිහිරි මතකයන් මැකී යන, වෛරය සහ ක්‍රෝධය වෙනුවට ආදරය සහ ගෞරවය දෝතින් පිදෙන ”සංහිඳියාවේ හරිතමය පාලමයි.” සිංහල අප ‘බුලත් හුරුල්ල’ දෙන විටත්, දෙමළ සොයුරන් ‘වෙත්තලෙයි පාක්කු’ පිරිනමන විටත් ඒ දෝතින්ම ප්‍රකාශ වන්නේ එකම මනුෂ්‍යත්වයේ උරුමයයි.**



- ආචාර කිරීමේදී පත්‍රයේ අග කොටස ලබන්නා දෙසට හැරවීමෙන් “විෂ ඉවත් වී සෙත් ශාන්තිය සැලසෙන” බව විශ්වාස කෙරේ.

- බුලත් විටක් සකස් කිරීමේදී පවා නටුව සහ අග කොටස කඩා ඉවත් කිරීමට දෙමළ සහ සිංහල දෙපාර්ශවයම පුරුදුව සිටිති.



### 4. සමාව ඉල්ලීමේ සංකේතය

අලුත් අවුරුදු සමයේදී බුලත් හුරුල්ලක් දීමෙන් අදහස් කරන්නේ පසුගිය වසරේ සිදුවූ වැරදි වලට සමාව ඉල්ලීමයි. මෙහිදී දෙමළ වැසියන් ‘වෙත්තිලෙයි පාක්කු’ දෙන විට සහ සිංහල වැසියන් බුලත් දෙන විට දෙපාර්ශවයම බලාපොරොත්තු වන්නේ පැරණි අමනාපකම් දුරු කර නව වසර සහෝදරත්වයෙන් ඇරඹීමයි.

### 5. ගනුදෙනු කිරීමේ මාධ්‍යය

සිංහල සහ දෙමළ චාරිත්‍රවලදී මුදල් තෑගි දීමේදී එය කෙලින්ම අතට නොදී බුලත් කොළයක් මත තබා දීම ඉතා උසස් සිරිතකි. විශේෂයෙන්ම දරුවන්ට අවුරුදු සත දීමේදී (ගනුදෙනු කිරීමේදී) මෙය අනිවාර්යයෙන්ම දක්නට ලැබේ.

### 6. සමාව ඉල්ලීමේ මාර්ග 40

අලුත් අවුරුදු සමයේදී බුලත් හුරුල්ලක් සඳහා බුලත් කොළ 40ක් භාවිතා කිරීමට බලපාන ප්‍රධානතම හේතුව ලෙස ජනප්‍රවාදයේ සඳහන් පරිදි මනුෂ්‍යයෙකු අතින් තවත් අයෙකුට අතපසුවීමකින් හෝ නොදැනුවත්ව සිදුවිය හැකි වැරදි මාර්ග 40ක් පවතී. එනම්:

- සිතුවිලි මඟින් සිදුවන වැරදි 10ක් (ඊර්ෂ්‍යාව, වෛරය)

- වචනයෙන් සිදුවන වැරදි 10ක් (කේලාම්, රළු වදන් ආදිය).

- ක්‍රියාවෙන් සිදුවන වැරදි 10ක් (කායික හිංසා ආදිය).

- නොසලකා හැරීම හෝ යුතුකම් පැහැර හැරීම මඟින් සිදුවන වැරදි 10ක්.

ඒ අනුව ඉහත ආකාරයට බුලත් කොළ 40කින් යුත් හුරුල්ලක් පිරිනැමීමෙන් සංකේතවත් කරන්නේ, ”ඉකුත් වසර තුළ මෙම මාර්ග 40න් කවර ආකාරයකින් හෝ මා අතින් ඔබට වරදක් සිදුවූයේ නම්, ඒ සියල්ලටම මට සමාව ලබා දෙන්න” යන්නයි.

මෙය දෙදෙනෙකු අතර පවතින සබඳතාවය නැවුම්ව ආරම්භ කරන ”සංස්කෘතික සමාව දීමක්” ලෙස හැඳින්විය හැකිය.

අවසාන වශයෙන්, බුලත් යනු හුදෙක් අපේ ආගමික හෝ සංස්කෘතික චාරිත්‍රවලට පමණක් සීමා වූ පත්‍රයක් නොවේ. එය දශක ගණනාවක අමිහිරි මතකයන් මැකී යන, වෛරය සහ ක්‍රෝධය වෙනුවට ආදරය සහ ගෞරවය දෝතින් යා කෙරෙන “සංහිඳියාවේ හරිතමය සංකේතයයි”. සිංහල අප “බුලත් හුරුල්ල” පුදන විටත්, දෙමළ සොයුරන් ‘වෙත්තලෙයි පාක්කු” පිරිනමන විටත් ඒ දෝතින්ම ප්‍රකාශ වන්නේ එකම මනුෂ්‍යත්වයේ උරුමයයි.



■ ලුතිනන් කර්නල්

**එම්අයිඑස් චන්ද්‍රකුමාර**
**යූඑස්පී පීඑස්සී අයිජී**

ශ්‍රීලකාහ

# මිනිසුන් සේ සිතමු!



**මිනිසා සුවඳයි මලසේ**
**නුවණින් එළියයි හිරුසේ**

සුනිල් එදිරිසිංහයන් තම මිහිරිවූත් රසවත්වූත් කටහඬින් ගැයුවේ මිනිසුන් ලෙස ලොව දිවි ඇරඹූ අප සියලු දෙනාටයි. තවත් මිනිසෙකු ගැයූ ඒ පද වැල් ලියන්නට ඇත්තේද තවත් මිනිසෙකු විසිනි. මිනිසුන් ලෙස මේ මිහිමත ජනිත වූ දා පටන් අප එකිනෙකා වෙනුවෙන් ජීවත් වියයුතු යැයි පැවසුවොත් ඔබ එය පිළිගන්නේ ද? "මිනිසාගේ පරම යුතුකම මිනිසාට සේවය කිරීමයි" යනුවෙන් එදා එස්ඩබ්ලිව්ආර්ඩී බණ්ඩාරණායක ශ්‍රීමතාණන් පැවසුවේ ද ලොව දිනන්නට එය ඉමහත් රුකුලක් වන බැවිනි. එකිනෙකා කෙරෙහි වූ අසීමිත වූ ගුණධර්ම වලින් පූර්ණ වෙමින් මනුසත් ගුණ වනමින් ලොව ගොඩනගන්නට පෙරමං තැනිය යුත්තේ මිනිසුන් වන අප විසිනි. සමාජයේ කුඩාම ඒකකය වන පවුල තුළ ඇරඹෙන ජීවිතය මේ දිවි ගමන නිමා වන තෙක්ම මනුසත්බව නම් වූ උතුම් වටිනාකමින් පුරවාලිය යුතුය. එදා තිස් වසරක කුරිරු වූ යුධ සටන් බීමේදී මෙන්ම අදටත් අප "මානූෂීය හමුදාව" ලෙස නිර්වචනය කරන්නේ යුද්ධ හමුදාව ලෙස අප මානූෂීය වූ බැඳීම් වලින් පිරිපුන් පිරිසක් බැවිනි. රටේ සියළු ආපදා තත්වයන් හිදී තමන් ගැන නොසිතා තවත් මිනිසෙකුට අතදුන් ඒ උදාර මෙහෙයුම් එදිනෙදා ජීවිතයේද නිතැතින් අප ක්‍රියාත්මක කළ යුතුය. ඉතිං අපි අරඹමු ඒ කතාව මෙලෙසින්....

**ජීවිතේ, ඔබට වෙනවට අකමැති දේ තවකෙකුට සිදුවුවොත්**

අපි සිතන පතන සෑම දෙයක්ම ඒ අයුරින්ම සිදු වෙනවානම් කොපමණ හොඳ දැයි ඔබට සිතෙනවා ඇති. එහෙත් එය එසේ නොවේ. විවිධ වූ හැල හැප්පීම් මත ගෙවන ජීවිතය දුක හා සතුට සමබරව අතපසුවීම්, සිත් තැවීම්, අමනාපකම්වලින් යුතුව නිමව යනු ඇත. ඉතිං එදිනෙදා ජීවිතයේ හමුවන සෑම කෙනෙකුම පාහේ එලෙස විවිධ වූ අවස්ථාවන් පසුකරමින් සිටී. අපි නොදැන නොසිතා සිදු වන විවිධ අතපසුවීම් තුළින් ජීවිත හානි පවා සිදු විය හැකිය. ඒ නිසාම තවත් අයෙකුගේ සිත් රිදවීමකට ලක් නොකිරීම සිතට ගත යුතුය. ඔබේ සිත රිදුමට ලක් වුවහොත් ලැබෙන දුක හා වේදනාව තවත් අයෙකුට ද එලෙසමය. එබැවින් මිනිසුන් ගැන මිනිසුන් සේ සිතන්නට අප ඉටා ගත යුතුය.

**"මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා" - සතර බ්‍රහ්ම විහරණ-**

උක්ත දක්වා ඇති සිව් බඹ විහරණ තුළින් බුදු රදුන් දෙසූ සියලු දනන්ගේ සුවපත් වීම සිහිපත් කරනු ලබයි. මෛත්‍රිය, කරුණාව, මෘදු බවකින් යුතුව කටයුතු කිරීම, අන් අය කෙරෙහි ඊර්ශ්‍යාවකින්, ක්‍රෝධයකින් හා වෛරයකින් තොර වීම පිළිබඳ විස්තර කෙරෙමින් දැක්වෙන සතර බ්‍රහ්ම විහරණයන් තුළින් ද එකිනෙකා කෙරෙහි යහපත් අයුරින් දිවි ගෙවීමට මං පාදා දෙනු ලබයි. මිනිසුන් ලෙස අන්‍යයන් කෙරෙහි වූ සහ සම්බන්ධතාවයකින් කටයුතු කිරීමට ද තව කෙනෙකුගේ සතුටක් වෙමින් දිවි ගෙවීමට ද ඊට ඕනෑම ගැටලුවකදී ඊට මුහුණදීට ඇති හැකියාව ද වර්ධනය කරනු ලබයි. ඉවසීම, පරාර්ථකාමීත්වය, නිහතමානීත්වය, අත්හැරීම වැනි ජීවිතයට හරවත් වන්නාවූ මානව ගුණධර්මයන් ද මෙයින් විවරණය කරනු ලබයි. මේ සියල්ලම තුළින් අපට පැහැදිලි කරනු ලබන්නේ මිනිසුන් ලෙස මිනිසුන් ගැන මිනිසුන් සේ සිතිය යුතු අයුරුයි.

**"මා ඔබට ප්‍රේම කලාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න"**
**- ශුද්ධවූ බයිබලය -**

ශුද්ධවූ බයිබලයේ එක් පරිච්ඡේදයක සඳහන් පාඨයක් ඉහතින් දක්වා ඇත. තවකෙකුට දක්වන්නාවූ ආදරය තුළ නව ලොවක් මවාලිය හැකිය. ලොව සියලු දනන්හට එකිනෙකා කෙරෙහි ආදරයෙන් යුතුව දිවිගෙවීම කොන්දේසි විරහිත වූ දහමක් බව මතක් කළ යුතුමය. අප තුළ සාමකාමී වූ ජීවන වටපිටාවක් නිර්මාණය කර ගන්නට එකිනෙකා කෙරෙහි ආදරයකින්, දයාවකින් හා නිම කළ නොහැකි කරුණාවකින් යුතුව කටයුතු කළ යුතු වෙමු. අනෙකාගේ සැපේදී මෙන්ම දුකේදී ද නොවෙනස්ව සිටීම උතුම් මිනිස් වටිනාකමකි. ඔබ මම මෙන්ම අප එකිනෙනාගේ ජීවිත ගමන එක හා සමානය. ඉතිං ඒ සෑම අවස්ථාවකදීම අනෙකා තුළින් තමන් දකින්නට අප ඉටා ගතයුතු වෙමු.

මෙලොව වසන සියලු දනන් එකිනෙකාගේ අදහස් හා මතිමතාන්තරානුකූලව දහමකට අනුව කටයුතු කරනු ලබයි. ලොව පවතින අන් රටවල් මෙන් නොව, ජාතීන් වශයෙන් ද ආගම් වශයෙන් ද විවිධත්වයක් ශ්‍රී ලංකාවාසීන් තුළ පවතින බව සැබෑවකි. එහෙත්, ඒ ශාස්තෘවරුන් පැවසූ දහම අප එලෙසින්ම අනුගමනය කරන්නේ ද? ඇත්තෙන්ම ඒ උතුම් දහම ඒ අයුරින්ම අනුගමනය කළේ නම් මේ ලොව කොපමණ සුන්දර වනු ඇත් ද? යම් ජාතියකට, ආගමකට උරුමකම් කියන අපි තමන්ගේම දහම තුළ යහපතට පමණක් යොමු විය යුතුය. ඉතිං සෑම දහමකින්ම උගන්වනු ලබන යහපත අප එකිනෙකාගේ ජීවිත තුළින් විදහාලන්නට පියවර තබමු. මිනිසුන් ගැන මිනිසුන් සේ සිතන්නට මා ගෙන ආ එකදු වදනක් හෝ ඔබට මෙන්ම තවකෙකුට වටිනාකමක් ගෙන දේ යැයි සිතමි!



■ **කාසෙ රෙපිනෝල්ඩ්**
**පර්යේෂණ සංකල්ප හා මූලධර්ම අධ්‍යක්ෂ මණ්ඩලය - යුහමු**

# සෙබළ සිතකට කවියකින්



සෙබළ සිතකට කවියකින් දෙවැනි ලිපියට මෙවර මා තෝරාගත්තේ ඉන්දික ගුණවර්ධන කවියා විසින් රචනා කල කවියක්.. වචනයකට කළහැකිදේ බොහොමයි. ආදරණීයව හදවතක් සනසන්නට සෙනෙහෙබර වචනවලට හැකිවෙනවා සේම, ඕනෑම මොහොතක හදවත කඩාබිඳ දමා විනාශ කිරීමට ද වචනවලට හැකියි. ඒ පූර්වීකාව හද කොනක තියාගෙනම කවියට ප්‍රවිශ්ට වෙමු.

**මන් උදේ නැගිටිනකොට**
**ඈ වැටී සිටියා ලේ ගොඩක**
**හැමතැනම ලේ ගලන මරණීය තුවාල..**
**බැලුවාම වටපිට වැටී තිබුනා තැන තැන**
**පෙරදින මා දමා ගැසූ**
**අතිබිහිසුණු වචන..**

බොහෝවිට අපි රිදවන්න උත්සාහ කරන්නෙම, නැතිනම් අපේ වචනවලින් වැඩිපුරම රිදවාගන්නේම අපි වැඩියෙන්ම ආදරේ කරන අය සහ අපිට වැඩියෙන්ම ආදරේ කරන අයමයි. පුද්ගලික ජීවිතේ වගේම වෘත්තීය ජීවිතයේදිත් වචනවලින් අපි අපේ ආදරණීයන්ව කොතරම් රිදවා ඇත් ද? ඇතැම්විට ඔබ වචන යොදාගත්තේ ද හිතාමතා නොවුනත් ඉන් සිදුවන හානිය දැනෙන්නේ අපේක්ෂා නොකළ විනාශයක් සිදු වූ පසුවයි.

මොහොතක් මා මෙම කවියේ වචන ඔස්සේ ඔබගේ සිත රැගෙන යන්නේ මාසයකට පසුව නිවාඩු ලබා නිවසට පැමිණ සිටින ඔබ වෙතටයි. සිතන්න, ඔබගේ ආදරණීය බිරිඳ, මව, පෙම්වතිය, සහෝදරිය, දියණිය, මේ කවුරුන් හෝ ලේ විලක් මැද බිම වැටී ඉන්න මොහොතක්. ඇයගේ හදවත පසාරු කරගෙන ගොස් ඇති දරුණු තුවාල සමූහයක්. නමුත්, ඒ සමඟම ඔබට පෙනෙනව මොහොතකට පෙර ඔබ පාවිච්චි කළ වචන, උල්කටු මෙන් හැඩය ගෙන තැන තැන වැටී ඇති බව. ඉතින් තවදුරටත් ඔබට ආදරය කළ ඇය ඔබ ළඟ හිඳී ද? ඇය ඔබට ආදරය කළ යුතු ද? එතරම් හානියක් කළ පසුවත් ඇයට තවදුරටත් විස්වාසයෙන් ඔබ සමඟ ජීවත් විය හැකි ද? අවසානයේ ඇයගේ තුවාලයට හේතුව ඔබම යැයි ඔබටම වැටහුන විට ඔබට ඔබ ගැන ඇතිවන හැඟීම කිනම් වේද?

ඉතින් ආදරණීය හමුදා සාමාජිකයිනි, ඔබේ වචනවලින් ඔබේ ආදරණීයන්ට තුවාල සිදුවෙන බව ඔබට නොපෙනේවි. නමුත්, ඔවුන්ගේ හදවත මියගොස් බව ඔබට ඉතා ඉක්මනින්ම දැනේවී. පුද්ගලික ජීවිතය තුළ පමණක්ම නොවේ, මෙය රාජකාරී ජීවිතයට පොදු ධර්මතාවයක්. ඔබත් සමඟ රාජකාරී කරන, ජ්‍යෙෂ්ඨයන්, කනිෂ්ඨයින් හෝ සමකාලීනයන් ඔබගේ වචන නිසා අපහසුතාවයනට පත් වුණහොත් ඔවුන්ට පෙර ලෙසටම ඔබ සමඟ රාජකාරී කිරීමට හැකිවේ ද? ඔවුන්ගෙන් කෙනෙකුගේ වාග් ප්‍රහාරයෙන් ඔබ හදවත තුවාල වුණහොත් ඔබට ඔහු සමඟ රාජකාරී කිරිමට කොතරම් අපහසු ද?

ආදරණීය හමුදා සාමාජිකයිනි, ඉතින් ඉතා පරෙස්සමෙන් පාවිච්චි කරන්න, අතිබිහිසුණු වචන...



■ **මේජර් එම්ඊඑල් ගුණවර්ධන ශ්‍රීලකාහ**



# දිවයිනටම නුවණ බෙදන දැනුම සාගරය

# කොළඹ මහජන පුස්තකාලය

පොත පතට කැමති අය දන්න කියන තැනක් ගැන අද අපි කතා කරමු. කොළඹ නගරය මැද තියෙන ඉතා අලංකාර උද්‍යානයක් වන විහාරමහා දේවි උද්‍යානයට සීමා වී පවතින මෙම සුවිශේෂී ස්ථානය අන් කිසිවක් නොව කොළඹ මහජන පුස්තකාලයයි. සියලුම ආකාරයේ පුස්තකාල සේවා, ජංගම පුස්තකාල සේවා, ශ්‍රවණාගාර පහසුකම්, නවීන කියවීම් ශාලා මෙන්ම ආපනශාලා සහ අනෙකුත් සියලුම පහසුකම් විශාල ප්‍රමාණයක් පවතින ශ්‍රී ලංකාවේ එකම පුස්තකාලය ලෙස කොළඹ මහජන පුස්තකාලය නම් කරන්න පුළුවන්.

කලකට පෙර පටන් මෙම පුස්තකාලයේ සාමාජිකත්වය ගැනීමට නම් කොළඹ පදිංචිකරුවෙකු විය යුතුයැයි මතයක් තිබුණා. නමුත්, කොළඹ නගර සභාව මඟින් ක්‍රියාත්මක වන මෙම පුස්තකාලයේ සාමාජිකත්වය ශ්‍රී ලංකාවේ ඕනෑම පුරවැසියෙකුට වයස් භේදයකින් තොරව ලබාගත හැකි අතර, විදේශිකයෙකුට වුවත් පොත්පත් පරිශීලනයට අවසර පත්‍රයක් පහසුවෙන් ලබාගැනීමේ හැකියාව මේ පුස්කතාලය මඟින් සකස්කර දීලා තියෙනවා.

කොළඹ මහජන පුස්තකාලයේ ආරම්භය 1925 දක්වා ඈතට දිවයනවා. ආරම්භයේ දී ස්ථිර ගොඩනැගිල්ලක් හෝ කිසිදු පහසුකමක් නොතිබූ නිසා මෙම පුස්තකාලය ආරම්භ කරන්නේ කොළඹ නගරාධිපති නිල නිවස වන "සිරි නිවස" තුළයි. පුස්තකාලය ආරම්භ කළ මුල් වකවානුවේ දී බැහැරදීමේ අංශයක්, විමර්ශන අංශයක්, කියවීමේ ශාලාවක් හා පුවත්පත් අංශයක් පුස්තකාලයට ඇතුළත්ව තිබූණා. පුස්තකාලයේ පළමු ප්‍රධාන පුස්තකාලාධිපතිවරයා ලෙස ලන්ඩන් විශ්වවිද්‍යාලයේ පුස්තකාල විද්‍යාව සම්බන්ධයෙන් උපාධිදාරියෙකු වූ එස්සී බ්ලොක් විසින් වර්ෂ 1925 සිට 1949 දක්වා එම තනතුරේ සේවය කර තිබෙනවා.

ආරම්භයේ සිට මේ දක්වා එහි ප්‍රධාන පුස්තකාලාධිපතිවරුන් සය දෙනෙකු සේවය කර ඇති අතර, වර්තමාන ප්‍රධාන පුස්තකාලාධිපතිනිය වන වරුණි ගඟබඩආරච්චි මහත්මිය විසින් සත්වැනි පුස්තකාලාධිපතිනිය ලෙස කටයුතු කරනු ලබයි. පුස්තකාලය ආරම්භ කර දශක හයක් පමණ ගෙවී ගිය තැන එය මේ වනවිට පවතින ස්ථානයට රැගෙනවිත් තිබේ. සිරි නිවසේ ඉඩකඩ සීමාවීම සහ පුස්තකාල සාමාජිකයන් ප්‍රමාණය ඉහළ යාමත් නිසා අවශ්‍ය ගුණාත්මක සේවය ලබාදීමේ අරමුණින්, ඊ්ෂ්වරී කොරයා ප්‍රධාන පුස්තකාලාධිපති ධූරය දැරූ සමයේ, එනම් 1982 වසරේ දී විහාරමහාදේවී උද්‍යානයේ කොටසක වර්තමාන ගොඩනැගිලි ඉදිකර පුස්තකාලය නැවත පිහිටුවා තිබෙනවා.

## ඔබේ දැනුම උදෙසා අංශ ගණනාවක්

කොළඹ මහජන පුස්තකාලයේ ශාඛා කිහිපයක් ක්‍රියාත්මක වන අතර ඒවා කිරුළපන, වැල්ලවත්ත, හෙන්රි පේද්‍රිස් ළමා උද්‍යානය අසල, බොරැල්ල එලියට් පෙදෙස, වනාතමුල්ල, කොටහේන, මට්ටක්කුලිය, බොනවිස්ටා, සුචරිත මාවත හා කෙත්තාරාම යන ප්‍රදේශවල පිහිටලා තියෙනවා. මීට අමතරව පාසල් සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා බොරැල්ලේ කියවීම් ශාලාවක් ද පවත්වගෙන යනවා.

ශාඛා පුස්තකාලවලට එහා යමින් ජංගම පුස්තකාල සේවයක් ද කොළඹ මහජන පුස්තකාලය මගින් ක්‍රියාත්මක වීම සුවිශේෂී කරුණක්. 1970 දශකයේදී පමණ මේ ජංගම පුස්තකාල සේවය ආරම්භ කරලා තියෙන්නේ. නිශ්චිත කාල සටහනකට අනුව කොළඹ 1 සිට 15 දක්වා ප්‍රදේශවලට මේ සේවා ලබාදීමට කොළඹ පුස්තකාලය මගින් පියවර ගෙන තිබෙනවා.

පැල්පත්වාසී අඩුආදායම්ලාභී දරුවන්ගේ කියවීම වර්ධනය කිරීම සඳහා ද UNICEF හා මහජන පුස්තකාලය එක්ව පොත් පෙට්ටි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක අතර, එය ද ජංගම පුස්තකාල සේවාව ලෙස පවත්වාගෙන යනු ලබන සේවාවක් ලෙස හැඳින්විය හැකිය.

## කොළඹ මහජන පුස්තකාලයෙන් ඔබට ලබාගත හැකි සේවාවන් මොනවාද?

මෙහි පොත් අංශයේ විශාල පොත් එකතුවක් ඇති අතර, ආසන්න වශයෙන් පොත් ගණන 150,000ක් පමණ වන බව ද, ඊට අමතරව සම්පූර්ණ පුස්තකාලයේම පොත් සහ මූලාශ්‍ර 450,000ක් ඇති බවට කරුණු සඳහන් වෙයි. පුස්තකාලයේ සාමාජිකත්වය ලබාගත් අය සඳහා බැහැරදෙන අංශයෙන් එකවර පොත් හතරක් ලබාගත අතර, ඒවා නැවත ලබාදීම සඳහා මාසයක කාලයක් ලබාගත හැකිය.

ඊට අමතරව මෙහි ළමා අංශයක් ක්‍රියාත්මක වන අතර එහි ද විශාල පොත් එකතුවක් තිබේ. දරුවන්ට එහි සිටම පොත් කියවීමේ පහසුකම් ද සලසා තිබීම සුවිශේෂී කරුණකි. පුවත්පත් අංශයක් හා වාර සඟරා අංශයක් වෙන වෙනම මෙම පුස්තකාලය තුළ පිහිටා තිබේ. මීට අමතරව, විශේෂ විමර්ශන අංශයක් සහ විමර්ශන අංශයක් ක්‍රියාත්මක වන අතර, ඒවා පුස්තකාල නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ පාවිච්චි කිරීමට හැකිය. විමර්ශන අංශයන් තුළ පුස්කොළ පොත් එකතුවක් සහ රොබට් නොක්ස් විසින් ඔහුගේ අත් අකුරින් ලියූ පොතක් ද පවතින බව සඳහන් වෙයි.

එමෙන්ම ඒ තුළ යටත් විජිත සමයේ ලියැවුනු බොහෝ පොත් පත් සහ රාජකාරී වාර්තා ද සුරක්ෂිතව මෙම පුස්තකාලය තුළ තිබේ. කොරියානු සමූහාණ්ඩුවේ තානාපති කාර්යාලයය හා වියට්නාම් තානාපති කාර්යාලයය විසින් එම රටවලට අදාළ පොත් එකතුන් දෙකක් වෙන වෙනම පුස්තකාලය තුළ පවත්වාගෙන යන අතර ඒවා අධ්‍යයනය කිරීමේ අවස්ථාව ද පුස්තකාල සාමාජිකයන් හට හිමි වේ.

## සාමාජිකත්වය ලබාගැනීම ඇත්තටම අපහසු ද?

කොළඹ මහ නගර සීමාවේ පදිංචි වැඩිහිටි සාමාජිකයෙකුට, එම නගර සීමාවේ පදිංචි ඇපකරුවෙක් සමඟ රුපියල් 470ක් ගෙවා සාමාජිකත්වය ලබාගත හැකිය. කොළඹ පදිංචි නොවුවත් එම නගර සීමාවේ රැකියාවක නියුතු හෝ අධ්‍යාපනය ලබන අයෙකුට ද කොළඹ මහ නගර සභා සීමාවේ පදිංචි ඇපකරුවෙකු සමඟ රුපියල් 620ක මුදලක් ගෙවා සාමාජිකත්වය ලබාගැනීමට හැකිය. නගර සභා සීමාවේ කිසිදු සම්බන්ධයක් නොමැති අයෙකුට සාමාජිකත්වය ලබාගැනීමේ මුදල රුපියල් 820කි. දැනට වසර පහකට පමණ පෙර ඒ සඳහා විසඳුමක් පුස්තකාල පරිපාලනයෙන් ලබා දී තිබෙන අතර එහි දී ඇපකරුවෙකු ඉදිරිපත් කිරීමට අපහසු අපේක්ෂකයන් හට නැවත ගෙවනු ලබන රුපියල් 2000ක තැන්පතුවක් තබා ඉහත සඳහන් කළ පුස්තකාල ගාස්තු ගෙවා සාමාජිකත්වය ඉතා සුළු වේලාවක් තුළ ලබාගත හැකිය. මෙහි සාමාජිකත්වය වසර දෙකකට වරක් යාවත්කාලීන කළ යුතුය. මීට අමතරව විදේශිකයන්ට සහ අවශ්‍ය අනෙක් අයට රුපියල් 250 මුදලක් ගෙවා වසරක කාලයකට අවසර පතක් ලබා ගැනීමේ හැකියාව ද පවතියි. එම අවසරපතට බැහැරදෙන අංශය භාවිත පමණක් භාවිත කිරීමට නොහැකි අතර, ඇපකරුවෙකු ද අවශ්‍ය නොවේ.

## ජංගම දුරකතනයෙන් හෝ පරිගණකයෙන් පුස්තකාලය පාවිච්චි කරන්න පුළුවන්ද?

වර්තමානය වන විට පුස්තකාලය පරිගණක පද්ධතියක් හරහා ක්‍රියාත්මක වන නිසා සාමාජිකත්වය ලබා ගැනීම, පොත් භාරදීම සහ ලබා ගැනීම, දඩ ගෙවීම අඩු කාලයකින් කරගත හැකිය. පරිගණක පද්ධතිය පිහිටුවීමට ප්‍රථම එක් පොතක් භාරදීමට මිනිත්තු එකහමාරක් පමණ ගත වූ බවත් වර්තමානය වනවිට එය තත්පර දෙකක් පමණ වන තෙක් සීමා වී ඇත. තවද, එම පරිගණක පද්ධතිය හරහා සෑම සාමාජිකයෙකුටම පුස්තකාල ගිණුමක් හිමි වේ. මහජන පුස්තකාලය වෙනුවෙන් නිර්මාණය වෙච්ච අන්තර්ජාල ගිණුමට සම්බන්ධ වී පුස්තකාල නාමාවලිය පරීක්ෂා කරන්න පාඨකයන්ට පුළුවන්. ඒ වගේම ඒ පොත් ඔවුන්ට අවශ්‍ය නම් රඳවන්නත් පුළුවන්. තමන්ගෙ පොත් ලබාගත් ඉතිහාසය පරීක්ෂා කරන්න වගේ මෙතෙක් විශ්වවිද්‍යාල පුස්තකාලවල ලබාදී තිබුණ පහසුකම් දැන් ඕනෑ කෙනෙකුට කොළඹ මහජන පුස්තකාලයෙනුත් ලබාගන්න පුළුවන්.

## සැමට නුවණ බෙදන දැනුම් යාත්‍රාව

පුස්තකාලයකින් සාම්ප්‍රදායිකව ලැබෙන ඉහත සඳහන් කළ පහසුකම්වලට අමතරව නොමිලේ ක්‍රියාත්මක වන වැඩසටහන් ගණනාවක්ම මේ පුස්තකාලය හරහා ක්‍රියාත්මක වෙනවා. එයින් එක් වැඩසටහනක් වන්නේ වැඩිහිටියන්ගේ පරිගණක සාක්ෂරතාව වැඩිදියුණු කිරීමට පවත්වනු ලබන පාඨමාලාව. ඊට අමතරව පාඨකයන් සමඟ පවත්වනු ලබන සාහිත්‍ය සංවාද ද තිබේ. තවද, පුස්තකාලයේ ළමා අංශය මගින් නොමිලේ වැඩසටහන් ගණනාවක්ම මේ වනවිට ක්‍රියාත්මක වෙනවා. ඉංග්‍රීසි භාෂාව වැඩිදියුණු කරන ප්‍රායෝගික වැඩසටහන්, පරිගණක භාෂා ඉගෙනුම් වැඩසටහන් (Computer Language) සහ නව නිපැයුම් සඳහා දරුවන් උනන්දු කරන වැඩසටහනක් ද ළමා පුස්තකාල අංශයෙන් ක්‍රියාත්මක වෙනවා.

නො. 15, සර් මාර්කස් මාවත, කොළඹ 07 කියන ස්ථානයේ මේ මහජන පුස්තකාලය පිහිටා තියෙනවා. ඒ වගේම පුස්තකාල සාමාජිකත්වය ලබාගැනීම සහ තවත් කරුණු බොහෝමයක් ඔයාට 011 2695156 කියන දුරකථන අංකය ඇමතීමෙන් දැනගන්න පුළුවන්. ඊට අමතරව අන්තර්ජාලයෙනුත් ඔයාට කොළඹ මහජන පුස්තකාලයත් එක්ක සම්බන්ධ වෙන්නි පුළුවන්.




■ කෝප්‍රල්
**කුමාරසිංහ එම්ජීඑම්**
11 ඉසේරෙ



# නිල ඇඳුමට යටින් ගැහෙන හදවත

## ව්‍යසනයකදී සෙබළාගේ මානුෂීය මෙහෙවර සහ මනෝවිද්‍යාත්මක ප්‍රථමාධාර

ශ්‍රී ලංකාව භූගෝලීය වශයෙන් ගංවතුර, නායයෑම් සහ සුළි කුණාටු වැනි ස්වභාවික විපත්වලට මුහුණ දෙන රටකි. එවැනි සෑම අවස්ථාවකදීම සිවිල් ජනතාවගේ ජීවිත සහ දේපළ ආරක්ෂා කරමින් පෙරමුණ ගන්නේ ශ්‍රී ලංකා යුද හමුදාවයි. ව්‍යසනයකදී භෞතික සහන සැලසීම මෙන්ම, විපතට පත් වූවන්ගේ සහ සහන සේවා සපයන්නන්ගේ "මානසික සුවතාවය" රැක ගැනීම මෙහෙයුමක සාර්ථකත්වයට අත්‍යවශ්‍ය වේ. (Mental Well-being)

### 1. සිවිල් වැසියන් සඳහා මනෝවිද්‍යාත්මක ප්‍රථමාධාර (Psychological First Aid - PFA)

ව්‍යසනයකදී තැතිගැන්මට ලක් වූ සිවිල් වැසියෙකුට මුලින්ම හමුවන රජයේ නියෝජිතයා බොහෝ විට හමුදා සෙබළෙකි. එහිදී ලබා දෙන මනෝවිද්‍යාත්මක ප්‍රථමාධාර යනු උපදේශනයක් නොව, මානුෂීය සහ ප්‍රායෝගික සහායකි.

**සවන් දීම (Listen)** - විපතට පත් වූවන් පවසන දේට බාධා නොකර සවන් දීම මගින් ඔවුන්ගේ කම්පනය අවම කළ හැකිය.

**සම්බන්ධ කිරීම (Link)** - ඔවුන්ට අවශ්‍ය මූලික අවශ්‍යතා (ආහාර, වෛද්‍ය පහසුකම්) සහ ඔවුන්ගේ පවුලේ අය සමඟ සම්බන්ධ වීමට සහාය වීම.

**ආරක්ෂාව තහවුරු කිරීම** - ඔවුන් දැන් සිටින්නේ ආරක්ෂිතව බව ඒත්තු ගැන්වීම හරහා මානසික ආතතිය අඩු කළ හැකිය.

### 2. සහන සේවා කණ්ඩායම් සඳහා ආතති කළමනාකරණය

අඛණ්ඩව මෙහෙයුම් වල නිරත වන සෙබළුන් "ද්විතීයික කම්පනයට" (Secondary Trauma) ලක් විය හැකිය. තමන්ගේ ජීවිත අවදානම සහ අන් අයගේ වේදනාව දැකීම නිසා ඇතිවන මානසික පීඩනය කළමනාකරණය කර ගැනීමට පියවර ගැනීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා තම සීමාවන් හඳුනා ගැනීමත්, මෙහෙයුමෙන් පසු තම අත්දැකීම් සහ හැඟීම් සගයන් සමඟ බෙදා ගැනීමත් (Debriefing) ඉතා වැදගත්ය.

### 3. නිල ඇඳුමට යටින් ස්පන්දනය වන මිනිස් හදවත

ව්‍යසනයක් සිදුවූ සැණින් ඕනෑම අයෙකුගේ නෙත ගැටෙන්නේ තෙතබරිත වූ නිල ඇඳුමකින්, මඩ තැවරුණු දෑතින් දිවි පරදුවට තබා මෙහෙයුම්වල නිරත වන යුද හමුදා සෙබළාය. ඔහු යන්ත්‍රයක් නොව, පණ ගැහෙන හදවතක් ඇති සංවේදී මිනිසෙකි.

**සෙබළා මුහුණ දෙන අභියෝග සහ කැපකිරීම:**

තම පවුලේ ආරක්ෂාව පසෙකලා: ගංවතුරක් පවතින විට තම නිවසේ අය පීඩාවට පත්ව සිටියදී පවා, රටේ පුරවැසියන් වෙනුවෙන් රාජකාරියට වාර්තා කිරීමට ඔහු බැඳී සිටී.

**කායික සහ මානසික විඩාව:** පැය ගණනාවක් නිදි වර්ජිතව, ආහාරයක් නොමැතිව, අධික වර්ෂාවේ සහ මඩේ එරෙමින් ඔහු සිදු කරන කැපකිරීම වචනයට නැගිය නොහැක.

**සදාචාරාත්මක අර්බුද:** සීමිත සම්පත් යටතේ බේරාගත යුත්තේ කාවද යන තීරණය ගැනීමේදී ඔහු දැඩි මානසික ආතතියකට ලක්වේ.

**සෙබළාද මනුෂ්‍යයෙකි**

සමාජය බොහෝ විට සෙබළා දෙස බලන්නේ ඕනෑම බරක් දරාගත හැකි "යකඩ මිනිසෙකු" ලෙස වුවත්, ඔහු ද බිය, කනගාටුව සහ කම්පනය අත්විඳියි. මියගිය කුඩා දරුවෙකුගේ සිරුරක් වඩාගෙන එන සෙබළෙකුගේ සිත තුළ ඇතිවන කම්පනය ඔහුගේ ජීවිත කාලය පුරාම පවතින්නකි. මෙහෙයුම් නිමවී බැරැක්කයට ගිය පසු ඔහුට ද අවශ්‍ය වන්නේ ආදරය, ඇගයීම සහ මානසික සහනයයි.

### 4. වගකීම් සහගත පුරවැසිභාවය

සෙබළුන් ඔබ වෙනුවෙන් කැපවන විට, සිවිල් වැසියන් ලෙස අපට කළ හැකි දේ බොහෝය:

**උපදෙස් පිළිපැදීම:** හමුදා කණ්ඩායම් ලබා දෙන ආරක්ෂක උපදෙස්වලට ගරු කිරීම සහ අනවශ්‍ය ලෙස අවදානම් ස්ථානවලට නොයෑම.

**සහයෝගීතාවය:** සෙබළුන්ට අවශ්‍ය ප්‍රවාහන, ආහාර හෝ මූලික තොරතුරු ලබා දී ඔවුන්ගේ කාර්යය පහසු කිරීම.

**මානුෂීය සැලකිල්ල:** රාජකාරියේ නිරත සෙබළෙකුට වචනයකින් හෝ සංග්‍රහ කිරීමෙන් ඔවුන්ගේ මානසික පීඩනය අවම කළ හැකිය.

**ව්‍යසනයකදී තැතිගැන්මට ලක් වූ සිවිල් වැසියෙකුට මුලින්ම හමුවන රජයේ නියෝජිතයා බොහෝ විට හමුදා සෙබළෙකි. එහිදී, ලබා දෙන මනෝවිද්‍යාත්මක ප්‍රථමාධාර යනු උපදේශනයක් නොව, මානුෂීය සහ ප්‍රායෝගික සහායකි.**

**වගකීම් සහගත සන්නිවේදනය:** සමාජ මාධ්‍ය හරහා වැරදි තොරතුරු පතුරවමින් සෙබළුන්ගේ සහ ජනතාවගේ මානසිකත්වය බිඳ නොදැමීම.

### 5. ගංවතුර සහ සුළි කුණාටු අත්දැකීම්වලින් උගත් පාඩම්

පසුගිය කාලසීමාවන්හිදී ලංකාව මුහුණ දුන් මෙහෙයුම් දෙස බලන විට, නිවැරදි සන්නිවේදනය සහ සංවේදීතාවය මෙහෙයුම් ජයග්‍රහණයට බලපාන අයුරු අප දැක ඇත. විපතට පත් වූවන්ගේ දේපළ සහ ආගමික විශ්වාසයන් කෙරෙහි ගෞරවනීය ලෙස සැලකීම සහන සේවා කටයුතු පහසු කරන බව අත්දැකීමෙන් තහවුරු වී ඇත.

එසේනම්,

ව්‍යසන කළමනාකරණය යනු ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම පමණක් නොව, බිඳී ගිය මිනිස් මනස යළි ගොඩනැගීමකි. හමුදා සෙබළා යනු රටේ ආරක්ෂක පවුර මෙන්ම විපතේදී ළඟාවන සහෝදරයාය. උසස් මානසික සෞඛ්‍ය දැනුමකින් සන්නද්ධ සෙබළාට සිවිල් වැසියන්ගේ ගෞරවය සහ සහයෝගය හිමිවන තැන ඕනෑම අභියෝගයක් ජය ගැනීම අපට අපහසු නොවනු ඇත.




▪ මේජර්
එච්පීජේ භවන්ති
ශ්‍රීලයුකාබ


---

# කාල කළමනාකරණය

- නිතර වැඩක යෙදෙන්න.
- ප්‍රමුඛතාවය අනුව වැඩ තෝරා ගන්න.
- බොහෝ වැඩ කිරීම නොව, ඵලදායි වැඩ තෝරාගන්න.
- හෙට මියයාවි යැයි සිතා සියලු වැඩ නිමා කිරීමට උත්සාහ කරන්න.
- තවත් සියවසක් ජීවත් වේවි යැයි සිතා කියවන්න.
- විවේකය යනු නැවත වැඩ කිරීමට අවශ්‍ය ශක්තිය ගබඩාකරන කාලය යැයි සිතන්න.
- මහ මඟ දුගියාටද රජ මැදුරේ නිරිඳාටද එක සමානව බෙදාදුන් දෙයක් ලෝකයේ ඇත් නම් ඒ කාලයයි.



- කාලක්‍රියා කිරීම යනු කාලයට ඉඩ දී ක්‍රියාව නිරතවීමයි.
- උපත, විපත මැද්දේ ඇති කාලය ජීවිතයයි.
- මිනිසෙකු කාලක්‍රියා කිරීමට පෙර ලෝකයට යමක් ඉතිරිකර තබා යාය යුතුය.
- වයස යනු ජීවත් වූ කාලය අඟවන අංකයකි.
- කෙනෙකු තරුණ හෝ මහළු වන්නේ වයස දැක්වෙන ආකාරයෙන් නොව, සිතුවිලි හා ක්‍රියාවලියෙනි.
- කිසි කෙනෙකුට කාලය මැරිය නොහැකියි. කාලය කා දැමිය නොහැකිය. කාලය විසින් අපව කා දමා මරා දමනු ඇත.
- බොහෝ දෙනෙකුගේ ප්‍රශ්නවලට පහසුම පිළිතුර වනුයේ "කාලයා විසින් එය විසඳනු ලබන බවයි". නමුත්, කාලය ප්‍රශ්නවලට පිළිතුර නොවේ.
- කාලය රන් හා සමානය. රත්තරන් නම් මිලදී ගත හැක. එහෙත් කාලය?



# නව වසරේ මූල්‍ය පුරුදු

"මම මේ මාසේ ඉඳන් අනිවාර්යයෙන්ම සල්ලි ඉතුරු කරනවා," "මම මේ අවුරුද්දේ මගේ ණය ඔක්කොම ගෙවනවා" කියා ඔබත් නව වසරේ හෝ ඔබේ උපන්දිනයේදී පොරොන්දු වී, සති කිහිපයකින් නැවතත් පරණ පුරුදුවලටම වැටී තිබෙනවාද? මූල්‍යමය වශයෙන් සාර්ථක වීම යනු හුදෙක් දැනුම පමණක් නොව, එම දැනුම ක්‍රියාවට නංවන යහපත් "පුරුදු" ගොඩනගා ගැනීමයි. අපගේ මොළය ක්‍රියාත්මක වන ආකාරය සහ අපගේ හැසිරීම් පාලනය කරන අභ්‍යන්තර මනෝ විද්‍යාත්මක ක්‍රම තේරුම් ගැනීම, යහපත් මූල්‍ය පුරුදු නිර්මාණය කර ගැනීමට සහ නරක පුරුදු අත්හැරීමට ඇති බලවත්ම රහසයි. මේ ලිපියෙන් අපි මූල්‍ය පුරුදු නිර්මාණය යනු කුමක්ද? එය වැදගත් වන්නේ ඇයි? සහ ඔබේ මූල්‍ය ජීවිතය පරිවර්තනය කිරීමට ඔබට භාවිතා කළ හැකි අභ්‍යන්තර මනෝ විද්‍යාත්මක ක්‍රම මොනවාදැයි විස්තරාත්මකව සාකච්ඡා කරමු.

## ● මූල්‍ය පුරුදු නිර්මාණය යනු කුමක්ද?

මූල්‍ය පුරුදු නිර්මාණය යනු, සවිඥානිකව වෙහෙසක් නොගෙන, ස්වයංක්‍රීයවම ක්‍රියාත්මක වන යහපත් මූල්‍ය හැසිරීම් (උදා: ඉතිරි කිරීම, අයවැය සමාලෝචනය කිරීම) ඔබේ ජීවිතයේ කොටසක් බවට පත් කර ගැනීමේ ක්‍රියාවලියයි. මෙය හුදෙක් කැමැත්තෙන් කරන දෙයක් නොව, ඔබේ මොළයේ පුරුදු ගොඩනැගෙන ආකාරය තේරුම් ගෙන, එය ඔබට වාසිදායක ලෙස භාවිතා කිරීමයි.

**සරලව කිව්වොත්,**

යහපත් මූල්‍ය තීරණ ගැනීම, දත් මැදීම මෙන්, නොසිතාම සිදු වන ස්වයංක්‍රීය ක්‍රියාවක් බවට පත් කිරීමට උත්සාහ ගන්න.

දිනපතා සිදු කරන කුඩා, ධනාත්මක මූල්‍ය ක්‍රියා, කාලයත් සමඟ විශාල, ජීවිතය වෙනස් කරන ප්‍රතිඵල බවට පත්වෙයි.

ඔබේ මොළයට විරුද්ධව සටන් කරනවා වෙනුවට, එය සමඟ එකට වැඩ කර යහපත් පුරුදු ගොඩනැගීමට උත්සුක වන්න.

## ● මෙම ක්‍රමවේදය වැදගත් වන්නේ ඇයි?

අභ්‍යන්තර මනෝ විද්‍යාත්මක ක්‍රම භාවිතා කර මූල්‍ය පුරුදු ගොඩනගා ගැනීම ඔබට විශාල වාසි රැසක් ලබා දෙයි. කැමැත්ත මත පමණක් රඳා පවතිනවාට වඩා, පුරුදු මත පදනම් වූ වෙනස්කම් දිගු කාලයක් පවතී.

යහපත් මූල්‍ය තීරණ ස්වයංක්‍රීයව සිදු වනවිට, ඔබට දවස පුරාම මුදල්

කළමනාකරණය පිළිබඳව තීරණ ගැනීමට අවශ්‍ය නොවන නිසා, ඔබේ මානසික ශක්තිය ඉතිරි වේ.

එමගින් ඔබේ මූල්‍ය කටයුතු පාලනයකින් යුතුව සිදුවන බව දැන සිටීම නිසාවෙන් මුදල් පිළිබඳව ඇතිවන කරදර සහ මානසික පීඩනය අඩු කරයි, ඔබේ මූල්‍ය ඉලක්ක කරා ස්ථාවරව සහ වේගයෙන් ඔබව ගෙන යයි.

තවද, ඔබේ මුදල් පාලනය කිරීමට ඔබට හැකි බව ඔබ දකින විට, ඔබේ හැකියාවන් පිළිබඳව ඔබට විශාල ආත්ම විශ්වාසයක් ගොඩනැගේ.

ඔබේ මූල්‍ය ජීවිතය වෙනස් කිරීමට ඔබට භාවිතා කළ හැකි, විද්‍යාත්මකව ඔප්පු කරන ලද මනෝ විද්‍යාත්මක ක්‍රම කිහිපයක් මෙන්න,

1. කුඩාවටම ආරම්භ කරන්න

අපගේ මොළය විශාල, අපහසු කාර්යයන් ආරම්භ කිරීමට මැලි වේ. නමුත්, ඉතා කුඩා, පහසු කාර්යයක් ආරම්භ කිරීමට එය විරුද්ධ නොවේ.

"මම දිනපතා මගේ වියදම් ලියනවා" කියා සිතනවා වෙනුවට, "මම දිනපතා එක් වියදමක් පමණක් මගේ වියදමෙන් අඩුකරනවා" කියා ආරම්භ කරන්න. තවත් ක්‍රමයක් ලෙසට, "මම දිනපතා රු. 1000ක් ඉතිරි කරනවා" වෙනුවට, "මම දිනපතා රු. 100ක් මගේ ඉතුරුම් බඳුනට දමනවා" කියා ආරම්භ කරන්න.

මෙම ක්‍රමය ආරම්භ කිරීම පහසු වන අතර, ඔබ එය දිගටම කරගෙන යන විට, ක්‍රමයෙන් එය විශාල පුරුද්දක් බවට පත් කර ගත හැකියි.


2. පුරුදු එකට සම්බන්ධ කරන්න

අපගේ මොළය දැනටමත් පවතින පුරුදු සමඟ නව පුරුදු සම්බන්ධ කිරීමට කැමතියි.

ඔබ දිනපතා දැනටමත් කරන පුරුද්දකින් පසුව, ඔබේ නව මූල්‍ය පුරුද්ද එක් කරන්න.

උදාහරණය ලෙස "මම උදේට තේ බිව්වට පස්සේ, මගේ අයවැය විස්තරය විනාඩි 2ක් බලනවා", "මම රාත්‍රියේ දත් මැද්දට පස්සේ, මගේ ඉතුරුම් ඉලක්කය දෙස බලනවා".

එමගින් නව පුරුද්ද ඔබේ දෛනික ජීවිතයේ ස්වභාවික කොටසක් බවට පත් වේ.


ඔබේ මූල්‍ය කටයුතු පාලනයකින් යුතුව සිදුවන බව දැන සිටීම නිසාවෙන් මුදල් පිළිබඳව ඇතිවන කරදර සහ මානසික පීඩනය අඩු කරයි, ඔබේ මූල්‍ය ඉලක්ක කරා ස්ථාවරව සහ වේගයෙන් ඔබව ගෙන යයි.

තවද, ඔබේ මුදල් පාලනය කිරීමට ඔබට හැකි බව ඔබ දකින විට, ඔබේ හැකියාවන් පිළිබඳව ඔබට විශාල ආත්ම විශ්වාසයක් ගොඩනැගේ.

3. ඔබේ පරිසරය වෙනස් කරන්න

අපගේ හැසිරීම් අපගේ වටපිටාවෙන් විශාල ලෙස බලපෑමට ලක් වේ. එමෙන්ම, යහපත් පුරුදු හුරුකරගෙන, නරක පුරුදු ඈත් කිරීමට උත්සාහ කරන්න.

හොඳ පුරුද්දක් ලෙස ඔබේ ඉතුරුම් බඳුන ඇස් මානයේ තබන්න. ඔබේ මූල්‍ය ඉලක්කයේ පින්තූරයක් නිතර ඔබේ ඇස ගැටෙන පරිගණක සහ ජංගම දුරකතන තිරයේ ප්‍රදර්ශනය වන සේ තබන්න.

අහපත් පුරුදු ලෙස ඔන්ලයින් සාප්පු සවාරි යෙදුම් දුරකථනයෙන් ඉවත් කරන්න. ක්‍රෙඩිට් කාඩ්පත නිවසේ තබා යන්න.

4. පෙළඹවීම් සහ ප්‍රතිඵල හඳුනාගන්න

සෑම පුරුද්දක්ම පෙළඹවීමක්, ක්‍රියාවක් සහ ප්‍රතිඵලයක් යන චක්‍රය මත ගොඩනැගී ඇත.

ඔබේ නරක මූල්‍ය පුරුදු (උදා: අනවශ්‍ය ලෙස වියදම් කිරීම) ඇතිවීමට හේතුවන පෙළඹවීම කුමක්දැයි හඳුනා ගන්න (උදා: මානසික පීඩනය, කම්මැලිකම). ඉන්පසු, එම පෙළඹවීමට මුදල් වියදම් නොවන, ධනාත්මක ප්‍රතිඵලයක් ලබා දෙන නව ක්‍රියාවක් ආදේශ කරන්න (උදා: මානසික පීඩනයක් ඇති වූ විට, ඇවිදීමට යාම).

නරක පුරුදු මුලිනුපුටා දැමීමට සහ ඒවා යහපත් පුරුදුවලින් ආදේශ කිරීමට හැකිතාක් උත්සාහ ගන්න.

5. ඔබටම ප්‍රතිලාභ ලබා දෙන්න

අපගේ මොළය ප්‍රතිලාභ ලැබෙන විට, එම හැසිරීම නැවත කිරීමට පෙළඹේ.

ඔබ ඔබේ ඉතුරුම් ඉලක්කයක් සපුරා ගත් විට හෝ යහපත් මූල්‍ය පුරුද්දක් අඛණ්ඩව පවත්වාගෙන ගිය විට, මුදල් වියදම් නොවන ආකාරයකින් ඔබටම කුඩා ප්‍රතිලාභයක් ලබා දෙන්න (උදා: චිත්‍රපටයක් නැරඹීම, පොතක් කියවීම)

යහපත් මූල්‍ය පුරුදු, සතුට සහ තෘප්තිය සමඟ සම්බන්ධ වන නිසා, ඒවා දිගටම කරගෙන යාමට ඔබට පෙළඹවීමක් ඇති වේ.

## ● මතක තබා ගත යුතු වැදගත් කරුණු

ඉවසීම සහ ස්ථාවරත්වය, නව පුරුද්දක් ස්වයංක්‍රීය වීමට කාලය ගත වේ. අධෛර්යමත් නොවී, අඛණ්ඩව උත්සාහ කරන්න.

ඔබ අතරමඟදී වැරැද්දක් කළහොත් (උදා: අයවැය ඉක්මවා ගියහොත්), ඔබටම දොස් පවරා ගන්නවා වෙනුවට, එයින් ඉගෙන ගෙන, ඊළඟ දවසේ නැවත ආරම්භ කරන්න.

## අවසාන වශයෙන්...

මූල්‍ය පුරුදු නිර්මාණය යනු ඔබේ මූල්‍ය අනාගතය සඳහා ඔබ විසින්ම කරගන්නා බලවත්ම ආයෝජනයයි. එය හුදෙක් මුදල් පිළිබඳව පමණක් නොව, ඔබේ මානසිකත්වය සහ හැසිරීම් පිළිබඳවයි. ඉහත සඳහන් කළ අභ්‍යන්තර මනෝ විද්‍යාත්මක ක්‍රම භාවිතා කිරීමෙන්, ඔබටත් යහපත් මූල්‍ය පුරුදු ඔබේ ජීවිතයේ ස්ථිර කොටසක් බවට පත් කර ගත හැකි වනු ඇත. අදම ඔබේ මූල්‍ය ජීවිතය පරිවර්තනය කිරීමේ ගමන ආරම්භ කරන්න!



■ ලුතිනන්
ඒබීඅයි ලක්ෂිත
ශ්‍රීලයුපොදුසේබ



# උමුගණ්ඩා ආදර්ශයෙන් “පිරිසිදු ශ්‍රී ලංකාවක්”

## ජාතික පවිත්‍රතා දිනයක කාලෝචිත අවශ්‍යතාව

සමස්ත ලෝකයම පාරිසරික අර්බුදයක වෙළී සිටින මොහොතක, රුවන්ඩාව අප්‍රිකාවේ පිරිසිදුම රට බවට පත්කළ "උමුගන්ඩා" සංකල්පය ශ්‍රී ලාංකීය පොළොවට බද්ධ කරමින් "ජාතික පවිත්‍රතා දිනයක්" ප්‍රකාශයට පත්කිරීමේ ජාතික අවශ්‍යතාවය පිළිබඳව කෙරෙන ගැඹුරු විමසුමකි.

### 1. අප හමුවේ ඇති පාරිසරික අභියෝගය

වර්තමාන ශ්‍රී ලංකාව සීඝ්‍ර නාගරීකරණය හා සංවර්ධන ක්‍රියාවලීන් හේතුවෙන් දැඩි පාරිසරික අභියෝගයකට මුහුණ දී සිටී. විශේෂයෙන්ම නිසි කළමනාකරණයකින් තොරව බැහැර කරන කසළ හේතුවෙන් මහජන සෞඛ්‍යය, පාරිසරික සුරක්ෂිතතාවය මෙන්ම සංචාරක කර්මාන්තය ද දැඩි තර්ජනයකට ලක්ව ඇත.

අතීතයේ සිටම "පෙරදිග ධාන්‍යාගාරය" ලෙසත්, සුන්දර පාරාදීසයක් ලෙසත් විරුදාවලිය ලත් අපේ මව්බිම අද වන විට අවිධිමත් කසළ බැහැර කිරීම් නිසා දූෂිත වී තිබීම කණගාටුවට කරුණකි. රජය පමණක් නොව, පුරවැසියන් ලෙස අප සැම ද මෙයට වගකිව යුතුය. මෙම ගැටලුවට තිරසාර විසඳුමක් ලෙස, රුවන්ඩාවේ ක්‍රියාත්මක "Umuganda" සංකල්පය ආදර්ශයට ගනිමින් ශ්‍රී ලංකාව තුළ නව ජාතික මෙහෙයුමක් දියත් කිරීමට කාලය එළඹ ඇත.

### 2. "Umuganda" යනු කුමක්ද? රුවන්ඩාවේ අත්දැකීම

"Umuganda" යනු රුවන්ඩා භාෂාවෙන් "එකම අරමුණක් සඳහා එකට එක්වීම" යන්නයි. 1994 වසරේ ඇති වූ බිහිසුණු ජන සංහාරයෙන් පසු විනාශ වූ රට යළි ගොඩනැගීමට ඔවුන් භාවිත කළ ප්‍රබලම මෙවලම මෙයයි. රුවන්ඩාවේ සෑම මසකම අවසාන සෙනසුරාදා දින පෙරවරු 8:00 සිට 11:00 දක්වා කාලය “උමුගන්ඩා” වෙනුවෙන් වෙන් කෙරේ. මෙහි ඇති සුවිශේෂීත්වය වන්නේ රටේ ජනාධිපතිවරයාගේ සිට සාමාන්‍ය වැසියා දක්වා සියලු දෙනාම එකම මට්ටමකින්, එකම දිනකදී වීදි පිරිසිදු කිරීමට සහ පොදු වැඩකටයුතුවලට සහභාගී වීමයි.

මෙම කාලය තුළ ව්‍යාපාරික ස්ථාන වසා තැබෙන අතර ගමනාගමනය ද සීමා කෙරේ. පුරවැසියන් එක්ව පාරවල් අතුගෑම, කානු පිරිසිදු කිරීම, පාසල් සහ රෝහල් අලුත්වැඩියාව මෙන්ම ගස් සිටුවීම වැනි කාර්යයන් සිදු කරති. වැඩ අවසානයේ සියලු දෙනා එක්ව ප්‍රජා ගැටලු සාකච්ඡා කරති. මෙමගින් රුවන්ඩාව අප්‍රිකාවේ පිරිසිදුම රට බවට පත් වූවා පමණක් නොව, බෙදී සිටි ජනතාව අතර ජාතික සමගිය ද වර්ධනය විය.

### 3. වැඩසටහන මගින් සිදුකිරීමට යෝජිත කාර්යයන්

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාවට නැංවෙන “Clean Sri Lanka” ජාතික වැඩසටහන මගින් ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් ආවරණය කිරීමට අපේක්ෂිතයː

**මාර්ග දෙපස පිරිසිදු කිරීමː** ප්‍රධාන හා අතුරු මාර්ග පිරිසිදු කර පසෙක ඇති කැලෑ සහ අපද්‍රව්‍ය ඉවත් කිරීම.

**පොදු ස්ථානː** බස් හා දුම්රිය නැවතුම් පොළවල්, ක්‍රීඩාංගණ සහ උද්‍යාන පිරිසිදු කිරීම.

**ජලවහන පද්ධතිː** ඇළ හා කාණු පද්ධති පිරිසිදු කර ජලය බැසයාමට ඇති බාධා ඉවත් කිරීම මගින් ගංවතුර අවදානම පාලනය කිරීම.

**වෙරළ සංරක්ෂණයː** සංචාරක ආකර්ෂණය සහිත වෙරළ තීරයන් පිරිසිදු කර ප්ලාස්ටික් හා පොලිතින් ඉවත් කිරීම.

**සුරක්ෂිතතාවයː** පාර අයිනේ ඇති අනාරක්ෂිත ගස් හා අතු ඉවත් කිරීම.

**පරිසර අලංකරණයː** නගර හා මාර්ග දෙපස පැළ සිටුවීම සහ තීන්ත ආලේප කර අලංකාර කිරීම.

**කසළ කළමනාකරණයː** කසළ වර්ගීකරණය හා ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමුකිරීමට ජනතාව දැනුවත් කිරීම.



## 4. "උමුගන්ඩා" තුළින් ශ්‍රී ලංකාවට ලැබෙන බහුවිධ ප්‍රතිලාභ

මෙම ක්‍රමය නිවැරදිව ක්‍රියාත්මක කිරීමෙන් ක්ෂේත්‍ර ගණනාවක විප්ලවීය වෙනසක් ඇති කළ හැකිය:

### I. ආර්ථික වැදගත්කම:

පොදු යටිතල පහසුකම් නඩත්තුව (කාණු පිරිසිදු කිරීම, පාරවල් අලුත්වැඩියාව) සඳහා රජයට වැය වන බිලියන ගණනක ශ්‍රම පිරිවැය ඉතිරි කර ගත හැකිය. එම මුදල් වෙනත් සංවර්ධන කටයුතු සඳහා යෙදවීමට මග පැදේ.

### II. සමාජීය සහ සංවර්ධනමය වැදගත්කම:

විවිධ ජාතීන්, ආගම් සහ පන්ති නියෝජනය කරන පිරිස් එකට වැඩ කිරීමෙන් සමාජ සහජීවනය සහ ජාතික සමගිය වර්ධනය වේ. එසේම පරිසරය පිරිසිදු වීමෙන් ඩෙංගු වැනි බෝවන රෝග අවම වන අතර, එමගින් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ රජයේ වියදම් අඩු වේ.

### III. දේශපාලනික සහ පරිපාලනමය වැදගත්කම:

"රට පිරිසිදු කිරීම රජයේ වැඩක්" යන පරාජිත මානසිකත්වයෙන් මිදී, තමන්ටත් රට වෙනුවෙන් වගකීමක් ඇති බව පුරවැසියා තේරුම් ගනී. මෙය වගකීම් සහගත පුරවැසිභාවය ගොඩනැගීමේ මුල් පියවරයි.

### IV. අන්තර්ජාතික සහ සංචාරක වැදගත්කම:

"ලොව පිරිසිදුම සහ හරිතවත්ම රටක්" ලෙස ශ්‍රී ලංකාව අන්තර්ජාතිකව ප්‍රසිද්ධ වීම හරහා සංචාරක ආකර්ෂණය දෙගුණ තෙගුණ වනු ඇත. විනයගරුක සහ පිරිසිදු රටක් දැකීමට සංචාරකයින් දක්වන කැමැත්ත ආර්ථිකයට මහත් ශක්තියකි.

## 5. මෙහෙයුමේ නියමුවන් ලෙස තාරුණ්‍යයේ ජවය සහ හමුදාවේ විනය

මෙම දැවැන්ත මෙහෙයුම සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සහ යෞවන සමාජ පද්ධතිය ඒකාබද්ධව කටයුතු කිරීම මෙහි සුවිශේෂීත්වයයි.

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කාර්යභාරය:

යුද්ධ හමුදාව සතු සංවිධාන ශක්තිය, අත්දැකීම් සහ යන්ත්‍රෝපකරණ සම්පත් මෙම ව්‍යාපෘතියේ ශක්තියයි. ඔවුන් නාගරික පොදු ස්ථාන පිරිසිදු කිරීමේ මෙහෙයුම් සඳහා නායකත්වය සහ විනයානුකූල මගපෙන්වීම ලබා දිය යුතුය. සාමාන්‍ය ශ්‍රමදානයකට වඩා එහා ගිය ක්‍රමවත් සහ විද්‍යාත්මක වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවීමට හමුදාවේ මැදිහත්වීම අත්‍යවශ්‍ය වේ.

### යෞවන සමාජ (Youth Clubs) සතු වගකීම:

දිවයින පුරා විහිදී ඇති ග්‍රාම නිලධාරී වසම් 14,015 තුළ පවතින යෞවන සමාජ සහ එහි ලක්ෂ 4කට අධික සාමාජිකත්වය මෙම මෙහෙයුමේ සැබෑ ජවයයි. රටේ අනාගතය භාර ගැනීමට සිටින තරුණ පරපුර ජනතාව දැනුවත් කිරීම සහ ප්‍රාදේශීය මට්ටමින් මෙහෙයුම් සැලසුම් කිරීම සිදු කළ යුතුය. වැඩ නිමාවේදී ඔවුන් සියලු දෙනා එක්ව සුහදව අදහස් හුවමාරු කරගැනීම තුළින් ගමේ ඊළඟ සංවර්ධන පියවර ගැන සාකච්ඡා කළ හැකිය.

## 6. පාර්ශවකරුවන්ගේ සහයෝගීතාවය (Work Flow)

මෙම වැඩසටහන "Clean Sri Lanka" ව්‍යාපෘතිය ලෙස හැඳින්වෙන අතර එය පහත පරිදි සම්බන්ධීකරණය වේ:

**ග්‍රාමීය රාජ්‍ය නිලධාරීන්:** මහජනතාව දැනුවත් කිරීම සහ සම්බන්ධීකරණය.

**ව්‍යාපාරික ප්‍රජාව:** වෙළඳ සංගම් හරහා ව්‍යාපෘති සඳහා අවශ්‍ය මූල්‍ය හෝ ද්‍රව්‍යමය අනුග්‍රහය ස්වේච්ඡාවෙන් ලබා දීම.

**ග්‍රාමීය සමිති සමාගම්:** තම ස්වේච්ඡා ශ්‍රමය සහ උපකරණ ලබා දෙමින් සක්‍රීයව දායක වීම.

අවසාන වශයෙන් "උමුගන්ඩා" යනු රුවන්ඩාවට පමණක් සීමා වූ දෙයක් නොවේ. එය අපේ පැරණි "අත්තම්" හෝ "ශ්‍රමදාන" සංස්කෘතියේ නූතන හා විද්‍යාත්මක මුහුණුවරයි. නිදසුනක් ලෙස, ඔබේ ප්‍රදේශයේ යෞවන සමාජය සහ යුද හමුදා ඒකකයක් එක්ව මාසිකව එක් දිනක් පොදු ස්ථානයක් පිරිසිදු කරනවා යනු රටක් ගොඩනැගීමේ මහා මංගල්‍යයකි. තාරුණ්‍යයේ ජවයත්, හමුදාවේ විනයත්, මහජනතාවගේ කැපවීමත් එක් වුවහොත්, අපේ මව්බිම ආසියාවේ පිරිසිදුම පාරාදීසය බවට පත් කිරීම කිසිවෙකුට වැළැක්විය නොහැක.




මේජර් එච්ජීජේ හවන්ති ශ්‍රීලයුකාබ

# ජීවිත සුරැකි

# ජීවක දෑත්

## ඊළාම් යුද්ධයේ දෙවිවරු හෙවත් සංග්‍රාමික ශල්‍ය වෛද්‍යවරු







**ඊලාම් යුද්ධය පැවති කාලයේ තුවාල ලත් සොල්දාදුවන්ට ප්‍රතිකාර කිරීම සඳහා ඉතා දක්ෂ සංග්‍රාමික ශල්‍ය වෛද්‍යවරු පිරිසක් සිටි අතර, සංග්‍රාමික ශල්‍ය වෛද්‍යවරුන් ගේ භූමිකාව පිළිබඳව හරි ඇගැයුමක් මෙතෙක් සිදුවී නැත. ඇමරිකාව, එංගලන්තය, සෝවියට් දේශය, කැනඩාව යනාදී රටවල යුද සමයේදී අනගි සේවාවන් ඉටුකළ සංග්‍රාමික ශල්‍ය වෛද්‍යවරුන් ගැන පොත් පවා ලියා තිබේ. එහෙත්, ලංකාවේ ඔවුන් කළ සේවාව නිසි පරිදි තක්සේරු නොකිරීම කණගාටුදායකය. එම නිසා මෙම කුඩා සටහන ඊලාම් යුද්ධයේදී සුවිසල් කාර්‍යභාරයක් කළ සංග්‍රාමික ශල්‍ය වෛද්‍යවරු පිළිබඳවය. මෙම සටහන ඔවුනට උපහාරයක් ලෙස මම සලකමි.**

සංග්‍රාමික ශල්‍ය වෛද්‍යවරු බොහෝ දෙනෙකු මම වෘත්තීය මට්ටමෙන් මෙන්ම පුද්ගලිකවද දැන සිටියෙමි. ඔවුන් අතරින් විශේෂඥ ශල්‍ය වෛද්‍ය එස්.එස්. ජයරත්න මහතා විසින් යුද්ධය සමයේදී කරන ලද සේවය සුවිසල්ය. එතුමා ජීවිත බොහෝ ගනනක් බේරා ගත්තේය. මේ නිසා යුද හමුදාව එතුමාට ණය ගැති බව කිවහොත් වරදක් නොවේ. විශේෂඥ ශල්‍ය වෛද්‍ය එස්.එස්. ජයරත්න මහතා වැනි මානුෂික ගුණාංගයන් ගෙන් අනූන වූ වෛද්‍යවරයෙකු සමග සේවය කිරීමට ලැබීම මා ලත් භාග්‍යකි. එසේම විශේෂඥ වෛද්‍ය (මුහුණ සහ හකු) එම් මුතුමාල මහතාත්, ඩී.ජේ.එල් සිරිවර්ධන මහතාත් යුද්ධයෙන් මුහුණ තුවාල ලැබූ සොල්දාදුවන්ට ප්‍රතිකාර කළෝය. මෙම වෛද්‍යවරු දෙපළම යුද්ධයෙන් තුවාල ලබා මුහුණ විරූපී වූ සොල්දාදුවන් ගේ මානසිකත්වය නගා සිටුවනු වස් මා වෙත මනෝ ප්‍රතිකාරයන් සඳහා යොමු කළහ. ඔවුන් රෝගීන් ගේ මනස ස්ථායි කොට ශල්‍යකර්ම කළහ. මේ හැර විශේෂඥ ශල්‍ය වෛද්‍ය බ්‍රිගේඩියර් සොයිසා, විකලාංග ශල්‍ය වෛද්‍ය විශේෂඥ එස්.ඩී. කරුණාරත්න යන මහතුන් යුද සමයේදී අනූපමය සේවාවක් සිදු කළහ. විකලාංග ශල්‍ය වෛද්‍ය විශේෂඥ එස්.ඩී. කරුණාරත්න මහතා මා විසින් ඔහුගේ රෝගීන් සම්බන්ධයෙන් කරන ලද මනෝ ප්‍රතිකාරයන් පසසා මා වෙත එවන ලද කෙටි ලියමනක් තිබේ. මා එය මේ දක්වා සුරැකිව තබාගෙන තිබේ.

විශේෂඥ ශල්‍ය වෛද්‍ය තිස්ස විජේරත්න මහතා මට බොහෝ රෝගීන් මනෝ ප්‍රතිකාරයන් සඳහා යොමු කළේය. වරක් අපවර්තන අක්‍රමතාවයක් (Conversion Disorder) නිසා දෙපා පණ නොමැතිව සිටි සොල්දාදුවෙකු මම මෝහන ප්‍රතිකාර මගින් සුවපත් කළෙමි. වෛද්‍ය තිස්ස විජේරත්න මෙම සොල්දාදුවා මෝහන ප්‍රතිගමනයකට ලක් කොට පෙර ආත්මය පිලිබඳ තොරතුරු ලබා ගත හැකිය යන්න මගෙන් විමසුවේය. මම එම රෝගියා මෝහන ප්‍රතිගමනයකට ලක් කොට විස්තර ලබා ගත්තෙමි. මෙම රෝගියා කියූ විස්තර අනුව අප වරක් ඔහු පෙර භවයේ විසුවා යැයි කියූ කුරුණෑගල ප්‍රදේශයේ ලිපිනයක්ද සොයා ගියෙමි. මගේ අදහස අනුව මෙම රෝගියා පවසන ලද්දේ ළමා කාලයේ ඔහුගේ අවිඥාණයේ තැන්පත්ව තිබූ විස්තර විය යුතුය. එහෙත්, වෛද්‍ය තිස්ස සමග පුනරුප්පත්ති ගවේෂණ චාරිකාව විනෝදමත් එකක් විය. අප බොහෝ දේවල් ගැන සංවාදයේ යෙදෙමින් එම ගමන ගියෙමු.

තවද, සාම කාලයේදී (2005) එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන් විසින් යාපනය නගරයේදී යුද හමුදා ට්‍රක් රථයකට ප්‍රහාරයක් එල්ල කරන ලදී. මේ ප්‍රහාරය නිසා සාජන්වරයෙක් ද සොල්දාදුවන් කිහිප දෙනෙකු ද මිය ගිය අතර, තවත් කිප දෙනෙකු තුවාල ලැබීය. තුවාල ලත් එක් සොල්දාදුවෙක් තීව්‍ර පශ්චාත් ව්‍යසන ක්ලම්ථ අක්‍රමතාවයේ ලක්ෂණ (Acute PTSD) පෙන්වන ලද නිසා එතුමා එම සොල්දාදුවාව මනෝ ප්‍රතිකාර සඳහා මා වෙත යොමු කළේය. මම EMDR ප්‍රතිකාරය භාවිතාවෙන් එම සොල්දාදුවාව සුවපත් කළෙමි.

විශේෂඥ ශල්‍ය වෛද්‍ය තිස්ස විජේරත්න මහතා ඊලාම් යුද්ධය නිසා තුවාල ලත් රෝගීන් බොහෝ දෙනෙකුට ප්‍රතිකාර කළ සංග්‍රාමික ශල්‍ය වෛද්‍යවරයෙකි.

විශේෂඥ ශල්‍ය වෛද්‍ය ලලන්ත අභය රණසිංහ මහතා මට බොහෝ අවස්ථාවලදී යුද හමුදා රෝහලේ හමු වී තිබේ. එතුමා ඇතැම්විට මට රෝගීන් මනෝ උපදේශනය සඳහා යොමු කොට ද තිබේ. ඊලාම් යුද්ධයේදී උතුරට ගොස් තුවාල ලත් සොල්දාදුවන්ට ප්‍රතිකාර කරන ලද විශේෂඥ ශල්‍ය වෛද්‍ය ලලන්ත අභය රණසිංහ මහතාගේ සේවය අති විශාලය. යුද ගිනි මැද එතුමා පලාලි රෝහලට ගොස් ක්‍රියාන්විතයේ තුවාල ලැබූ සොල්දාදුවන්ගේ ජීවිත බේරා ගැනීමට විශාල මෙහෙයක් කළේය. යුද හමුදාවේ එක් කෝප්‍රල්වරයෙකු මට පැවසූ පරිදි එක් දිනක් තුවාලකරුවන් ඉතා විශාල ප්‍රමාණයක් රෝහලට ට්‍රැක්ටර් මගින් ගෙන එන ලද අතර, නොකඩවා පැය 15 අධික කාලයක් විවේකයක්වත් නොලබා එතුමා රෝගීන්ට අවශ්‍ය ශල්‍යකර්ම කරන ලදි. අවසානයේදී වෙහෙස නිසා ඇස් පියවෙන නමුදු එතුමා ශල්‍ය සැත අත හැරියේ නැත. රෝගීන් ද නොනැවතී ගලනා ගඟක් සේ රෝහලට ගලා ආ අතර, වෛද්‍ය ලලන්ත අභය රණසිංහ මහතා ඒ සියලු දෙනාට ප්‍රතිකාර කළේය. අවසානයේදී අධිකතර වෙහෙස නිසා එතුමා ශල්‍යාගාරයේ පුටුවක වාඩිවී දෑස් වසාගෙන සිටි බව වෛද්‍ය බළකායේ කෝප්‍රල්වරයා මට වැඩිදුරටත් කීවේය.

විශේෂඥ ශල්‍ය වෛද්‍ය රංජන සෙනෙවිරත්න මහතා බොහෝ ඇසූ පිරූ අයෙකි. එතුමා සමඟ විවිධ විෂයන් ගැන නිලධාරීන්ගේ නිවස්නයේදී කතා කිරීමට මම පුරුදුව සිටියෙමි. අප රොමෙල්, පැටර්න්, ස්වත්ස්කොෆ්, ෂුකෝව් වැනි හමුදා නායකයන් ගැන යුද ඉතිහාසයන් ගැන විධිමත් සංවාදවල යෙදුනෙමු. විශේෂඥ ශල්‍ය වෛද්‍ය රංජන සෙනෙවිරත්න මහතා යුද්ධය ඉතා දරුණුවට පැවති අවස්ථාවලදී පවා උතුරට ගුවනින් ගොස් පලාලි රෝහලේ ශල්‍යකර්ම කරන ලදි. වරක් ශල්‍යකර්මයක් කරන අතරතුර එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන් විසින් කාලතුවක්කු ප්‍රහාරයක් අරඹන ලදි. සමහර කාලතුවක්කු උණ්ඩ රෝහල ආසන්නයේද වැටුණි. හෙණ හඬ නගමින් පුපුරා යන කාලතුවක්කු ප්‍රහාරය හමුවේ වෛද්‍ය රංජන සෙනෙවිරත්න උදරයට වෙඩි වැදුනු සොල්දාදුවෙකුට නොසැලී ශල්‍යකර්මයක් කරමින් සිටියේය. නමුත්, සහායක හෙදිය කම්පනය නිසා සිහි නැතිව ඇද වැටුණාය. යුද භූමියේදී දක්වන ලද නිර්භීතභාවය නිසා විශේෂඥ ශල්‍ය වෛද්‍ය රංජන සෙනෙවිරත්න මහතාට රණවිරු සේවා පදක්කම (RSP) ප්‍රධානය කරන ලදි. ලංකාවේ රණවිරු සේවා පදක්කම ලද මුල්ම විශේෂඥ ශල්‍ය වෛද්‍යවරයා වෛද්‍ය රංජන සෙනෙවිරත්න විය යුතුය.

ලුතිනන් කර්නල් ශල්‍ය වෛද්‍ය ඥාණදාස මහතා මට පලාලි රෝහලේ හමුවී තිබේ. වරක් රෝහලේ සේවා මුරයෙන් පසුව රාත්‍රියක මම වෛද්‍ය ඥාණදාස මහතා සමග පලාලි රෝහලේ නිලධාරීන් ගේ නිල නිවස්නයේදී ලගාන් හිංදි චිත්‍රපටය නැරඹුවෙමි. වෛද්‍ය ඥාණදාස මහතා දිගු කාලයක් පලාලි රෝහලේ නැවතී සොල්දාදුවන්ට ප්‍රතිකාර කළේය. ඔහු සරල මිත්‍රශීලී පුද්ගලයෙකි.

ඊලාම් යුද්ධයේදී සංග්‍රාමික ශල්‍ය වෛද්‍යවරු සොල්දාදුවන් ගේ ජීවිත බේරා ගැනීම සඳහා මිළ කළ නොහැකි සේවයක් කළහ. මෙම උදාර මිනිසුන් විසින් කළ සේවය මතු පරපුරද දැනගත යුතුය.



■ වෛද්‍ය
**රුවන් එම් ජයතුංග**
Psychologist and
Mental Health Clinician





"කුමුදුගේ කතාව"
පසුගිය සතියේ ඉතිරිය
(03 කොටස)

යුද සමයේ සැඟවුණු කතාවක්

## අතුරුදන් සැමියා ගැන

# වසරකට පසු තොරතුරක්

මොරවැව ක්‍රියාන්විත පරිසරයේ දිවි ගෙවීම වඩා පීඩාකාරී වූයේ කුමුදුට වඩා ඇගේ දියණියටය. රට වෙනුවෙන් තම සැමියා සදාකාලිකවම ජීවිතය පූජා කොට තිබූ තත්ත්වයක් තුළ ඇයට ද තවදුරටත් එම යුද්ධයේම වින්දිතයෙක් වී එම පරිසරයේම ජීවත් වන්නට සිදුවීම කොතරම් අභාග්‍යයක් හා අසාධාරණයක් දැයි ඇයට සිතිණ. මේ අතර කුමුදුගේ වැඩිමහල් සහෝදරියගෙන් ඇයට පණිවිඩයක් ලැබිණ. ඒ වනවිට ඇය පදිංචිව සිටියේ රත්නපුර රක්වානේය. සිය නැගණිය පත්ව සිටි තත්ත්වය පිළිබඳ හොඳින් තේරුම්ගෙන සිටි ඈ කුමුදුට දන්වා සිටියේ දියණිය සමඟ එහි පැමිණ පදිංචි වන ලෙසය. කුමන දුෂ්කරතා මධ්‍යයේ වුව දෙමාපියන් ඇතුළු නිවැසියන් හැරදමා යා නොහැකි වුවද දියණිය පිළිබඳ සලකා අවසානයේ සිය සොහොයුරියගේ නිවසට යාමට තීරණය කළාය. ඒ අනුව තවත් දින කිහිපයක ඇවෑමෙන් ඇය මොරවැව මහගෙදරින් සමුගත්තේ එම පරිසරයේ ගෙවූ වසර ගණනාවක මතක සමුදායක් ද ඉතිරි කරමිනි.

කලවානට පැමිණි කුමුදුට එහි සාමාන්‍ය ජීවිතයක් ගෙවමින් සිටි සිය සොයුරියගේ නිවසේ පිටිපස කුඩා කාමරයක් නවාතැන් සඳහා වෙන් කෙරුණි. එහි මොරවැව තරම් දුෂ්කර හෝ ජීවිත අවදානමක් නොවූවද අලුත් පරිසරයට හුරුවන්නට ඇට මෙන්ම දියණියට ද සැලකිව යුතු දවසක් ගත විය. මෙලෙස එහි සිට වැඩි කලක් යාමට මත්තෙන්ම එම ප්‍රදේශයෙන් පර්චස් 20ක බිම් කොටසක් මිලට ගත් කුමුදු එහි හැකි පමණින් නිවාස කොටසක් ඉදිකරගන්නට පෙළඹුණේ තම සොහොයුරියට වුව අනවශ්‍ය බරක් දිය නොහැකි නිසාමය. කුමුදුගේ එම කුඩා නිවස සාදාගැනීම පිණිස ද ඇය කැප වූ තරම දන්නේ ඇයම පමණි. එහි සියලු වැඩ කුළියටම කර ගැනීමට තරම් ආර්ථික ශක්තියක් නොවූ තැන නිවසට අවශ්‍ය වැලි ගල් ඇදීම, බදාම ඇනීම ආදී බොහෝ අත්උදව් කටයුතු සිදු කෙරුණේ ද කුමුදුගේම දෑතිනි. නිවස සාදන තැන දක්වා එවක නිසි මාර්ගයක් ද නොවූ තැන කළුගල්, වැලි, සිමෙන්ති ආදිය එහි පැමිණි වාහන මගින් ගොඩබාන ලද්දේ ඊට මීටර් 100ක පමණ දුරිනි. එහිදී, එකී සියලු ගොඩනැගිලි ද්‍රව්‍ය එහි සිට නිවස වෙත රැගෙන එන ලද්දේ කුමුදුගේම ශ්‍රමයෙනි. තම සැමියා නැති වූ දා පටන් තනිව ජීවිතයට මුහුණ දෙන්නට හුරුව සිටි ඇය කුමන දුෂ්කරතා අත්වින්දද තම අපහසුතා පවුලේ සාමාජිකයකුට හෝ සමීපතමයකුට නොපවසන්නට වගබලා ගත්තාය.

අඩක් නිමකරන ලද කුමුදුගේ එම නිවස පිහිටා තිබුණේ සිය සහෝදරියගේ නිවසට තරමක් එපිටින් හුදෙකලා වූ තැනකය. මුල් අදියරට එහි ඉදිවූයේ කුස්සියක් හා කාමරයක් පමණි. නිසි පරිදි දොර ජනේල හෝ සවිකර නොතිබූ එහි යාන්තම් වැස්සට පින්නට සෙවණ දුන්නා පමණි. ඒ අවට වෙනත් කිසිදු නිවාසයක් ද නොවූ අතර පෙනෙන පෙනෙන අත දිස්වූයේ ලඳු කැලෑ සහිත භූමියකි. නිසි ආරක්ෂාවක් හෝ නොමැති එහි ඇය තම දියණිය ද සමඟ ගතකළ සෑම රාත්‍රියක්ම පසුවූයේ දෙගිඩියාවෙනි. විශේෂයෙන්ම මොරවැව මෙන් එහි ත්‍රස්තවාදී තර්ජන නොවූවද ඇයව පෙලන්නට වූයේ සොර සතුරු බිය හේතුවෙනි. ඇතැම් දිනවල රාත්‍රී කාලයේ නිවස අවටින් ඇසුණු සැක සහිත ශබ්ද හමුවේ ඕ සිය දියණිය ද සමඟ එහි වූ එකම ඇඳයටට රිංගා රැය පහන්කළ වාර පවා තිබිණ. මේ සියල්ල හමුවේ ගම්‍ය වූයේ තනිකම බිය සැකය හා දුෂ්කරතා කුමුදුගේ ජීවිතයට උපතින්ම උරුම වූ සෙයකි.

මෙලෙස සැරයන් උපාලි අතුරුදන්ව වසරක් පමණ ගතවිය. ඒ අතරතුර දිනෙක කුමුදුගේ නමට විශේෂ ලිපියක් ලැබුණේ ලියාපදිංචි තැපෑලෙනි. දෙගිඩියාවෙන් යුතුව ඕ එය විවරකර බලන්නට වූයේ තම දියණියද අසල හිඳුවාගෙනය. එහි වූයේ තම සැමියාගේ මරණ සහතිකයයි. මුලතිව් ප්‍රහාරය සිදුව වසරක පමණ කාලය තුළම තම සැමියා අතුරුදන්ව ඇති බවට සලකා කටයුතු කෙරුණු බැවින් ඔහු පිළිබඳ වූ සියුම් බලාපොරොත්තුවක් කුමුදුගේ හදවතේ කොනක තැන්පත්ව තිබුණි. නමුත්, එලෙස මරණ සහතිකයක් ලැබීම මගින් කියවුණේ ඇයගේ ස්වාමියා නිසැකවම මියගොස් ඇති බවට නිල පිළිගැනීමකි. එබැවින් ඇය කඳුළු පිරි දෙනෙතින් යුතුව එම මරණ සහතිකය අල්මාරියේ කොනක පරිස්සමට තැබුවේ හද දවාලන සුසුමක් ද පිටකර හරිමිණි.

**මෙලෙස සැරයන් උපාලි අතුරුදන්ව වසරක් පමණ ගතවිය. ඒ අතරතුර දිනෙක කුමුදුගේ නමට විශේෂ ලිපියක් ලැබුණේ ලියාපදිංචි තැපෑලෙනි. දෙගිඩියාවෙන් යුතුව ඕ එය විවරකර බලන්නට වූයේ තම දියණියද අසල හිඳුවාගෙනය. එහි වූයේ තම සැමියාගේ මරණ සහතිකයයි. මුලතිව් ප්‍රහාරය සිදුව වසරක පමණ කාලය තුළම තම සැමියා අතුරුදන්ව ඇති බවට සලකා කටයුතු කෙරුණු බැවින් ඔහු පිළිබඳ වූ සියුම් බලාපොරොත්තුවක් කුමුදුගේ හදවතේ කොනක තැන්පත්ව තිබුණි. නමුත්, එලෙස මරණ සහතිකයක් ලැබීම මගින් කියවුණේ ඇයගේ ස්වාමියා නිසැකවම මියගොස් ඇති බවට නිල පිළිගැනීමකි.**

මෙලෙස තවදුරටත් කාලය ගෙවෙද්දී බොහෝ හැල හැප්පිම් මැද වුව කුමුදුගේ දියණිය ක්‍රමක්‍රමයෙන් උස්මහත් වන්නට වූවාය. ඒ වනවිට දැඩි දරිද්‍රතාවයෙන් පෙළෙමින් සිටිය ද සැමියාගේ නාමයෙන් කෙසේ හෝ දියණිය සමාජයේ උසස් තැනකට ගෙන ඒම කුමුදුගේ ඒකායන අධිෂ්ඨානය විය. ඒ අනුව ඇය එහි පළමු පියවර ලෙස තම දියණිය රත්නපුර ඇඹිලිපිටිය ශාන්ත අන්තෝනි විද්‍යාලයේ පළමු වසරට ඇතුළත් කරන්නට කටයුතු කළාය. එහිදී, ඇය පන්තියේ කැපී පෙනෙන සිසුවියක ලෙස සැමගේ ආදරය ලබමින් සාර්ථකව අධ්‍යාපන කටයුතුවල නිරත වන්නට වූයේ මවගේ අභිලාශයන් හඳුනාගත්තාක් මෙනි.

ඒ අනුව ශිෂ්‍යත්ව විභාගය ද ඉහළින්ම සමත් වන ඇයට එහි ප්‍රතිඵලයක් ලෙස රත්නපුර පර්ගසන් උසස් බාලිකා විද්‍යාලයට ඇතුලත් වීමට වරම් ලැබෙණුයේ සිය මවගේද ආශීර්වාදයෙනි. විශේෂයෙන්ම තම දියණියගේ හැකියාවන් හොඳින් හඳුනාගෙන සිටි කුමුදු ඈ පිළිබඳව සොයා බලමින් ඇගේ අධ්‍යාපන දිවියට නිරන්තර සවියක් වන්නට අමතක නොකළේ එය තමා හමුවේ වූ අභියෝගයක් ලෙස සලකමිණි.

මෙලෙස තවදුරටත් කාලය ගතවිය. එය කුමුදුගේ දියණිය වූ කසුනිගේ ස්වර්ණමය යුගය විය. ඊට හේතුව නම් ඇය සාමාන්‍ය පෙළ විභාගය ඉහළින්ම සමත් වීමය. එහිදී ඇය ඒ සාමාර්ථ 9ක් ලබාගනිමින් අති විශිෂ්ඨ ලෙස සමත් වූයේ සිය මවගේ ද බලාපොරොත්තු ඒ අයුරින්ම සපුරාලමිනි. තවද, ඇය රත්නපුර දිස්ත්‍රික්කයේ පළමු 38 දෙනා අතරට ද එක්ව තිබීම විශේෂත්වයකි. ඒ සමඟම එම පර්ගසන් විද්‍යාලයේම උසස් පෙළ විද්‍යා විෂය තෝරාගත් කසුනි ඊට ද මුහුණ දුන්නේ යෝධ සෙවනැල්ලක්ව හඳිමින් තම මව ලබාදුන් අසීමිත ශක්තිය ද සමගිනි. එහිද ප්‍රතිඵලය වූයේ ඇය මුහුණ දුන් විද්‍යා අංශයෙන් "ඒ" සාමාර්ථයක් හා "බී" සාමාර්ථ දෙකක් ලබාගනිමින් විභාගය ඉහළින්ම සමත් වීමය. අනතුරුව ඇයට වැඩිදුර අධ්‍යාපනය සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යා අංශයට දොරගුළු විවර වූ අතර, එහිදීද ඇය එහි උපාධිය සම්පූර්ණ කරනුයේ පාඨමාලාවේ දක්ෂතමයින්ට ලබාදෙන රන් පදක්කම් ද්විත්වයෙන් එකකට හිමිකම් කීමෙනි. තවද සිය දක්ෂතා හා සුදුසුකම් මත කසුනිට එම විශ්ව විද්‍යාලයේම ඉගැන්වීම් කටයුතු සිදුකිරිමේ අවස්ථාව ද ලැබුණු අතර, ඇය වසරකට වැඩි කාලයක් එම කටයුත්තේ නියැලිණ. ඒ අතරතුර වැඩිදුර අධ්‍යාපනය සඳහා ඇය විදේශීය රටකට ශිෂ්‍යත්වයක් සඳහා අයදුම් කරන ලද අතර, ඒ අනුව ඇමරිකා එක්සත් ජනපදයෙන් ඇයට ඒ සඳහා අවස්ථාවක් ලැබිණ. නමුත්, එය වසර පහක ශිෂ්‍යත්වයක් වූ බැවින් ඇය එහි යාමට අකමැති වූවාය. ඒ සමඟම කැනඩාවේ දෑ අවුරුදු ශිෂ්‍යත්වයක් සඳහා ඇයට අවස්ථාවක් ලැබුණු අතර එය ඇගේ දිගුකාලීන සිහින සැබෑවීමකි.

සිය කැනඩා ගමන සංවිධානය වෙද්දී කසුනිට අයිති ආදරයක්ද මෝදු වී තිබුණේ නොදැනීම වාගේය. ඒ වනවිට ඇය වසර කිහිපයක පටන් පෙම්වතියක්ව සිටි බව මව කුමුදු ද දැනගෙන තිබුණේ යාන්තමිනි. අවසානයේ කැනඩාවට යාම සඳහා වූ ලියකියවිලි සූදානම් කරන අතරේ කසුනි සිය පෙම්වතා සමඟ අතිනත ගන්නේ තමාගේ ගමනට ඔහුද රුකුලක් වන බව දත් හෙයිනි. ඒ අනුව සිය මවගේ ද ආශීර්වාදය මැද එකී සියලු කටයුතු ඉතා චාම් ලෙස සිදු කෙරුණු අතර එක්තරා දිනයක ඇය තම දෑ අවුරුදු ශිෂ්‍යත්වය සඳහා සිය සැමියා ද සමඟ කැනඩාවට පිටත්වනුයේ මව සමඟ සිය ආදරය නොඅඩුව ඉතිරි කරමිනි. මෙලෙස තවදුරටත් කාලය ගෙවෙද්දී කසුනි සිය කැනඩාවේ අධ්‍යාපනය ද සාර්ථකව හදාරන්නට වූවාය. සිය ඉගෙනීමේ කටයුතු අතර ඕ එහි විශ්ව විද්‍යාලයක තාවකාලික ඉගැන්වීමේ කටයුතුද සිදුකරමින් සිය මෑණියන්ට බරක් නොදී එහි ආර්ථික ස්ථාවරත්වයක් ගොඩනඟා ගැනීමටද වගබලා ගත්තාය.

අද වනවිට කසුණිගේ කැනඩා ජීවිතය වසර දෙකක් ඉක්මවා ඇත්තේ ඇයගේ සියලු උත්සාහයන් වල සාර්ථක

ප්‍රතිඵල භුක්ති විඳිමිනි- එම විශ්ව විද්‍යාලයේ උපාධියද සාර්ථකව සම්පූර්ණ කරන ඇය එහි නව රැකියාවක නියැලෙන්නටද තරම් හිමිකම් සපුරා ඇත. තමා සමග නොසිටිය ද සිය මවගේ දුක සැප බලන්නට ද ඇය වෙනුවෙන් සිය උපරිමය ඉටුකරන්නට ද ඇය කිසිවිට පැහැර නොහැර ඇත්තේ එය ඈ වෙත පැවරුණු අනිවාර්ය යුතුකමක් හා වගකීමක් බැව් තරයේ සිතට ගනිමිනි. ඇරඹුම කෙසේ වුවද ජීවිතයේ මැද අග ඇය අත්කරගෙන ඇති සාර්ථකත්වය පිටුපස උත්සාහය අසීමිත කැපකිරීම මතම සිදුව ඇති බව ඈ දනී. එහෙත් පෙනෙන දුරක හිඳ සිය මව ඈ වෙනුවෙන් දැරූ අත්නොහළ වීර්යය ද නොපෙනෙන තැනක හිඳ සිය පියා ලැබදෙන ආශිර්වාදය ද තමා වටා නිරන්තර මහා බලයක්ව තමන් රක්ෂාකරණ බව පමණක් ඇට විශ්වාසය.

**කුමුදුගේ කතාව හමුවේ ඇය සෙසු රණවිරු බිරින්ඳෑවරුන්ට ද සමස්ත සමාජයට ද ලබාදෙන පණිවුඩය ඉතා අගනේය. වටින්නේමය. එසේම, එය ඇගේ කතාව පමණක් නොවේ. ඇය නියෝජනය කරන සමස්ත වැන්දඹු විරු බිරින්ඳෑවරුන්ගේ ද කතාවකි. තිස් වසක් පුරා මෙරට පැවති ත්‍රස්තවාදය හමුවේ අවි රැගෙන පෙරමුණේ සිදුවූ සටන සේම අවි රහිතව නොපෙනෙන තැන්වලද යුද්ධ තිබුණි. කුමුදු මුහුණදුන්නේ ද එවැනි සටනකටය.**

අසුරු සැනින් කාලය ගෙවී ගොස් ඇත. කලවාන නිවසේ හුදකලාව ගෙවන කුමුදු අදටද සිය ජීවිතය දෙස ආපසු හැරී බලනුයේ මැදහත් සිතිනි. දැන හඳුනාගත් දා සිට අකල් වියෝව දක්වා සිය සැමියා පිළිබඳ වූ මතක ද කැබිතිගොල්ලෑවේ ගෙවූ කටුක දිවියේ නීරස සැමරුම්ද නටඹුන් ලෙස අදට ද ඇයගේ මනසේ උස්පහත් වෙමින් පවතී. එහෙත්, මහාමෙරක්සේ නොසැලී ප්‍රශ්නවලට මුහුනදීම තුළින් ලද පන්නරය නිසාම ඈ තුළ සවිමත් ගැහැණියක් බිහිකොට ඇත්තේය. එනිසාම වැර වෑයමෙන් ජීවිතය දිනූ ඇය එතෙර සිටින තම දියණිය පිළිබඳ පසුවනුයේ නිහතමානී ආඩම්බරය ද තුරුලු කරගනිමිනි.

ජීවිතය හරි පුදුමාකාරය. වියෝග විස්සෝප හමුවේ සුසුම්ලමින් ලතැවෙන්නෝ සදා එතැනමය. සියලු දුක්ඛ දෝමනස්සයන් නරක කලට එළැඹි කුනාටුවක් සේ සිතා එය පහව යනතෙක් නොසෙල්වී හිඳ යලි ජීවිතය ජයගැනීමට වෙර දරන්නෝ නිසැකවම ජය ලබති. කුමුදුගේ කතාව හමුවේ ඇය සෙසු රණවිරු බිරින්ඳෑවරුන්ට ද සමස්ත සමාජයට ද ලබාදෙන පණිවුඩය ඉතා අගනේය. වටින්නේමය. එසේම, එය ඇගේ කතාව පමණක් නොවේ. ඇය නියෝජනය කරන සමස්ත වැන්දඹු විරු බිරින්ඳෑවරුන්ගේ ද කතාවකි. තිස් වසක් පුරා මෙරට පැවති ත්‍රස්තවාදය හමුවේ අවි රැගෙන පෙරමුණේ සිදුවූ සටන සේම අවි රහිතව නොපෙනෙන තැන්වලද යුද්ධ තිබුණි. කුමුදු මුහුණදුන්නේද එවැනි සටනකටය. යුද්ධය නිමවී වසර 16ක් ගෙවුණි. පශ්චාත් යුධසමය තුළ ඇතමෙකුට රණවිරුවන් ද අමතක කාලවකවානුවක ඊටත් වඩා විරු බිරින්දෑවරු අමතක වීම අරුමයක් නොවේ. එහෙත් කුමුදුගේ මෙම කථාව හමුවේ ඈ ලද අස්වැසිල්ලක් වේනම් එය මාද ලද නිහතමානී සතුටක් බැව් මෙහිලා අවසන් වශයෙන් සඳහන් කරමි.



**ලුතිනන් කර්නල්**
**ඒඑ්ඒ සුජිත් චමින්ද**



## ක්‍රිෂ්ණ මූර්ති තුමාගේ
# දැක්ම

මිනිසාගේ මනස විවිධ සිතුවිලිවලින් අවුල් වියවුල්වල පවතින්නේය. එවැනි අවුල් මනසකින් යථා තත්වය අවබෝධ කොට ගත හැක්කේ කෙසේද? තමා පිළිබඳවත් බැහැර ලොව පිළිබඳවත් යථා තත්වය දකින්නට නම් ඒ අවුල් වූ මනස ප්‍රසන්න බවට පැහැදිලි බවට පත්කොට ගත යුතු වේ.

මනස නිදහසේ ලාලිත්‍යවත්ව යන අත බලා සිටීමෙන් ආධ්‍යාත්මය පුරා පැතිර යන නිසල බවින් මනස ප්‍රසන්න වේ.

එවැනි නිසල මනසින් යථා තත්ත්වය දකින අය විසින් ඔවුනොවුන් හා පවත්වනු ලබන දියුණු සබඳතා නිසා ලෝකයේ ප්‍රශ්නත් විසඳෙන්නේය. ලෝක ප්‍රශ්න බවට පෙරලෙන්නේ පුද්ගලයින් අතර ප්‍රශ්න හෙයිනි.

පියාඹන කුරුල්ලෙකුගේ හෝ වේවා, අහසෙහි ඇතිවන නැතිවන විවිධ චලන හෝ වේවා, කඳුවැටි මත වැටෙන සෙවනැලි පෙළෙහි හෝ වේවා, සෙසු අන් කෙනෙකුගේ මුහුණෙන් හෝ වේවා පෙනෙන ශෝභාව ඔබට දැකිය හැකි නම් ඔබට මනස උද්දීපනය කරන කෘත්‍රිම දේවලින් කුමන එලක්ද?

*- අන්තර්ජාලය ඇසුරිනි*




## හැඟුම්බර ජීවිත...

දිට්වා නම අප කාටත් නුහුරු උනා
දිය බිඳු දරුණු වී ගෙන ඉහළට ඇදුනා
නොසිතූ විලස මහ ජල කඳ දරුණු උනා
ගම් බිම් යටකරන් කඳු සමතලා උනා

දැනෙනා කඳුළු කෙලෙසක විඳවන් ද අද
දූ දරු මා පියන් අසරණ වී සිටින
විශ්වයෙ රුදුරු බවමයි වැටහුණේ මට
නොමවන් මෙවැනි විපතක් මගෙ රටට යළි

නොදැකපු දෙව්වරුන් අප සැම වඳින කල
මිහිපිට දෙව්වරුන් රට තුළ සිටින කල
රණවිරු දෙව්වරුන් නිති රට රකින සඳ
නොදැනේ බියක් මා හට යළි කිසි දිනෙක

සෙ/159892
සැරයන් පියසිරි බණ්ඩාර ඩීපී
11 රෙජි ශ්‍රීලකාහ

## සෙබළ ජීවිතය...



ගෙදර අත්හැර
රටට නියම වූ වීරයා
අඳුර මැදින් ද දහදියෙන් ද
අසීරු මග පියඹා
ජීවිතය දුන්නත්
සිනහව නැතිවෙන්නේ නැහැ
සෙබළුන්ගේ ජීවිතය
ත්‍යාගය කිසිදා මාරු නොවේ

කෝප්‍රල් ශ්‍යාමලා ටී
2(සෙව්) ශ්‍රීලයුකාබ

## දිට්වා සුළි කුණාටුව...

නොසිතුව විලස මහා වරුසාවක් වැටුණා
කඳුකර පෙදෙස් කඳු වැටි පහළට ඇදුනා
යටකර නිවෙස් වෙත පස් කඳු වැටි හැලුනා
අසරණ මිනිස් ජීවිත දුකකින් පෙලුනා

දිට්වා කුණාටුව ඇවිදින් මගෙ රටට
විපතක් කරා දවමින් හදවත් යටට
අසරණ උනා මිනිසුන් අනෙ ඒ අවට
පිටව ගියේ කඳුලින් තබලා රටට

රට දැය රකින රණවිරුවන් පෙරට එති
විපතට පත්ව ඇති උදවිය සොයා යති
කරුණා ගුණය පාමින් සැම මුදා ගති
රණවිරු පුතුන් මිහිපිට දෙව්වරුම වෙති

එක්වී දකුණෙ මිනිසුන් අපෙ එකා වගේ
පිහිටක් වෙන්න සිතුවෙමි එය හරිම අගේ
එනවා ඇදී පිරිවර කඳු රටට මගේ
දළඳා සමිඳු පිහිටයි සැම දෙනට මගේ

මියගිය අයට අම නිවනම අත් වේවා
ගිලනුන් සැමට ඉක්මන් සුව හිමි වේවා
මේ වැනි විපත් මින් මතුවට නොම වේවා
මගෙ රට දැයට දෙවියනි පිහිටක් වේවා

සෙ/3706130
මා/සැරයන් මධුසංක එම්ඩී ආර්එස්පී
6 ශ්‍රීලංසිරෙ



## නන්ද මම වෙමි...

නිසල දිය මත
සසල කළ පොදක් සේ
සිතුවිලි කැළඹුණාදෝ...
හේතුඵල සම්බන්ධයට
නතු නොවී...
හරසුන් සිතුම්පොදි අතර
ගලාගිය ජීවිතය...

නයන යුග මත රැඳුණු
තුහින කඳුළු පිණි දිය
අරුත්සුන් කළාදෝ
හිතුමතේ ජීවිතය...

වේදනා මුඛයෙන්
පස්වස්තාප හද මඬල
ක්ෂණයෙන් නතරකළා
ඒ නුඹේ චෛතසිකය
ප්‍රහීනය කළාදෝ
බවුන් වඩන්නට...

මේජර් එල්ජීඑස් සංජීව
ශ්‍රීලංසිරෙ

## අනඟ වන්නම...

බඹර විතකට බමන රූ බැඳ දරණ ලා කනිසමක දැවටෙන
උදුල රූ මත අනඟ බැමි බැඳ දපන ලා මකරන්ද ඉහිරුන
සිතැඟි උගුලන අමුතු පදයට ගැහෙන සියොළඟ වසා නැළවෙන
වැනෙන වන්නම සකල තුන්දිය එකම ඇඹුලක රුවට පෙරලන

තීක්ෂණ රත්මලවින්න



## ආදර හිත...

හිතට දැනුනට කියාගන්න බැරි,
කොච්චර කීවත් පිළිගන්නෙත් නැති,
හැම වෙලේම හිතට වදදෙන,
මතකයන් එමටයි හද පාරන.
ඒත්...
ආදරේ වැඩි කමට,
දාලා යන්න බැරි කමට,
සමහර හිත් ලග අපි බාල්දු වුනා
නොසෑහෙන්ට...

සෙ/11කිව්02319
සැරයන් අබේසිංහ ආර්පීකේජීඑස්සී
11 ශ්‍රීලංජාආබමු



# සොඳ සිතුවිලි

## ලස්සනයි නුඹ...

සීගිරි ලලනාවටත් වඩා
ලස්සන නිසා නුඹ
තිබුණා සිතුවම් කරන්න
සීගිරි ගල උඩ නුඹේ රුව
අවාසනාවකට සොඳුරිය
කියන්නට කණගාටුය
කාශ්‍යප නෙමෙයි මම

කපිතාන් බුද්ධික ආරච්චිගේ



## පා ගමන් සමරමි...

හබරණ මහ කැළේ
පුලතිසියේ සුදු කන්ද
ගිරිතලේ අඩවියේ
මැදිරිගිරිය මහ වනේ
මාදුරු ඔය රක්ෂිතයේ
පුහුණු කෙරුමට සිසුන්
යුද කැළෑවක් කොට
ඇවිද ගිය හැටි මැවේ

සෙ/105718
ලා/කෝ බංඩාර ජේඒඑන්ජේ

## මා හද රැඳී පුංචි රෝස මලේ...



මිහිතලයට පැයූ රන්වන් තරුවක් සේ
මොලොව එළිය දුටුවා
අප සැනසුම් සයුරෙහි ගිල්වා නුඹ
කිරි කැටියෙකි රෝස පාටින් දිදුලන
සිඟිති මුව අයා හඬනා විට
මා හද රිද වූ සුරංගනාවිය
දිවියේ ලද මහමෙරකි...
නිදනා විට මව් රුකුලේ කිරි බී
සිඟිති මුවඟින් සිනාසුනා
දිවිය සුරඟනන් නුඹ හට රහසක් කීවා දෝ
හිස මත තබා මාගේ රන් කැටි මෙහෙවර
දිවියේ ලද ආලෝකය
අනාගත සිහිනය සැනසුම දිවිය නුඹයි මාගේ
අකුරු කරවා නුඹ යුවතියක වූ දිනේ
පුන් සඳ මෙන් ආලෝකය විහිදා
රැකගම් නුඹ මාගේ පණටත් නොදෙවනි
මා අහිංසක අප්පච්චී දෝණී නුඹගේ...

නි/70207
කපිතාන් ඒපීඑස් චන්ද්‍රසිරි (විශ්‍රාමික)

## "දිට්වා" කියාදුන් පාඩම...

තැනූ මාලිගා රැයින් වනසා
මිනිස් දිවි සැරි නිමා කරලා
නැඟුණු රට යළි බිමට දමලා
ගියා යන්නට රුදුරු "දිට්වා"

ගස් වැල් කපා වනසමින්
සතා සිව්පා මසට මරමින්
කරපු ඒ පව්වලට මිනිසුන්
දුන්නෙ දඬුවම් සොබා දෙවියන්

තවත් ඒ වින නොකර සිටිමු
දෙපිල නොබෙදී එකට ඇදෙමු
වැටුණු රට යළි ගොඩනගන්නට
එකා මෙන් අපි පටන් ගනිමු

සෙ/753797
කෝප්‍රල් කුමාරසිංහ එම්පීඒඑම්
11 ඉසේරෙ



## මරණය...

මා මිය ගිය දාට නෑයන් එකතු වෙලා
හඬ හඬ වැලපේවි මගෙ ගුණ මතක් වෙලා
පොලොවේ පස් කාවී දේහය ගෙනෙනු බලා
බොරුවට කිමද මේ තරමට වැලපීලා

බණ කියනා විටදි මගෙ ගුණ සිහි කරලා
තැවි තැවි දුක් වේවි දේහය දෙස බලලා
සත් දින ගිය පසුව දානයකුත් දීලා
නෑයන් විසිර යයි තව තව දුක කියලා

කල් ගත වෙද්දි මගෙ මතකය යයි මැකිලා
බණ දවසත් ඒවි තෙමසක් ගතවීලා
නෑයන් යලිත් එක් වෙයි දුක නෙතින් හෙලා
විමසයි ගෙවුණු විස්තර සැම හිනැහීලා

මං ගැන නොවේ විමසන්නේ ඔවුන් ගැන
දෙන්නේ දානයක් මගුලට දෙවනි වෙන
නැහැ මට දුකක් ඒ අය ගැන කිසිම දින
මා මතකයේ වත් නෑ ඇත්තයි ඔන්න

බඩ කට තුටින් පුරවාගෙන දන් වේලෙන්
දුකක් නැතුව හිනැහෙයි හැමදෙන සතුටින්
වෙන් වෙන විටදි ඇස් වල කඳුලැලි පුරවන්
සමුදෙනු නොහැකි මිස නොව මා නිසා දුකින්

සෙ/2ඕ01789 බනි 11 නාලක කුමාර කේඑම්
2(සෙව්) ශ්‍රීලයුපොදුසේබ

## ආදර හිමියණී...



සිතෙනවා ඉමෝ ඡායා රුවෙන් දුටු පළමු දින
මැවෙනවා කැමරාවට සැඟවී කතා කරපු නුඹ
ඇසෙනවා ඔබේ සිනහව නිතර මට
ආදරයෙි නිශාදි සැමදා ඔබ හට...

තරු පිරුණු රැයකට මනරම්ය පුන් සඳ
සැඳෑ මුහුදට අගනේය බැසයන රත් හිරු
කටු පිරුණු රෝස අත්තට ලස්සනය රෝස මල
තනිකඩ මේ ජීවිතය නිධානයකි නුඹ මට

ඔබේ සුවඳ දැනෙනවා මට හැම විට
ඔබේ රුව මැවෙනවා හැම විට
ඔබේ හඬ ඇසෙනා හැම තැන
ආදරයෙි පණ වගේ විවාහ වී
වසරක් ගෙවෙන අද දින

සෙ/427749
කෝප්‍රල් ඉසුර මධුසංඛ ඩබ්ලිව්කේ
12 ගැහේබ




# රහ කැලි

## සින්දුව...

හොඳ පදමට වෙරි වූ පෙරේරා සංගීත ප්‍රසංග යක් නරඹමින් අසල මිනිසෙකු ඇමතීය

"අපූතයි නේද? අරකි සින්දු කියන හැටි. හරියට බෙල්ල මිරිකනවා වගේ නේද? කවුද දන්නේ නෑ මේ පිස්සු හෝන්තුව?"



**ජයසේකර** - ඒ මගේ දුව

**පෙරේරා** - ආ... සමාවෙන්න. සින්දුව කියන විදිහෙම නෙවෙයි වැරැද්ද තියෙන්නේ. ඒ සිංදුවෙ වචනවල. කවුරු හරි පට්ටපල් මෝඩයෙක් වෙන්න ඇති ඒ සින්දුව ලියන්න ඇත්තේ. අනික ඒකෙ තනුව උනත් කිසි රහක් නෑ...

**ජයසේකර** - එහෙමද... ඒ තනුවයි, පද මාලාවයි දෙකම මගේ...

---

## නිවසේ ස්වාමියා...

**පීටර්** - "ඔබේ නිවසේ ස්වාමියා වන්නේ කෙසේද?" කියන පොත මම එදා උඹට දුන්නනෙ. ඉතිං ඒකෙන් උඹට ප්‍රයෝජනයක් ලබාගන්න බැරි උනාද?

**විලී** - නෑ බං...

**පීටර්** - ඇයි මොකෝ...?

**විලී** - අපේ ගෑණි ඒක මට කියවන්න දෙන්නෙම නෑ...



---

## සැප දුක ඇසීම...

රංජිත් මහතා තම බල්ලාවත් රැගෙන ඇවිදින්නට ගියේය. අතරමඟදී හමුවූ අසල්වාසියෙක් මෙසේ අසන්නට විය.

**අසල්වැසියා** - කොහෙද මේ යන්නෙ බූරුවෙක් එක්ක

**රංජිත්** - පිස්සු. මේ බූරුවෙක් නෙවෙයි. බල්ලෙක්.

**අසල්වැසියා** - සොරි. මං ඇහුවේ බල්ලගෙන්.


# රණවිරුවා





**අධීක්ෂණය**

බ්‍රිගේඩියර්
ඩබ්ලිව්එස් ගමගේ ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
එම්අයිඑස් චන්ද්‍රකුමාර
යූඑස්පී පීඑස්සී අයිජී



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
ඊඑච් සුජිත් චමින්ද



**සහය සංස්කාරක**

මේජර්
එච්පීජේ භවන්ති

**පරිගණක අකුරු සංයෝජනය,**
**කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 බනි II සේනාරත්න ජීසී - 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඒඑම් - 11 ඉසේරෙ



**ඔබේ නිර්මාණ, අදහස් හා යෝජනා එවිය යුතු ලිපිනය**

"රණවිරුවා"
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
අකුරේගොඩ පාර,
බත්තරමුල්ල.

**ඊමේල්**
dtemedia&psyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**
011 2993076
**යුහ දිගුව**
51445 / 51446 / 51447


**"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට**


**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය

# සෙන්පතියකු පිළිබඳ මතක...



"ඉතිහාස විරුවන් පිළිබඳ මතකය වූ කලී දිය යට ලූ රබර් බෝලයක් පරිද්දෙනි. කොතරම් යටපත් කරන්නට උත්සහ කලද එය වහා මතුව එනුයේ කිසිවෙකුට නවතාලිය නොහැකි පරිද්දෙනි. මේජර් ජෙනරාල් හමන්ගොඩ පිළිබඳ මතකයද එවැන්නකි. ත්‍රස්තවාදය බලවත් සේ උඩුදුවා තිබූ යුගයක ඊට එරෙහිව මිතුරු පිරිස බළමුළු ගන්වමින් රණබිමෙහි ඔහු පෑ විකුම් සදා අමරණීය වේ. ඔහුගේ වියෝවෙන් වසර 29ක් ගතවීද අප ඔහුව මෙලෙස අනුස්මරණය කරනුයේ වත්මන් පරපුරට නිදහසේ පය තබන්නට බිමත්, හුස්ම ගන්නට නිදහසත් උදාකරන්නට ඔහු තම දිවි කැපකල හෙයිනි"

මේජර් ජනරාල් ආනන්ද හමන්ගොඩ යූඑස්පී පීඑස්සී අයිජී යුද සෙන්පතිගේ භූමිකාව මෙරට යුද්ධ හමුදා වංශ කතාවේ සුවිශේෂි අසමසම එකක් වනුයේ ඔහුගේ මා හැඟි වීරත්වය නිසාවෙනි. දේශය වෙනුවෙන් පරමාදර්ශී නායකත්වයක් සැපයූ සෙන්පතියෙකු වූ එතුමන් තමන් ජනිත මව්බිමේ ඒකීයත්වය වෙනුවෙන් අවසන් හුස්මපොද වාතලයට එක්වන තෙක්ම කළ මෙහෙවර ප්‍රශංසනීය වේ.

1950 නොවැම්බර් මස 01 වන දින කළුතර උතුරේ උපත ලැබූ හෙතෙම කුරුණෑගල මලියදේව විද්‍යාලයෙහි කීර්තිමත් ශිෂ්‍යයෙකු විය. පසුව, 1972 දී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට එක්වූ ඔහු 1973 ජනවාරි මස 01 වන දින ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ දෙවන ලුතිනන් වරයෙකු ලෙස රාජකාරි ආරම්භ කරන්නේ රටට තරුණ ජවය අවැසිම මොහොතකය. එතැන් පටන් දශක දෙකකට අධික කාලයක් පුරා විනයගරුක නිර්භීත නිලධාරියෙකු ලෙස මාතෘභූමියට අසීමිතව ආදරය කළ හෙතෙම අනුපිළිවෙලින් උසස්වීම් ලබමින් විවිධ මට්ටම්වල නායකත්වය දරමින් කීර්තිමත් සේවාවක් ඉටුකළ නිලධාරියෙකි.

ඔහු කාලතුවක්කු හමුදාවේ 6 වන කාරක රෙජිමේන්තුවේ අණදෙන නිලධාරියා ලෙසද, යාපනය 512 වන බලසේනාවේ බලසේනාධිපති ලෙස ද අතිශය වගකීම් සහගතව රාජකාරී ඉටුකරන ලද්දේ රණබිමට නොසැලෙන නායකත්වයක් සපයමිනි. 1996 ජූලි මස 04 වන දින යාපනය, ස්ටැන්ලි පාරේදී ත්‍රස්තවාදී මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයකින් හෙතෙම මාතෘභූමිය වෙනුවෙන් ජීවිතය පූජා කරනුයේ 45 වියෙහිදීය. ඉතිහාසයක් ඉතිරි කොට දැයෙන් සමුගත් මේජර් ජෙනරාල් ආනන්ද හමන්ගොඩ යුද සෙන්පති වෙනුවෙන් වූ රණවිරුවාහී මේ සටහන ඔහුට උපහාර පිණිසමය.



ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල.